# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2018

ශ්‍රී ලංකා රේගුව

සැකසුම : ප්‍රතිපත්ති,සැලසුම් හා පර්යේෂණ අංශය

# රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

**2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. සමාලෝචිත වර්ෂය තුළ රුපියල් බිලියන 919.05 ක රාජ්‍ය බදු ආදායමක් අත් කර දීමට ශ්‍රී ලංකා රේගුවට හැකි විය. මෙය රුපියල් බිලියන .1, 712.31වන මුළු රාජ්‍ය ආදායමෙන් 53.7% කි.**

**ආනයන ප්‍රමාණයෙන් අඩුවීම, වැඩි ප්‍රමාණයක් තීරුබදු නිදහස් කිරීම් ලබාදීම, විනිමය අනුපාතයේ සිදුවූ ඉහළ පහළ යාම යනාදිය ඇතුළු වෙළඳ කටයුතු වල පසුබෑමක් සිදුවුවද ශ්‍රී ලංකා රේගුවට එවැනි ජයග්‍රහනයක් ලබාගැනීමට හැකිවිය. තීරුබදු බලාත්මක කිරීම සහ පහසුකම් සැලසීම යන විෂය ද්විත්වය තුළම, ලෝක රේගු සංවිධානය විසින් නිර්දේශ කර ඇති ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ඨ බවට සම්මත කර ඇති පරිචයන් සහ ඵලදායී පාලන මූලාරම්භයන් යොදා ගැනීමේ ප්‍රතිඵල මෙම ජයග්‍රහණය තුළින් පිළිඹිඹු වේ. රේගු ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය, අවදානම් පාදක පරීක්ෂණ හඳුන්වාදීම යන නිර්ණායකයන් මෙහි දී වැදගත් අංග විය. රජයට අයවිය යුතු ආදායම් එකතු කර ගනිමින්, මත්ද්‍රව්‍ය වැනි සීමාකරන ලද හා තහනම් කරන ලද භාණ්ඩ ආනයනය කිරීම හා අපනයනය කිරීම වළක්වාලීමේ දී මෙන්ම නීත්‍යානුකූල වෙළඳාමට පහසුකම් සලසාලමින් සමාජ ආර්ථික, සංස්කෘතික සහ සමාජයේ පාරසරික වැදගත්කමකින් යුතු දෑ ආරක්ෂා කිරීමේ කටයුතු වලදී ද ශ්‍රී ලංකා රේගුව ඵලදායි ලෙස කටයුතු කර ඇත.**

**ගරු මුදල් හා ජන මාධ්‍ය අමාත්‍ය, රාජ්‍ය මුදල් හා ජන මාධ්‍ය අමාත්‍ය, මුදල් ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ මහා භාණ්ඩාගාරයේ අනිකුත් සියළුම නිලධාරිවරුන්ට මෙන්ම සියළුම රේගු කාර්ය මණ්ඩලයට හා වෙළඳ ප්‍රජාවන්ට ද රාජකාරි ඉටුකිරීමේදී මට ලබාදුන් නොමසුරු සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාවය මෙයින් පළකරමි.**

**පී.එම්.එස්. චාර්ල්ස්**
**රේගු අධ්‍යක්ෂ ජනරාල්.**

# පටුන


**ශ්‍රී ලංකා රේගුව - හැඳින්වීම** ____ **7**

**ශ්‍රී ලංකා රේගුවේ සංවිධාන ව්‍යුහය** ____ **8**

**ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය** ____ **10**

**සමස්ත කාර්ය සාධනය** ____ **13**

ආදායම් රැස්කිරීම -2018 ____ 14

**නීති බලාත්මක කිරීමේ පර්ෂදය** ____ **21**

නිවාරණ අංශය ____ 22

සමාජ ආරක්ෂණ අංශය ____ 27

මත්ද්‍රව්‍ය පාලන අංශය ____ 27

ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය ____ 32

පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ____ 47

පාලන ඒකකය ____ 53

මධ්‍යම විමර්ශන අංශය ____ 55

නීති කටයුතු අංශය ____ 59

මධ්‍යම බුද්ධි අංශය ____ 60

**ආදායම් හා සේවා පර්ෂදය** ____ **63**

ප්‍රකාශන අංශය ____ 64

“D” ශාඛාව ____ 65

දිගු කාමරය ____ 66

රථ වාහන අංශය ____ 68

ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානය ____ 69

බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙන යාමට රේගුවෙන් ලබාදෙන අවසරපත් Carnet ____ 70

කර්මාන්ත හා සේවා අංශය ____ 74

තැපැල් තක්සේරු ශාඛාව ____ 77

භාණ්ඩ පරීක්ෂණ අංශය ____ 79

මගී සේවා (කොළඹ) අංශය ____ 81

අපනයන අංශය ____ 85

**සහාය සේවා පර්ෂදය** ____ **90**

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ____ 91

අනුගතවීමේ සහ පහසුකම් සැලසීමේ අංශය ____ 101

පශ්චාත් නිෂ්කාශන විගණන අංශය 103
ආපසු ගෙවීමේ අංශය 107
අවදානම් කළමනාකරණ ඒකකය 108
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය 113
මධ්‍යම මිල පිරික්සුම් අංශය 117
විශේෂ සේවා අංශය 121
භාණ්ඩ වර්ගීකරණ අංශය 121
රේගු පරීක්ෂණාගාර අංශය 125
මැණික් ශාඛාව 127
තාවකාලික හඳුනාගැනීමේ අංකය/ වැට්(TIN /VAT) ලියාපදිංචි ශාඛාව 130
**මානව සම්පත් පර්ෂදය 132**
මානව සම්පත් කළමනාකරණ අංශය 133
මානව සම්පත් සංවර්ධන අංශය 136
කාර්ය මණ්ඩල සේවා අංශය 140
සේවා හා සැපයීම් අංශය 142
**පළාත් පර්ෂදය 144**
මගී සේවා (කටුනායක) අංශය 145
ආදායම් හා සේවා (කටුනායක ) අංශය 150
ආදායම් සහ සේවා (ප්‍රාදේශීය) අංශය 152
**රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සෘජුව පවතින අංශ 154**
පද්ධති හා ක්‍රියාපරිපාටි අනුකූලතා විගණන අංශය 155
මූල්‍ය අංශය 157
ආදායම් අංශය 158
ගෙවීම් අංශය 159
වැටුප් සහ අතිකාල අංශය 159
අරමුදල් කළමනාකරණ අංශය 160
බදු අංශය 161
ආදායම් කාර්යසාධක බලකාය 162
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය 166
අභියාචනා අංශය 169
**ඇමුණුම් 170**

# ශ්‍රී ලංකා රේගුව - හැඳින්වීම

**දැක්ම**

ශ්‍රී ලංකාවේ සුරක්ෂිතභාවය සහ සශ්‍රීකත්වය නංවන්නා වූ රේගු පරිපාලන කටයුතු මෙහෙයවන ආසියාවේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

ජාතික හා ජාත්‍යන්තර රේගු ප්‍රමිති යථා යෝග්‍ය ලෙස පිළිගනිමින් නීත්‍යානුකූල වෙළඳාම, ප්‍රවාහනය හා කර්මාන්ත සඳහා පහසුකම් සලසාලමින්, ආදායම, සාමාජීය හා පාරිසරික සුරක්ෂිතතාවට අදාළ රේගු නීති සහ අනෙකුත් අදාළ නීතිවලට අනුකූලවීම බලාත්මක කිරීමට සහ වැඩිදියුණු කිරීමට කැපවීම.

## පරමාර්ථ

- රටේ තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීති, දේශසීමාව තුළ විධිමත්ව බලාත්මක කිරීම තහවුරු කිරීම.
- රජය වෙනුවෙන් බාධාවකින් තොරව ආදායම් උත්පාදනය, ලැබියයුතු ආදායම් එකතු කිරීම සහ එම ආදායම් කාලානුරූපව සහ විධිමත්ව ගණනය කිරීමට වගබලාගැනීම.
- රටේ දේශ සීමා ආරක්ෂා කිරීම සහ අභ්‍යන්තර ආරක්ෂාව ශක්තිමත් කිරීම පිණිස ත්‍රස්තවාදයට එරෙහි ආරක්ෂණ පියවර ගනු ලබන ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- නීත්‍යානුකූල වෙළඳාමට බාධාවක් නොවන පරිදි මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සහ අයථා ලෙස ඉපයූ මුදල් වසන් කරමින් ප්‍රවාහනය කිරීම වලක්වාලමින් ආදායම් සහ සමාජ ආරක්ෂණය සුරක්ෂිත කිරීම.
- ලෝක වෙළඳ සංවිධානය මගින් වෙළඳ කටයුතුවලට පහසුකම් සලසනුවස් ඇති කරගන්නා ලද වෙළඳ ගිවිසුම්, වෙළඳ කටයුතුවලදී විධිමත් පරිදි අර්ථ නිරූපනය කිරීම සහ අදාළ කරගැනීම සහතික කිරීම.
- දේශසීමාව තුළ ක්‍රියාත්මක කළයුතු රටේ ආදායම් හා වෙළඳ ප්‍රතිපත්ති නිර්ණය කිරීමේදී උපදේශක ආයතනයක් වශයෙන් කටයුතු කිරීම.
- රේගු සහ අනෙකුත් අදාළ නීතිවලට අනුකූලව කටයුතු කිරීම සහතික කරමින් දේශසීමාව තුළ මගීන් සංසරණය, භාණ්ඩ සහ අදාළ ප්‍රවාහන ක්‍රම සඳහා පහසුකම් සැලසීම.
- ලෝක රේගු සංවිධානය විසින් ක්‍රමානුකූලව සකස් කර හඳුන්වා දෙන ලද මෙවලම් සහ උපකරණ මෙන්ම ක්‍රියාමාර්ග සහ අභිලාෂයන් භාවිතා කරමින් දේශ සීමාවලදී රේගු මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම.
- මගීන් සංසරණය, භාණ්ඩ හා අදාළ ප්‍රවාහන ක්‍රම ; තොරතුරු සහ අනෙකුත් කටයුතුවලට අදාළ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම.
- තොරතුරු ප්‍රචලිත කිරීම සහ රජයට මෙන්ම සාමාන්‍ය ජනතාවට අවශ්‍ය වෙළඳ සංඛ්‍යාලේඛන තොරතුරු ලබාදීම
- රජයේ සියලු ප්‍රයත්නවලදී "ප්‍රගතියේ සහකරුවකු" වීම ; විශේෂඥ දැනුම සහ වෘත්තිමය සේවා ලබාදීමේදී සුහදශීලි සේවාදායකයකු වීමට කටයුතු කිරීම.
- විනිවිදභාවය තහවුරු කරමින් විගණන ක්‍රමවේදයන් පදනම් කරගත් වඩා ඵලදායි පරිපාලනයක් තුළින් රේගු සේවාවේ ප්‍රගමනය උදෙසා කැපවීමෙන් කටයුතු කිරීම.

ප්‍රධාන කාර්යයන්

- තීරුබදු, වෙළඳ සහ සමාජ ආරක්ෂණ නීතිවලට අදාල රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- ආනයනය හා අපනයන රේගු බදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- අනෙකුත් පනත් සහ රාජ්‍ය ආයතන වෙනුවෙන් තීරුබදු / බදු සහ අනෙකුත් අයබදු තක්සේරු කිරීම සහ එකතු කිරීම.
- තීරුබදු (බදු) ඉවත් කිරීම්, නිදහස් කිරීම්, බදු සහන (ලබාදීම)ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ අනෙකුත් අයබදු සුරක්ෂිත කිරීම සහ ඒවා ගණනය කිරීම.
- රේගු බදු ආපසු ගෙවීම්, බදු සහන සහ වට්ටම් ලබාදීම.
- හොර බඩු ජාවාරම, වාණිජ වංචා, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හසුකරගැනීම හා නිවාරණය.
- තහනම් කරන ලද සහ සීමා කරනලද භාණ්ඩවලට අදාළ නීති බලාත්මක කිරීම.
- රේගු නීති සහ අනෙකුත් අදාල නීති යටතේ සිදුකරනු ලබන වැරදි විමර්ශනය කිරීම හා පරීක්ෂණ පැවැත්වීම.
- වැරදිකරුවන්ගෙන් දඩ අයකරගැනීම / භාණ්ඩ රාජසන්තක කිරීම.
- රාජසන්තක කරන ලද භාණ්ඩ අපහරණය කිරීම.
- ආනයන අපනයන භාණ්ඩ නිෂ්කාශනය කිරීම.
- මගීන් සහ මගී ගමන් මලු නිෂ්කාශනය කිරීම.
- භාණ්ඩ සහ මගීන් නිෂ්කාශන ක්‍රියාපටිපාටි පරිගණකගත කිරීම.
- දේශීය කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.
- අපනයන සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන් කළමනාකරණය කිරීම.
- භාණ්ඩ ගුදම්ගත කිරීම කළමනාකරණය කිරීම (බැඳුම්කර සැලසුම්).
- අපනයන පාදක කර්මාන්ත සැලසුම් අධීක්ෂණය කිරීම.
- ග්‍රන්ථ සම්පාදනය සහ වෙළඳ සංඛ්‍යාලේඛන නිකුත් කිරීම.
- තොරතුරු / වර්ගීකරණ කිරීමේ රීති යනාදිය සැපයීම.
- වෙළඳ මණ්ඩල-නිෂ්කාශන නියෝජිතවරුන් සමඟ නිරතුරුව කටයුතු කිරීම
- පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- නාමකරණය, වර්ගීකරණය, තක්සේරු කිරීම, ශිල්පීය ක්‍රම බලාත්මක කිරීමට අදාල කාරණා පිළිබඳ ලෝක රේගු සංවිධානය සමඟ අඛණ්ඩව තොරතුරු හුවමාරු කරගැනීම.
- තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රේඛිය ආයතන, රජයේ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම : මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, දේශීය ආදායම්

# ශ්‍රී ලංකා රේගුවේ සංවිධාන ව්‍යුහය



# ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය

**පී.එස්.එම්.චාල්ස් මහත්මිය**
රේගු අධ්‍යක්ෂ ජනරාල්

**එච්.පී.ජයනන්ද මහතා**

අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)

**එස්.මහේෂන් මහතා**

අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආයත

**කේ.එච්.යූ.ජේ. කීර්ති මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)

**එල්.ගජදීර මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)

**පී.එස්.සේනාරත්න මහතා**

අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශික )

**එම්.ඒ.කේ.පී. විජේවන්ත මහතා**
ප්‍රධාන මූල්‍ය නිලධාරි

**ඩී.ජී.සේනානායක මහතා**

**(අනුකූලවීම සහ පහසුකම් සැලසීම)**

**ඩබ්.කේ.රන්දෙණිය මහතා**
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)

**ආර්.ඒ.ජේ.බුද්ධදාස මහතා**

රේගු අධ්‍යක්ෂ (නිවාරණ)

**කේ.එච්.ධර්මකීර්ති මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි)

**එස්. ආනන්තීස්වරන් මහතා**

**රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)**

**ආර්.එම්.එස්.ඩී.රණවන මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම්)

**ආර්.කේ. ජයලත්**

රේගු අධ්‍යක්ෂ (සැපයුම්)

**ඩී.සී. ජයදේව මහත්මිය**
රේගු අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සේවා)

**අයි.ඒ.එම්. අත්තනායක මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සුපරීක්ෂණ)

**ටී. රවීන්ද්‍රරාජා මහතා**

රේගු අධ්‍යක්ෂ (මගී සේවා - කොළඹ)

**ඩබ්.ජී. චන්ද්‍රිකා මිය**
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

**ජී. සරත් කුමාර මහතා**
ප්‍රධාන ගණකාධිකාරී

**ජේ.එච්.එල්.කේ. ජයතිලක**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (මධ්‍යම විමර්ශණ)

**එච්.කේ.එම්.එස්. ජයරත්න**
අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ)

**එම්.ඒ. කරුණාරත්න**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (මගී සේවා - කටුනායක)

**ඕ.එම්. ජබීර් මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - කටුනායක)

**එම්.එච්.කේ. පියරත්න**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)

**එස්.කේ. ද සිල්වා මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (ප්‍රකාශන)

**පී.ජී. සුමනපාල මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)

**එස්.ඩී.සුනිල් මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (අපනයන)

**සී. පෙරිපනායගම් මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ)

**එච්.ආර්.එන්.සී. හේරත් මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (නීති කටයුතු)

**එච්.ඒ.වී.පී. හපන්ගම මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)

**ඊ.එම්.එන්. එදිරිසිංහ මිය**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)

**යූ.ලොකුසූරිය මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (මගී සේවා-ප්‍රාදේශීය)

**එච්.ආර්.වී.පී. විජේවර්ධන මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු)

**ඩබ්.ඒ.යූ. අබේවර්ධන මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (අභියාචනා)

**ඩබ්.ඒ.කේ. අබේවර්ධන මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - ප්‍රාදේශීය)

**ආර්.ඞී.එන්. ප්‍රේමවංශ මහතා**

නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාලේඛන)

**ඒ.පී.එන්.ඒ. අබේරත්න මහතා**

ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ(කර්මාන්ත හා සේවා - ප්‍රාදේශීය)

# සමස්ත කාර්ය සාධනය

# ආදායම් රැස්කිරීම -2018

ජාතික බදු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් *




*තාවකාලික දත්ත

## ආනයන ආදායම් එකතු කිරීම - 2018 : බදු සංයුතිය

ශ්‍රී ලංකා රේගුවේ ආදායම් එකතුව – 2018

| කාණ්ඩය | ආදායම - ශ්‍රී ලං රු. මිලියන | මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (% ) |
|---|---|---|
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 340,156 | 37.01% |
| | | |
| නිෂ්පාදන ( විශේෂ විධිවිධාන)බද්ද | 370,351 | 40.30% |
| | | |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 199,328 | 21.69% |
| | | |
| බදු නොවන ආදායම් | 6,287 | 0.68% |
| | | |
| ආදායම් හා ලාභ මත බදු | 2,923 | 0.32% |
| | | |



| ආදායම් සංකේතය | විස්තරය | 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාර්ය සාධනය (රු.මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව | තථ්‍ය | කාර්ය සාධනය % | අපගමනය | අපගමනය% |
| ජාත්‍යන්තර වෙළඳාම මත බදු | | | | | | |
| **1001.01.00** | ආනයන බද්ද | 175,000 | 96,991 | 55% | (78,009) | -45% |
| **1001.02.00** | අපනයන බද්ද | 40 | 40 | 99% | (0) | -1% |
| **1001.04.00** | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) | 115,000 | 113,950 | 99% | (1,050) | -1% |
| **1001.05.01** | ආනයන සෙස් බද්ද | 47,000 | 50,777 | 108% | 3,777 | 8% |
| **1001.05.02** | අපනයන සෙස් බද්ද | 2,500 | 2,592 | 104% | 92 | 4% |
| **1001.08.00** | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 80,000 | 75,807 | 95% | (4,193) | -5% |
| | | | | | | |
| නිෂ්පාදන ( විශේෂ විධිවිධාන)බද්ද | | | | | | |
| **1002.05.01** | නිෂ්පාදන බද්ද -සිගරට් | 90,000 | 92,198 | 102% | 2,198 | 2% |
| **1002.05.02** | නිෂ්පාදන බද්ද -මත්පැන් | - | 53 | - | 53 | - |
| **1002.05.03** | නිෂ්පාදන බද්ද -ඛනිජතෙල් | 160,000 | 132,637 | 83% | (27,363) | -17% |
| **1002.05.04** | නිෂ්පාදන බද්ද -මෝටර් වාහන | 230,000 | 204,081 | 89% | (25,919) | -11% |
| **1002.05.99** | අනෙකුත් නිෂ්පාදන බදු | 20,000 | 15,401 | 77% | (4,599) | -23% |
| | | | | | | |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | | | | | | |
| **1002.01.04** | එකතු කළ අගය මත බද්ද (VAT) | 210,000 | 179,163 | 85% | (30,837) | -15% |
| **1002.12.03** | ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT) | 25,000 | 20,165 | 81% | (4,835) | -19% |
| **1002.10.00** | සමාජ වගකීම් බද්ද (SRL) | - | - | - | - | - |
| | | | | | | |
| ආදායම් හා ලාභ මත බදු | | | | | | |
| **1004.04.02** | ආර්ථික සේවා ගාස්තු (ESC) | 1,200 | 2,923 | 244% | 1,723 | 144% |
| | | | | | | |
| බදු නොවන ආදායම් | | | | | | |
| **2003.02.17** | ඇගළුම් දේශීයව අලෙවි කිරීමේ ගාස්තු | 150 | 306 | 204% | 156 | 104% |
| **2003.02.99** | විවිධ | 1,600 | 5,464 | 342% | 3,864 | 242% |
| **2003.03.01** | දඩ සහ රාජසන්තක කිරීම් | 315 | 349 | 111% | 34 | 11% |
| **2003.99.00** | වෙනත් ලැබීම් | 70 | 167 | 239% | 97 | 139% |
| මුළු එකතුව | | **1,067,875** | **919,045** | **86%** | **(148,830)** | **-14%** |

ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග පනහ (HS කේත අනුව)

| | HS කේතය | විස්තරය | 2018 | |
|---|---|---|---|---|
| | | | ප්‍රමාණය | ආදායම |
| 1 | 27101221, 27101220, 27101222 | පෙට්‍රල් | 1,133,424,918 | 80,699,045,792 |
| 2 | 87032169 | ස්ටේෂන් වැගන් සහ රෙසිං කාර් ඇතුළුව අනෙකුත් මෝටර් රථ < අවු1 | 32,896 | 51,784,212,320 |
| 3 | 87112010 | යතුරුපැදි, >55 සිලින්ඩර් ධාරිතාවය සහ =< 200 සිලින්ඩර් ධාරිතාවය, අවුරුදු තුනකට වඩා නොපැරණි පරස්පර අභ්‍යන්තර දහනය | 347,307 | 40,491,201,770 |
| 4 | 27101942, 27101940, 27101941 | ඩීසල් ඇතුළු ගෑස් තෙල් | 1,453,056,958 | 39,125,225,545 |
| 5 | 87034028 | වෙනත්, වසර තුනකට වඩා නොපැරණි | 32,199 | 26,640,816,714 |
| 6 | 15119030 | පිරිපහදු නොකල පාම් ඔලෙයින් | 173,748,709 | 22,128,346,376 |
| 7 | 87032250 | ස්ටේෂන් වැගන් සහ රෙසිං කාර් ඇතුළුව මෝටර් රථ අවුරුදු තුනකට වඩා නොපැරණි | 14,033 | 16,547,122,178 |
| 8 | 22071000 | රසායන ද්‍රව්‍ය නොයෙදූ එතිල් මධ්‍යසාර, මධ්‍යසාර සාන්ද්‍රණය>=80% | 13,676,787 | 13,082,055,758 |
| 9 | 04022100 | සීනි හෝ වෙනත් රසකාරක අඩංගු නොකළ කිරි සහ යොදය , අඩංගු මේද ප්‍රමාණය > 1.5 | 85,914,494 | 13,029,216,886 |
| 10 | 17019910 | සුදු ස්ඵටික උක් සීනි | 350,792,191 | 11,626,430,642 |
| 11 | 69072190 | වෙනත්, | 13,745,156 | 9,083,020,410 |
| 12 | 87032154 | වෙනත් අවුරුදු 1කට අඩු ත්‍රීරෝද රථ | 20,279 | 8,494,829,612 |
| 13 | 10019910 | තිරුඟු පිටි | 1,098,708,050 | 8,310,619,235 |
| 14 | 87043193 | වෙනත්, වසර 4කට වඩා නොපැරණි | 6,230 | 8,305,320,465 |
| 15 | 25232930 | කිලෝග්‍රෑම් 50 කට වැඩි ඇසුරුමකින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 2,193,082,246 | 7,552,076,409 |
| 16 | 72071110 | ක්ෂේත්‍රඵල මුහුණතකින් යුතු යකඩ කඳන් (Billets) | 504,734,865 | 6,309,863,164 |
| 17 | 17019920 | සුදු ස්ඵටිකගත බීට් සීනි | 190,200,385 | 6,108,554,384 |
| 18 | 27011200 | ගල්කිලමය ගල් අඟුරු, සම්පිණ්ඩනය නොකළ | 2,058,408,788 | 6,069,578,239 |
| 19 | 07031020 | ලොකු ළූණු | 246,731,359 | 5,467,748,024 |
| 20 | 87034035 | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළු මෝටර් කාර්, වසර 3කට වඩා නොපැරණි. | 4,293 | 5,414,679,090 |
| 21 | 87036058 | වෙනත් , වසර 3කට වඩා නොපැරණි | 660 | 5,196,311,351 |
| 22 | 25231000 | සිමෙන්ති මිශ්‍රණ ද්‍රව්‍ය | 2,302,661,666 | 5,022,887,354 |
| 23 | 25232920 | කිලෝග්‍රෑම් 50 ඇසුරුමකින් සහ ඊට අඩු ප්‍රමාණයකින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 1,095,424,317 | 4,861,001,769 |
| 24 | 85176290 | ශබ්දය යනාදිය ග්‍රහණය, හැරවීම සහ සම්ප්‍රේෂණය හෝ ප්‍රතිනිර්මාණය සඳහා වන යන්ත්‍ර | 219,283 | 4,843,802,005 |
| 25 | 23040000 | සෝයා බෝංචි වලින් ගන්නා තෙල් - මුරුසහ අනෙකුත් ඝණ අවශේෂ කොටස් | 213,730,589 | 4,388,118,656 |
| 26 | 27101980 | ස්නේහක තෙල් | 22,083,767 | 4,211,447,589 |
| 27 | 07019000 | අර්තාපල් අල, අළුත් සහ ශීතකළ හැර, අර්තාපල් බීජ.. | 159,304,034 | 4,169,386,431 |
| 28 | 87042261 | වසර 5කට වඩා නොපැරණි | 3,892 | 3,934,241,800 |

| | | | | |
|---|---|---|---|---|
| **29** | 27090010 | පෙට්‍රෝලියම් තෙල් | 1,578,546,629 | 3,870,726,850 |
| **30** | 15119090 | පාම් තෙල්, රසායනිකව නවීකරණය නොකළ (ශුද්ධ නොකළ තෙල් හා ඇසුරුම්ගත පාම් ඔලේන් =< ලීටර 210 හැර) | 27,835,127 | 3,733,478,432 |
| **31** | 39172100 | නැමිය නොහැකි පොලිඑතිලීන් නල, පයිප්ප සහ බට | 13,631,840 | 3,491,943,606 |
| **32** | 87042191 | වෙනත්, වසර 3.5කට වඩා නොපැරණි | 1,233 | 3,362,200,462 |
| **33** | 40111000 | ස්ටේෂන් වැගන් සහ ධාවන තරඟ සඳහා විශේෂ වූ මෝටර්රථ ඇතුළුව) මෝටර් කාර් සඳහා භාවිතා කරන | 654,818 | 3,219,521,925 |
| **34** | 39011000 | ප්‍රාථමික ස්වරූපය දරන විශේෂ ගුරුත්වය <0.94 වූ පොලිඑතිලීන් | 73,035,924 | 3,186,348,361 |
| **35** | 27111910 | ද්‍රවීකරණය කරන ලද පෙට්‍රෝලියම් වායු | 410,879,319 | 2,999,171,325 |
| **36** | 39041000 | ප්‍රථමික ස්වරූප දරණ කිසියම් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර නොවූ පොලිවිනිල් ක්ලෝරයිඩ් | 55,000,668 | 2,900,294,195 |
| **37** | 73030000 | වාත්තු කළ එහෙත් වානේ වලින් නිමකළ නළ පයිප්ප සහ කුහර සහිත නොනිමි හැඩයන් | 21,943,618 | 2,893,950,220 |
| **38** | 87042193 | වෙනත් වසර 4කට වඩා නොපැරණි | 635 | 2,870,851,550 |
| **39** | 87042163 | කි.ග්‍රෑ.800 ක හෝ ඊට වැඩි භාණ්ඩ ප්‍රවාහනය කරන, වසර 04 කට වඩා නොපැරණි | 3,882 | 2,736,411,487 |
| **40** | 14049010 | බීඩි කොළ | 770,133 | 2,707,487,653 |
| **41** | 27101970 | ස්නේහක නිපදවීමට ගන්නා ලිහිසි තෙල් (Base-oils) | 39,351,452 | 2,639,179,658 |
| **42** | 39021000 | ප්‍රාථමික තත්ත්වයේ ඇති පොලිප්‍රොපිලීන් | 44,578,340 | 2,603,159,414 |
| **43** | 48010000 | රෝල් සහ ෂීට් වශයෙන් ඇති පත්‍ර කඩදාසි | 63,507,137 | 2,475,027,757 |
| **44** | 72259200 | තුත්තනාගම් ආලෝප කළා වූ හෝ ආවරණය කළා වූ (විද්‍යුත් ආලෝපනයෙන්) පැතලි/රෝල් වශයෙන් ඇති වානේ,>=මි.මි.600 | 80,130,907 | 2,462,123,778 |
| **45** | 72107000 | පින්තාරු කලාවූ වාර්නිෂ් හෝ ප්ලාස්ටික් ආලේපිත පළල >=මිලි මීටර් 600 , රෝල් වශයෙන් ඇති යකඩ / වානේ | 75,778,855 | 2,395,754,001 |
| **46** | 15179000 | වෙනත් | 10,796,099 | 2,243,594,335 |
| **47** | 40112019 | වෙනත් | 176,608 | 2,124,647,325 |
| **48** | 87032359 | මෝටර් රථ/ස්ටේෂන් වැගන්/රේසිං කාර්, සිලින්ඩර් ධාරිතාවය,=< සිලින්ඩර් ධාරිතාවය 2000Cc, අනෙකුත්, =< වර්ෂ 1 | 2,318 | 2,105,151,976 |
| **49** | 85171220 | අනෙකුත් සෙලියුලර් ජංගම දුරකථන | 4,932,074 | 2,069,733,391 |
| **50** | 85176210 | සම්ප්‍රේෂණ උපකරණ, ග්‍රාහක උපකරණ සමඟ හෝ නොමැතිව | 967,145 | 2,026,046,199 |

**ආදායම් සංසන්දනය - 2017 සහ 2018 (රුමිලියන .)**

| ආදායම් කේතය | විස්තරය | 2018 | 2017 | විචලනය | % |
|---|---|---|---|---|---|
| | | | | | |
| 1001.01.00 | ආනයන බද්ද | 96,991 | 136,501 | (39,511) | -28.95 |
| 1001.02.00 | අපනයන බද්ද | 40 | 30 | 9 | 31.38 |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) | 113,950 | 102,360 | 11,590 | 11.32 |
| 1001.05.01 | සෙස් බද්ද ආනයන | 50,777 | 56,574 | (5,797) | -10.25 |
| 1001.05.02 | සෙස් බද්ද අපනයන | 2,592 | 2,980 | (388) | -13.03 |
| 1001.07.00 | ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ධ | - | - | - | - |
| 1001.08.00 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 75,807 | 71,402 | 4,404 | 6.17 |
| මුළු රේගු බදු ආදායම | | **340,156** | **369,848** | **(29,693)** | **-8.03** |
| | | | | | |
| 1002.05.01 | නිෂ්පාදන බද්ද -සිගරට් | 92,198 | 85,956 | 6,242 | 7.26 |
| 1002.05.02 | නිෂ්පාදන බද්ද - මත්පැන් | 53 | 470 | (416) | -88.66 |
| 1002.05.03 | නිෂ්පාදන බද්ද - ඛනිජතෙල් | 66,318 | 73,983 | (7,665) | -10.36 |
| | නිෂ්පාදන බද්ද - ඛනිජතෙල් - ආනයන | 54,426 | 66,943 | (12,517) | -18.70 |
| | නිෂ්පාදන බද්ද - ඛනිජතෙල් - දේශීය | 11,893 | 7,040 | 4,853 | 68.93 |
| 1002.05.04 | නිෂ්පාදන බද්ද -මෝටර් වාහන | 204,081 | 189,740 | 14,341 | 7.56 |
| 1002.05.99 | නිෂ්පාදන බදු- අනෙකුත් | 7,701 | 6,091 | 1,609 | 26.42 |
| | නිෂ්පාදන බදු- අනෙකුත්- ආනයන | 1,636 | - | 1,636 | - |
| | නිෂ්පාදන බදු- අනෙකුත් - දේශීය | 6,065 | 6,091 | (26) | -0.43 |
| මුළු රේගු බදු ආදායම | | **370,351** | **356,240** | **14,111** | **3.96** |
| | | | | | |
| 1002.01.04 | එකතු කළ අගය මත බද්ද (VAT) | 179,163 | 168,393 | 10,770 | 6.40 |
| 1002.10.00 | සමාජ වගකීම් බද්ද (SRL) | - | 2 | (2) | -100.00 |
| 1002.12.03 | ජාතිය ගොඩ නැගීමේ බද්ද (NBT) | 20,165 | 19,320 | 845 | 4.37 |
| 1004.04.02 | ආර්ථික සේවා ගාස්තු (ESC) | 2,923 | 2,160 | 764 | 35.36 |
| | **මුළු බදු ආදායම** | **202,252** | **189,875** | **12,377** | **6.52** |
| | | | | | |
| 2003.02.17 | ඇගළුම් දේශීයව අලෙවි කිරීමේ ගාස්තු | 306 | 218 | 88 | 40.32 |
| 2003.03.01 | දඩ සහ රාජසන්තක කිරීම් | 5,464 | 1,964 | 3,500 | 178.21 |
| 2003.02.99 | විවිධ | 349 | 326 | 24 | 7.33 |
| 2003.99.00 | වෙනත් ලැබීම් | 167 | 126 | 41 | 32.07 |
| මුළු වෙනත් බදු ආදායම | | **6,287** | **2,634** | **3,653** | **138.66** |
| | | | | | |
| | **මුළු ආදායම** | ***919,045*** | ***918,597*** | ***448*** | ***0.05*** |

**මෝටර් වාහන ආනයන බදු ආදායම් එකතුකිරීම් සංසන්දනය - 2016 - 2018**

රුපියල් මිලියන

| මාසය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ජනවාරි | 16,063 | 16,605 | 15,793 |
| පෙබරවාරි | 13,868 | 14,097 | 16,171 |
| මාර්තු | 16,017 | 19,961 | 19,653 |
| අප්‍රේල් | 12,911 | 14,549 | 20,247 |
| මැයි | 13,548 | 16,588 | 18,134 |
| ජුනි | 13,713 | 14,902 | 24,250 |
| ජූලි | 14,847 | 14,470 | 15,786 |
| අගෝස්තු | 19,399 | 18,600 | 14,749 |
| සැප්තැම්බර් | 14,698 | 13,411 | 12,883 |
| ඔක්තෝබර් | 16,337 | 13,511 | 16,946 |
| නොවැම්බර් | 16,612 | 14,578 | 13,081 |
| දෙසැම්බර් | 15,711 | 18,441 | 11,076 |
| මුළු එකතුව | **183,723** | **189,713** | **198,770** |



# නීති බලාත්මක කිරීමේ පර්ෂදය

# නිවාරණ අංශය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා රේගුවේ සියලුම අංශවල විශේෂයෙන් වරායන්, තොටුපල, ජලමාර්ග හා මුහුදු කලාප, අන්තර්ජාතික ගුවන් තොටුපල, නිදහස් වෙළඳ කලාප, අපනයන ප්‍රවර්ධන කලාප, භාණ්ඩ පරීක්ෂණ හා අංගන, අභ්‍යන්තර *නිෂ්කාශන* ඒකකවල නිරීක්ෂණ කටයුතු සිදුකරන්නා වූ ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කරන ප්‍රධාන අංශය වන්නේ නිවාරණ අංශයයි.
නිවාරණ අංශය අංශ කිහිපයකින් එනම්, පරිපාලනය,“ පී" අංශය, මෙහෙයුම්, විමර්ශන, සමුද්‍ර, ප්‍රධාන වරාය විමර්ශන, අලෙවි, මධ්‍යම අපහරණ ඒකකය සහ උපාය මාර්ගිකව පිහිටා ඇති වෙරළ ආසන්න නගරවල රට වටා ස්ථාපිත කර ඇති උපනිවාරණ කාර්යාල කීපයකින් සමන්විතවේ.

**ප්‍රධාන කාර්යයන්.**

1) නීති විරෝධී ලෙස රටට භාණ්ඩ ගෙන ඒම, මත්ද්‍රව්‍ය වැරදි හා වාණිජ වංචා නිවාරණය කිරීම
2) රේගු වැරදි සම්බන්ධ තොරතුරු ලබා ගැනීම, ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගැනීම.
3) රේගු වැරදි හසුකර ගැනීම, සැකකටයුතු භාණ්ඩ අල්ලා ගැනීම, රේගු විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම, නඩු කටයුතු මෙහෙය වීම.
4) රජයට ලැබීමට නියමිත ආදායම් ලැබෙන බවට සහතික වීම.
5) රටේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික වශයෙන් වැදගත්කමක් දක්වන දෑ සුරක්ෂිත කිරීම හා එම ක්ෂේත්‍රයේ නීති හා රෙගුලාසි බලාත්මක කිරිම.
6) කොළඹ වරාය ඇතුළු අනෙකුත් වරායන්, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ හා මත්තල මහින්ද රාජපක්ෂ අන්තර් ජාතික ගුවන්තොටුපළ ආවේක්ෂණ කටයුතු.
7) මුහුදු යාත්‍රා සංචලනය පාලනය හා දේශසීමා මෙහෙයුම් කටයුතු.
8) ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ විධිමත් ලෙස බැහැර කිරීම.

## 1. නීති විරෝධී ලෙස රටට ගෙන එන භාණ්ඩ, වාණිජ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම;

කොටුව ප්‍රධාන නිවාරණ කාර්යාලය පිහිටි ස්ථානය වෙනස් වූ අතර ප්‍රධාන ශාඛා 3ක් කොළඹ වරායෙන් ඇතුළත හා පිටත ස්ථාන වෙත මාරු කරන ලදී. වර්තමානයේ පාලන ශාඛාව සහ රේගු අධ්‍යක්ෂ(නිවාරණ) ගේ කාර්යාලය රේගු ප්‍රධාන මූලස්ථානයේ පිහිටා තිබේ. ටයිම්ස් ගොඩනැගිල්ලේ පිහිටා තිබූ මධ්‍යම බැහැර කිරීමේ ඒකකයද රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළට ගෙන ගොස් ඇත. මීට අමතරව රේගු උප නිවාරණ කාර්යාල ප්‍රධාන මුහුදුබඩ නගරවල පිහිටා ඇත. ඒවා නම්, ත්‍රිකුණාමලය, ගාල්ල, කොග්ගල, මීගමුව හා සින්නපාඩු වේ.

රට තුළට හා ඉන් පිටත සිදුවන නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය, වෙළඳ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම සඳහා මෙම කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන් ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව පියවර ගෙන ඇත. මීට අමතරව, නිදහස් වෙළඳ කලාප තුළ පිහිටි නිවාරණ කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිලධාරීන් විසින් සිදුකරනු ලැබූ මෙහෙයුම් මගින් රේගු බදු අයවිය යුතු භාණ්ඩ මෙම කලාපවලින් බැහැරව යෑම වැළැක්වීමට කටයුතු කර ඇත.

රටේ සාමය ස්ථාපිත කිරීමෙන් පසු යාපනයේ සහ මන්නාරමේ රේගු නිවාරණ උප කාර්යාල නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. එසේ වුවත්, මුහුදේ යාත්‍රා කිරීමට සුදුසු මුර යාත්‍රා හා පුහුණු නිලධාරීන්ගේ අඩුපාඩු නිසා සමුද්‍ර නීති බලාත්මක කිරීම නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. කෙසේ හෝ මේ පිළිබඳව සලකා බැලීමට කමිටුවක් පත් කර ඇති අතර අදාල වාර්තාව මේ වනවිටත් ඉදිරිපත් කර ඇත.

හම්බන්තොට වරායේ හා මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ රේගු නිවාරණ කටයුතු ද මේ වන විට ක්‍රියාත්මකව පවතී.

## 2. අත්අඩංගුවට ගැනීම්, තහනම් කිරීම්, විමර්ශනය හා නඩු මෙහෙයුම්.

රේගු නිවාරණ අංශය විසින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් මූලාශ්‍ර දෙකෙන් විවිධ රේගු වැරදි පිළිබඳ ( හොරබඩු ජාවාරම්, වෙළඳ වංචා, මත්ද්‍රව්‍ය වැරදි) තොරතුරු ලබාගනී:

(අ) නිවාරණ අංශයට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන්ගේ පුද්ගලික ඔත්තුකරුවන් මඟින්.
(ආ) මහජනතාවගෙන් ලබා ගන්නා ඔත්තු මඟින්.

මීට අමතරව, නැව් බඩු ලේඛන හා ආනයන නිෂ්කාශන ලේඛන උපයෝගී කර ගෙන නිවාරණ නිලධාරීන් විසින් රේගු වංචා රැසක් අනාවරණය කර ගැනීමට සමත්ව ඇත. එසැනින් පරිගණක ගත කළ තොරතුරු ඇසුරෙන් වංචා සහගත ආනයනකරුවන් හසු කරගැනීමේ ප්‍රවණතාව නැව් බඩු ලේඛන හා ආනයන සටහන් කර ඇසුරෙන් කරන වැටලීම්වලට වඩා ඉහළ මට්ටමක පවතී.

සොයාගත් තොරතුරු ආශ්‍රයෙන් කළ වැටලීම් මගින් හොරබඩු ලෙස හෝ රේගුවට ප්‍රකාශ නොකර ආනයනය කළ රේගු තීරු ගාස්තු නොගෙවූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට, රේගු නිවාරණ අංශය සමත් විය. අදාළ විමර්ශන කටයුතු හා රේගු නීති සම්බන්ධ කටයුතු නිවාරණ නිලධාරීන් විසින්ම සිදුකරන ලදී.

රේගු නීති බලාත්මක කිරීමේ අංශයන්හි අඩුපාඩුවක්ව පවතින මානව සම්පත්වල කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවන පරිදි විධිමත් අවදානම් කළමනාකරණ වැඩසටහනක් දියුණු කිරීම සඳහා තාක්ෂණ සහාය ලබාගැනීමට ඉල්ලීම් ක්‍රියාත්මක කළ යුතුව ඇත. තවද නීති බලාත්මක කිරීමට අදාල කාර්යයන් හා රාජකාරි කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නිවාරණ නිලධාරින් සඳහා ධාරිතාව වර්ධනය කිරීමේ වැඩසටහන පැවැත්විය යුතුව ඇත.

## 3. නියමිත පරිදි රාජ්‍ය ආදායම එකතු කරන බවට වගබලා ගැනීම.

ආනයන හා අපනයන මගින් ලැබෙන රාජ්‍ය ආදායම එකතු කිරීම රේගුවේ ප්‍රධාන අරමුණුවලින් එකකි. රේගු දෙපාර්තමේන්තුව මගින් අව්‍යාජ වෙළඳුන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා හඳුන්වා දෙනු ලැබූ විශාල වශයෙන් ප්‍රතිඵල ගෙන දෙන්නා වූ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය ආදායම වංචා කිරීමට නැඹුරුවක් ඇති අයට රේගු දැලෙන් රිංගා යාමට සුළු ඉඩක් ලැබී ඇත. බහුතරයක් වෙළඳුන් ස්වෙච්ඡාවෙන්ම නීතියට අනුකූලව කටයුතු කරන අතර, සුළුතරයක් වැරදි කිරීමට නැඹුරුවක් ඇත. සුළුතරයක් වෙළඳුන් ආනයනික භාණ්ඩ සඳහා වැරදි වර්ගීකරණය, මිල අඩුවෙන් සඳහන් කිරීම, හා භාණ්ඩ රේගුවට ප්‍රකාශ නොකර සිටීම වැනි රේගු වැරදිවලට යොමු වේ.

2018 වසර තුළ දී නිවාරණ අංශය මගින් මෙහෙයවනු ලැබූ රේගු පරීක්ෂණ පිළිබඳ විස්තර පහත දැක්වේ.
මෙම අංශයේ පහත දක්වා ඇති ශාඛාවන් තුල සිදුකරන ලද සිද්ධීන් පමණක් ඇතුලත් කර ඇත.

| |
|---|
| **1. උප නිවාරණ කාර්යාලය - මීගමුව** |
| **2. උප නිවාරණ කාර්යාලය - කොග්ගල** |
| **3. උප නිවාරණ කාර්යාලය - කන්කසන්තුරේ** |
| **4 උප නිවාරණ කාර්යාලය - ත්‍රිකුණාමලය** |
| **5. උප නිවාරණ කාර්යාලය - සින්නපාඩු** |
| **6. උප නිවාරණ කාර්යාලය - නයිකන්ද** |
| **7. සමුද්‍ර අංශය** |
| **8. දොරටු භාර කාර්යාලය** |
| **9. විමර්ෂණ ශාඛාව** |
| **10. නිවාරණ ශාඛාව - පාලන** |
| **11. නිවාරණ - පරීක්ෂණ** |
| **12. නිවාරණ අංශය** |
| **13. මෙහෙයුම් අංශය** |

## 01. අනාවරණය කරගැනීම්

| | | | | | |
|---|---|---|---|---|---|
| | 1.1 | <u>නව සිද්ධීන්</u> | | | |
| | 1.1.1 | කාර්ය මණ්ඩලය මගින් අනාවරණය කරගත් සිද්ධීන්/ආරම්භ කරන ලද පරීක්ෂණ | | | 356 |
| | 1.1.2 | වෙනත් නියෝජ්‍යායතන මගින් ඉදිරිපත් කරන ලද | | | 34 |
| | 1.1.3 | ලියාපදිංචි කරන ලද සිද්ධීන් සංඛ්‍යාව (1.1+1.2) | | | 390 |
| | 1.1.4 | අවසන් කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | | | |
| | | 1.1.4.1 | අවසන් කරන ලද, රේගු වැරදි සිදු නොවූ සිද්ධීන් සංඛ්‍යාව | | 67 |
| | | 1.1.4.2 | වෙනත් ඒකක/අංශවලට භාර දුන් සිද්ධි සංඛ්‍යාව | | 6 |
| | | 1.1.4.3 | සාමාන්‍ය ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා නිදහස් කරන ලද සිද්ධි සංඛ්‍යාව | | - |
| | | 1.1.4.4 | රඳවා ගැනීමට පෙර භාරදීම් | | 1 |
| | | 1.1.4.5 | සාර්ථකව නිම වූ පරීක්ෂණ | | |
| | | | 1.1.4.5.1 | දඩ, තහනම් කිරීම් සහිතව | 160 |
| | | | 1.1.4.5.2 | අතිරේක සටහන්කර පමණක් සහිතව (මිල පිරික්සුම් අංශය මගින්) | 25 |
| | | | 1.1.4.5.3 | අතිරේක සටහන්කර පමණක් සහිතව (නිවාරණ අංශය විසින්) | 4 |
| | | (අ) | අවසන් කළ මුළු සිද්ධි සංඛ්‍යාව (1.1.4.1 සිට 1.1.4.5.3 දක්වා එකතුව) | | 262 |
| | | | | | |
| | 1.1.5 | අවසන් කර නොමැති පරීක්ෂණ | | | |
| | | 1.1.5.1 | රේගු පරීක්ෂණ අවසන් නොකළ සිද්ධි | | 81 |
| | | 1.1.5.2 | විමර්ශන අවසන් නොකළ සිද්ධි | | 22 |
| | | 1.1.5.3 | ලිහිල් කිරීම සඳහා අභියාචනා (අවසන් නොකළ) | | - |
| | | 1.1.5.4 | ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දුන් | | 1 |
| | | (ආ) | අවසන් කර නොමැති සිද්ධීන් 1.1.5.1 සිට 1.1.5.4 දක්වා එකතුව) | | 104 |

## 02. අයකර ගැනීම් (රු.)

| | | |
|---|---|---|
| 2.1 | රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම | 507,384,749.00 |
| 2.2 | වර්ෂය ආරම්භයේ දී අයකර ගත යුතු වූ දඩ/තහනම් කිරීම් | 137,240,062.00 |
| 2.3 | වර්ෂය තුල දී පැන වූ දඩ/තහනම් කිරීම් | 314,960,112.14 |
| 2.4 | වර්ෂය තුල දී අයකළ තීරු බදු හා අනෙකුත් ගාස්තු | 286,889,465.14 |
| 2.5 | වර්ෂය අවසානයේ දී අය කළයුතු දඩ සහ තහනම් කිරීම් | 211,202,938.00 |
| 2.6 | මිළ පිරික්සුම් අංශයේ දී අය කළ අතිරේක සටහන්කර | 59,624,959.00 |

## 4. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කමක් ඇති දෑ ආරක්ෂණය සහ අදාළ නීති, රෙගුලාසි බලාත්මක කිරීම

ස්වකීය මෙහෙයුම් මඟින් රටේ පවතින සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත්කමක් දක්වන දෑ ආරක්ෂා කිරීමට නිවාරණ අංශයට හැකි වී ඇත.

රේගු ආඥා පනත යටතේ එන රෙගුලාසිවලට අමතරව, නිවාරණ අංශයේ නිලධාරීන් විසින් වෙනත් නීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සහතික කරනු ලබයි. එනම්,

1. ගිණි අවි සහ පතරොම් පනත
2. වන සත්ත්ව සහ වෘක්ෂලතා පිළිබඳ පනත
3. ආනයන සහ අපනයන පාලක පනත
4. ඖෂධ, සුවඳ විලවුන් හා උපකරණ පනත
5. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත
6. ආහාර හා ඖෂධ පනත
7. විනිමය පාලන පනත
8. බුද්ධිමය දේපළ පනත

## 5. කොළඹ වරාය අනෙකුත් වරායන්, නිදහස් වෙළෙඳ කලාප සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සුපිරික්සුම

කොළඹ වරායේ සුපරීක්ෂාව නිවාරණ අංශයට අයත් කොටුව නිවාරණ කාර්යාලය හා කොච්චිකඩේ නිවාරණ කාර්යාලය මගින් සිදු කරන අතර, කොටුව ප්‍රදේශයේ හා කොච්චිකඩේ ප්‍රදේශයේ සුපරීක්ෂාව පිළිවෙලින් ඉහත කාර්යාල වෙත පැවරී ඇත. දිනපතා පැය 24 පුරාම මෙම කාර්යාල විවෘතව පවතින අතර, ඒ ඒ කාර්යාල සඳහා වෙන වෙනම ගොඩබිම රාජකාරි භාර නිලධාරියෙක් හැම මොහොතකම රාජකාරියේ නියුතු වෙයි. මෙම නිලධාරීන් තමන්ට අදාළ ගේට්ටු නිල පිරික්සුමට භාජනය කරන අතර, එමගින් එම අදාළ ස්ථානවල නියමිත නිලධාරීන් සේවයේ යෙදී සිටින බවට තහවුරු කර ගනී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ නයිකන්දේ පිහිටි උප නිවාරණ කාර්යාලයෙනි. එලෙසම බියගම පිහිටි උප නිවාරණ කාර්යාලය මගින් බියගම නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කෙරේ.

කෙසේ වුවත්, පල්ලෙකැලේ, හොරණ, මීරිගම යනාදී අපනයන සැකසුම් කලාප නිවාරණ අංශයේ සුපරීක්ෂණය යටතේ නොපවතී. එනිසා එම කලාප ආශ්‍රිතව උප නිවාරණ කාර්යාල පිහිටුවීම හෝ එම කලාපවලට උප නිවාරණ කාර්යාලවලින් නිලධාරීන් පත් කිරීම රේගු කටයුතු සිදු කිරීමට මහත් වූ අවශ්‍යතාවයකි.

එසේවුවත් වර්තමානයේ දික්ඕවිට මත්ස්‍ය වරායේ ක්‍රියාකාරකම් ආරම්භ වූ හෙයින් ඒ කාර්යාල හා නවාතැන් පහසුකම් අවශ්‍යතා සම්බන්ධ තොරතුරු ප්‍රධාන කාර්යාලයට දැනුම් දී ඇති අතර මේ දක්වා එම පහසුකම් සලසා දී නොමැත. එම නිසා නිවාරණ අංශයේ ක්‍රියාකාරකම් දික්ඕවිට මත්ස්‍ය වරායේ ආරම්භ කර නොමැත.

## 6. නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය සහ දේශ සීමා මෙහෙයුම්

ප්‍රධාන වරායන් හතරෙහි (හම්බන්තොට වරාය ද ඇතුළුව) නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය නිවාරණ අංශය සතු වගකීමකි. කොටුව නිවාරණ කාර්යාලය මගින් කොළඹ වරායේ එම රාජකාරි සිදු කරන අතර, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරායන්වල දී අදාළ ස්ථානවල උප නිවාරණ කාර්යාල මගින් එම රාජකාරි සිදු කරනු ලැබේ.

කොටුව නිවාරණ කාර්යාලය මගින් දවසේ පැය 24 පුරා වරාය භාර නිලධාරීවරයෙකු **(HDO)** නාවික යාත්‍රා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා යොදවනු ලැබේ. . ඔහු වරායට සේන්දු වන නැව්වලට ගොඩවන අතර, එහිදී අදාළ නැව අවසන්වරට පිටත් වූ වරායෙන් නිකුත් කෙරුණු නික්ම යාමේ අවසර පත්‍රය තිබේදැයි තහවුරු කරගනී. අදාළ ප්‍රකාශ පත්‍රය ද ඔහු පරීක්ෂා කරයි. **(IMO Crew declarations)** ආනයන බඩු ලේඛනය, නැවෙන් නැවට මාරු කරන භාණ්ඩ ලේඛනය හා නැවෙහි කැටුව රැගෙන යන භාණ්ඩ ලේඛන රේගුවට ප්‍රකාශ කර භාරදීම කොළඹ වරායට සේන්දු වන සෑම නැවකම දේශීය නියෝජිතගේ( අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිතයන් වශයෙන්) වගකීමකි.
අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිතයන් වශයෙන් කටයුතු කරන දේශීය නියෝජිත විසින් අදාළ සියලු රාජකාරිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ බවට සෑහීමකට පත්වීමෙන් පසු සෑම එක් එක් පිටත්වන නැවක් සඳහා“ පිටත්වීමේ නිෂ්කාශන අවසර පත්‍රය" **(Outward Clearance)** වරාය රාජකාරි භාර නිලධාරියා විසින් නිකුත් කරනු ලබයි.

දැනට නැවේ දේශීය නියෝජිත විසින් අපනයන නැව් බඩු ලේඛනය නිවාරණ කාර්යාලයට භාර නොදෙන බැවින් පිටත්වීමේ අවසරය ලබා දෙන නිලධාරියාට අදාළ නික්ම යන නැවේ ඇති අපනයන භාණ්ඩ දත්ත පිළිබඳ වැටහීමක් නැත.

## 7. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ බැහැර කිරීම

මුලු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශ හා ශාඛා මගින් තහනම් කරන ලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමේ/ සුදුස්සක් කිරීමේ බලය මධ්‍යම විකුණුම් අංශය වෙත පවරා ඇත. රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීම සම්බන්ධ ප්‍රතිපාදන රේගු ආඥා පනත මගින් සලසා ඇති අතර මූල්‍ය රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් අලෙවි ක්‍රියාපටිපාටිය එවැනි වෙන්දේසිවලදී අනුගමනය කෙරේ. රජයේ මුදල් රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් මගින් විකිණීමේ පටිපාටිය එම වෙන්දේසිවලදී අනුගමනය කරනු ලැබේ.

# සමාජ ආරක්ෂණ අංශය

### හැඳින්වීම

සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙතෙක් රේගුවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ ශාඛා කීපයක් සම්බන්ධ කරමින් සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා වෙනමම අංශයක් ස්ථාපිත කරන ලදී. රේගු නීතිය සහ අනෙකුත් සම්බන්ධිත නීති දැඩිව බලාත්මක කිරීම පිණිස මත්ද්‍රව්‍ය නිවාරණ අංශය, වරාය පාලන අංශය,පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය සහ ජෛව විවිධත්වසංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය යන අංශ හඳුනාගෙන ඇත ,

**ප්‍රධාන කාර්යභාරයන්**

රේගු කාර්යාල තුළ දී වෙළඳාම සඳහා පහසුකම් සැලසීමත්, පවතින නීති බලාත්මක කිරීම තුළින් නියමිත බදු ආදායම එකතු කිරීම සහතික කරන අතරම නීති විරෝධී ලෙස මෙරටට ඇතුලුවන හෝ පිටව යන මත්ද්‍රව්‍ය අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය වැළැක්වීම / තහනම් කිරීමත් පාරිසරික, ජෛව විවිධත්ව, සංස්කෘතික, ජාතික උරුමයන් හා පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

## මත්ද්‍රව්‍ය පාලන අංශය

සමාජ ආර්ථික, සෞඛ්‍ය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරන අතරම, ආනයන අපනයන, තැපැල් තැගි පාර්සල් කුරියර් සේවය මගින් හා මගීන්ගේ ගමන් බඩු ආදිය මගින් සිදු විය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණය රේගු හා අනෙකුත් සම්බන්ධිත නීති බලාත්මක කිරීම තුළින් වැළැක්වීම පිණිස මත් ද්‍රව්‍ය නිවාරණ අංශය ස්ථාපිත කරන ලදී.

**ප්‍රධාන කාර්ය භාරයන්**

1. ගුවන් තොටුපළේ පැය 24 පුරා සුපරීක්ෂාව.
2. ගුවන් බඩු මුහුදු බඩු, තැපැල් හා කුරියර් අංශවල අහඹු සුපරීක්ෂාව
3. ගුවන් හා මුහුදු මගින් සිදුවන වාණිජමය ආනයන හා අපනයන හරහා සිදුවිය හැකි මත්ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණ හඳුනා ගැනීම හා වැළැක්වීම.
4. විශ්වාසනීය ඔත්තු විමර්ශනය කිරීම
5. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම
6. රසායන ද්‍රව්‍ය ආනයන, භාණ්ඩ නැවෙන් නැවට මාරුකිරීම සහ අපනයන අධීක්ෂණය කිරීම
7. පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශය සමග සාමූහික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

## කාර්ය සාධනය කෙටියෙන්

මත්ද්‍රව්‍ය පාලන අංශයේ විශේෂ නිලධාරී මණ්ඩලය විසින් විවිධ ප්‍රවේශ ස්ථාන වලදී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමෙන් ශ්‍රී ලංකා රේගුවට මේ වර්ෂයේ ජයග්‍රහණ රැසක් අත්කර දී ඇත. ගුවන් තොටුපල, වරාය, මධ්‍යම තැපැල් හුවමාරුව සහ ක්‍රිය සේවා ස්ථාන වලදී **සිද්ධීන් 36 ක්** වාර්තා වී ඇත.







ගුවන් මගීන් සම්බන්ධයෙන් සිද්ධි 36 න් 09 ක් ගුවන් තොටුපලේ දී හසුකර ගන්නා ලද අතර, තහනම් කිරීම් 24 ක් මධ්‍යම තැපැල් හුවමාරුවෙන් වාර්තා විය. මෙය මත්ද්‍රව්‍ය සංයුතීන් අල්ලා ගැනීමට අදාලව ශ්‍රී ලංකා රේගුව ලබාගත් ස්විශේෂී ජයග්‍රහණයකි. අර්ධ කෘත්‍රිම මත්ද්‍රව්‍ය වල ඇති නැඹුරුව කෘත්‍රිම මත්ද්‍රව්‍ය දක්වා මාරු වී ඇති බවට නිරීක්ෂණය වී ඇත.



**ප්‍රධාන ක්‍රියාකාරකම 1: අවධානම් කළමනාකරණ රාමුවක් සැලසුම්කිරීම - අවධානම් තත්ත්වයේ ඇති සංචරන සහ නැව් භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයට ලබාදෙමින් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ පරිචයන් ක්‍රමවත්ව අදාළ කරගැනීම.**

| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | සම්පූර්ණ කිරීම |
|---|---|---|
| 1. පසුබිම ස්ථාපනය කිරීම | වසර පුරාම | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 2. අවධානම් තක්සේරු කිරීම | වසර පුරාම | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| අ. අවධානම් හඳුනාගැනීම | | |
| ආ. අවධානම විශ්ලේෂණය | | |
| ඇ. අවධානම් තක්සේරු කිරීම හා ප්‍රමුඛතා ගතකිරීම. | | |
| 3. අවධානම් තර්ජනය | වසර පුරාම | ක්‍රියාත්මක වෙමින් පවතී |
| 4. අනුකූලීමේ මානයන් අධීක්ෂණය කිරීම හා සංශෝධනය කිරීම | වසර පුරාම | ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 5. සන්නිවේදනය කිරීම සහ උපදෙස් ලබාගැනීම | වසර පුරාම | ක්‍රියාත්මක වෙමින් පවතී. |

**ප්‍රධාන ක්‍රියාකාරකම 2 : ඉල්ලුම අඩුකිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.**

| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | ඉටු කිරීම. |
|---|---|---|
| 1. දේශසීමාවල සුපරීක්ෂා මට්ටම තීව්‍ර කිරීම සඳහා ප්‍රධාන අවදානම් රටවල් වශයෙන් හඳුනාගත් රටවල ජාතික නියෝජිත ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වර්ධනය කිරීම. | වසර පුරාම | රටවල් සමඟ සංනිවේදන කටයුතු ආරම්භ කරන ලදී. |
| 2. මත් ද්‍රව්‍ය නීති විරෝධීව ප්‍රවාහනය කිරීම සම්බන්ධ බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වර්ධනය කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 3. නීති විරෝධී මත් ද්‍රව්‍ය රටින් රට එහාමෙහා ගෙන යාමේ කටයුතු වල නිරතවන ඒ සඳහා නැඹුරු වී ඇති ඉලක්ක කණ්ඩායම් දැනුවත් කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |

**ප්‍රධාන ක්‍රියාකාරකම 3: සැපයුම් අඩුකිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම. - තහනම් කිරීමේ උපක්‍රම.**

| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | ඉටු කිරීම |
|---|---|---|
| 1. ගුවන් තොටුපලයන්හි (බ.ජා.ගු. සහ මත්තල) ආවේක්ෂණ රාජකාරී ක්‍රියාත්මක කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 2. වරායන්හි (කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය) ආවේක්ෂණ රාජකාරී ක්‍රියාත්මක කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 3. ශ්‍රී ලංකා මුහුදු තීරය දිගේ ආවේක්ෂණ රාජකාරී. | වසර පුරාම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 4. අවධානම් සහිත රටවලින් ගෙන එන භාණ්ඩ පරීක්ෂා කිරීම (ගුවන් භාණ්ඩ පර්යන්තය, කැටුව නොයන ගමන් මලු ගුදම්.) | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 5. අවදානම් සහිත රටවලින් පැමිණෙන පර්සල් සහ අනෙකුත් තැපැල් භාණ්ඩ පරීක්ෂා කිරීම (තැපැල් මාර්ගයෙන් එන භාණ්ඩ පරීක්ෂා කිරීමේ ඒකකය, කුරිය ආයතන පරීක්ෂා කිරීම) | වසර පුරාම | ඉටු කරන ලදී. |

**ප්‍රධාන ක්‍රියාකාරකම 4: මත්ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම සහ මත් ද්‍රව්‍ය සැපයීම අඩුකිරීමේ අදහසින් සාමාන්‍ය මහජනතාව සහ**

| රේගු නොවන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම | | |
|---|---|---|
| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | ඉටු කිරීම |
| 1. නීති විරෝධීව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය පිළිබඳ දැඩි නෛතික හසුකර ගැනීම් සහ මත්ද්‍රව්‍ය භාවිතයේ අනිසි ප්‍රතිඵල පිළිබඳ ඉලක්ක කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |
| අ. සාමාන්‍ය මහජනතාව සහ රේගු නොවන කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා සියල්ලන්ටම අදාළ වැඩසටහන්, තෝරාගත් වැඩසටහන් සහ සඳහන් කරනු ලැබ ඇති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | වසර පුරාම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 2. රේගු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සහ ඒ සඳහා ඔවුන් සම්බන්ධ කිරීම. | වසර පුරාම | |
| අ. ස්වාභාවික, අර්ධ කෘත්‍රිම සහ කෘත්‍රිම මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| ආ. මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ ප්‍රධාන මාර්ග අවබෝධකර ගැනීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| ඇ. මත්ද්‍රව්‍ය සැඟවීමේ ක්‍රමවේද ගැන අධ්‍යයනය කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| ඈ. මත්ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ විවිධ ගැන අධ්‍යයනය කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| ඉ. එක්ස් රේ ස්කෑන් යන්ත්‍ර සහ සී.ටී. ස්කෑන් යන්ත්‍ර විධිමත් පරිදි භාවිතා කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| ඊ. පෞද්ගලික පරීක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග සහ උපක්‍රම පිළිබඳ පුහුණු කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 3. රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකය ක්ෂණික බලපෑමක් කලහැකි ආකර්ෂණීය ඒකකයක් බවට පත්කිරීම පිණිස එම ඒකකයට පුහුණු අවස්ථා ලබාදීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| අ. ගිනි අවි පුහුණුව ලබාදීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |
| ආ. ඔත්තුකරුවන් වර්ධනය කර ගැනීමේ උපක්‍රම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |

| ප්‍රධාන ක්‍රියාකාරම 5: මත්ද්‍රව්‍ය ජාවාරමෙන් ඇතිවන තර්ජන මැඩපැවැත්වීම සඳහා නව උපක්‍රම සහ ක්‍රියාපටිපාටි ඇති කිරීම. | | |
|---|---|---|
| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | ඉටු කිරීම |
| 1. සීසීටීවී අධීක්ෂණ පහසුකම් ගුවන් තොටුපල සහ ගුවන් සේවා ආරක්ෂක අංශ සමඟ හුවමාරු කර ගැනීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 2. සිවිල් ඇඳුමෙන් සැරසී සිටින නිලධාරීන් වර්ධනය කිරීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |
| 3. සමාන අභිමතාර්ථ ඇති සංවිධාන සමඟ සංනිවේදන ජාලයක් ඇති කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 4. උසස් මට්ටමේ මගී තොරතුරු පද්ධතියක් ඇති කිරීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |
| **5.** මගීන්ගේ නම් වාර්තාගත කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |

| ප්‍රධාන ක්‍රියාකාරකම 6: විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත | | |
|---|---|---|
| **ප්‍රධාන ක්‍රියාමාර්ග** | **අපේක්ෂිත දිනය** | **ඉටු කිරීම** |
| **1.** ජාතික විෂ, අබිං සහ ඖෂධ පාලන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම. | වසර පුරාම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

| ප්‍රධාන ක්‍රියාකාරකම 7: ඒ හා සමාන අභිමථාර්ත සහිත සංවිධාන අතර සංනිවේදනය සහ සහයෝගිතාවය වර්ධනය කිරීම. එවැනි සංවිධාන සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගෙන යාම. | | |
|---|---|---|
| **ප්‍රධාන ක්‍රියාමාර්ග** | **අපේක්ෂිත දිනය** | **ඉටු කිරීම** |
| 1. බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |
| 2. නෛතික බාධාවන් අවම කර ගැනීමට පියවර ගැනීම. | වසර පුරාම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 3. පරිපාටික බාධාවන් අවම කර ගැනීමට පියවර ගැනීම. | වසර පුරාම | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 4. ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම. | වසර පුරාම | ඉටු කරන ලදී. |

| ප්‍රධාන ක්‍රියාකාරකම 8: කටුනායක, බ.ජ.ගු. හි ශරීරය ස්කෑන් කිරීමේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම. | | |
|---|---|---|
| **ප්‍රධාන ක්‍රියාමාර්ග** | **අපේක්ෂිත දිනය** | **ඉටු කිරීම** |
| **1.**ශරීරය ස්කෑන් කිරීමේ යන්ත්‍රයේ මෙහෙයුම් කටයුතු සඳහා අනුමැතිය ලබාගැනීම (අවශ්‍ය දෙපාර්තමේන්තු නියෝග කෙටුම්පත් කිරීම සහ රේගු ආඥා පනතට සංශෝධන) **.)** | මුල් කාර්තුවේ සිට දෙවන කාර්තුවේ අග දක්වා | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| **2.** ශරීරය ස්කෑන් කිරීමේ යන්ත්‍රයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම | තුන්වන කාර්තුවේ සිට වසර අවසානය දක්වා. | දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. |

| ප්‍රධාන ක්‍රියාකාරකම 9: මත් ද්‍රව්‍ය සඳහා සුනඛ ඒකකයක් ක්‍රියාත්මක කිරීම. | | |
|---|---|---|
| ප්‍රධාන ක්‍රියාමාර්ග | අපේක්ෂිත දිනය | ඉටු කිරීම |
| **1.** සුනඛ ඒකකයක් ස්ථාපනය කිරීම සඳහා අදාල ආයතන වලින් අනුමැතිය ලබාගැනීම. | මුල් කාර්තුව | ඉටු නොකරන ලදී. |
| **2.** අවශ්‍ය යටිතල පහසුකම් ලබාගැනීම. | මුල් කාර්තුවේ සිට දෙවන කාර්තුවේ අග දක්වා. | ඉටු නොකරන ලදී. |
| **3.** අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබාගැනීම. | මුල් කාර්තුවේ සිට තෙවන කාර්තුවේ අග දක්වා. | ඉටු නොකරන ලදී. |
| **4.** නෛතික පසුබිම සකස් කිරීම (අවශ්‍යනම් දෙපාර්තමේන්තු නියෝග) | මුල් කාර්තුවේ සිට තෙවන කාර්තුවේ අග දක්වා. | ඉටු නොකරන ලදී. |
| **5. I** සුනඛ ඒකකය ක්‍රියාත්මක කිරීම. | වසර පුරාම | ඉටු නොකරන ලදී. |

# ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය

### ජෛව විවිධත්ව ආරක්ෂණය

සමාජය සහ එහි උරුමය ආරක්ෂා කිරීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වේ. පරිසරය ආරක්ෂා කිරීම මෙම කටයුත්තේ වැදගත් කාර්යයකි. බොහෝ ජාත්‍යන්තර මෙන්ම ජාතික ආයතන මීට සම්බන්ධ වී සිටින අතර, එම ආයතන මෙකී ප්‍රයත්නයේදී ශ්‍රී ලංකා රේගුව සමඟ ඉතා සමීපව කටයුතු කරයි. ආනයනය කිරීමේ දී හා අපනයනය කිරීමේදී ජෛව විවිධත්වයට අදාල විවිධ නීති බලාත්මක කිරීමට ශ්‍රී ලංකා රේගුව බැඳී සිටී.

සර්ම කලාපීය රටක් ලෙස වෘක්ෂලතාවන් හා වන සතුන්ගෙන් ආඪ්‍යයව පවතින ශ්‍රී ලංකාව, ජෛව විවිධත්වයෙන් පොහොසත් රටවලින් එකක් මෙන් ම ලෝකයේ ජෛව විවිධත්වය අතින් වඩාත්ම ආකර්ෂණීය රටවල් අට අතරින් එකක් ලෙස ද සැලකේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පර්යේෂණ සඳහා මෙන්ම විනෝදාංශය සඳහා සතුන් එකතුකරන්නන් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ඇති අපගේ විශේෂ සඳහා ලෝකය පුරා ඉතා ඉහළ ඉල්ලුමක් ජනිත වී ඇත. ඉහළ ප්‍රතිශතයක් වන ඒකදේශිකතාව, දුර්ලභ විශේෂ, විසිතුරු බවට ඇති වටිනාකම්, අපගේ විශේෂවල ඇති සුවිශේෂී ස්වභාවය හා ගුණය නිසා මෙම ජෛව සම්පත් අධික උපයෝජනයකට ලක්වීමට හේතු වී ඇත. මේ අතර ජාවාරම් කටයුතු සඳහා නූතන තාක්ෂණය සහ සූක්ෂ්ම ක්‍රමවේද භාවිතයට පෙළඹීම හේතුවෙන් ජෛව විවිධත්වය හා සබැඳි අයිතමයන් නීති විරෝධීව බැහැර කිරීම අධීක්ෂණය කිරීමේදී හා ඒවා මැඩ පැවැත්වීමේදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රබල අභියෝගයන් රැසකට මුහුණ පෑමට සිදු වී ඇත.

මෙම අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන **ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය** ස්ථාපිත කරන ලදී. පවත්නා තොරතුරුවලට අනුව මෙය ලෝකයේ ප්‍රථම රේගු **ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය** වේ.

### සංස්කෘතිය හා ජාතික උරුමය ආරක්ෂා කිරීම

වසර දෙදහස් පන්සීයයකට වැඩි ලිඛිත ඉතිහාසයක් හා තවත් වසර දෙදහස් පන්සීයයකට වැඩි ප්‍රාග් ඓතිහාසික සාධක සහිතව වසර සිය දහසක් ඈතට දිවයන අනර්ඝ සංස්කෘතියක් හා ජාතික උරුමයක් ශ්‍රී ලංකාවට හිමි වේ.

රටේ මිල කළ නොහැකි උරුමයන් සුරක්ෂිත කිරීම සහ එම උරුමයන්වලට අයත් වංචල කෞතුක භාණ්ඩ නීති විරෝධීව අපහරණය කිරීම වැලැක්වීම රේගු දෙපාර්තමේන්තුවේ එක් අභිමතාර්ථයක් වේ.

2010 වර්ෂයේ රේගු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ දී ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය (BCNP) නිර්මාණය කර සමාජ ආරක්ෂණ අංශය යටතේ ස්ථාපිත කරන ලදී. එබැවින් සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ කටයුතුවලට ඉඩකඩ පහසුකම් සලසා දීම සඳහා ජෛව විවිධත්ව ඒකකයේ විෂය පථය ද වැඩි දියුණු කරන ලදී.

### දැක්ම

ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ දකුණු ආසියාවේ විශිෂ්ටතම රේගු අංශය වීම

### මෙහෙවර

ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමය සුරැකීම සඳහා නීතිය බලාත්මක කිරීම සහ වෙළඳාම සඳහා පහසුකම් සලසමින් ලැබිය යුතු ආදායම් සහතික කිරීම

**ප්‍රධාන කාර්යභාරයන්:**

1. දේශ සීමා අතරේ ජෛව විවිධත්ව ගණයට අයත් භාණ්ඩ සංචලනයේදී අදාල ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
2. සියළුම ජෛව විවිධත්ව සම්බන්ධකම් ඇති ආනයන හා අපනයනවල විස්තර වර්ගීකරණ හා මිල සෝදිසි කිරීම.
3. වන සත්ත්ව හා වෘක්ෂලතා සම්බන්ධ ආනයන හා අපනයන පාලනය සඳහා වන බලපත්‍ර අවශ්‍යතාවයන් සෝදිසි කිරීම හා එවැනි ආනයන හා අපනයනවල අවිධිමත්භාවය නිසා රේගු ක්‍රියාදාමයන්ට වන බලපෑම සොයා බැලීම.
4. ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට, ජෛව උරුමයට හානි නොවන ආකාරයට අප රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන සත්ත්ව හා වෘක්ෂලතා ආනයන හා අපනයන දිරිමත් කිරීම

### වැදගත් හසුකර ගැනීම්

#### පණ ඇති උරගයන් හසුකර ගැනීම

2018 ජුනි 14 වන දින කුරියර් භාණ්ඩ වශයෙන් සිංගප්පූරුව හරහා ඕස්ට්‍රේලියාවේ සිට ශ්‍රී ලංකාවට නීති විරෝධීව ගෙන්වන ලද කටුස්සන් 32 නෙකු හසුකර ගන්නා ලදී. මෙම කුරියර් භාණ්ඩ, භාවිතා කරන ලද පරිගණක වශයෙන් ප්‍රකාශ කර තිබුණි. එය කටුනායක ඩීඑච්එල්. ගුවන් භාණ්ඩ ඒකකයේ රාජකාරී කරමින් සිටි රේගු නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරන ලදී. මෙම ඇසුරුම තුල පරිගණක උපාංගයක් සොයා ගන්නා ලදී. එම උපරිගණක උපාංගය තුල කටුසු විශේෂ 32 ක් සඟවා තබා තිබූ අතර, රේගු නිලධාරීන් නොමඟ යැවීමට ඒවා රෙදි වලින් ඔතා එම උපාංගය තුලට ඔබා තිබුණි. නිපන් රටෙන් නිකුත් කරනු ලබන අවශ්‍ය බලපත්‍රය සහ සෞඛ්‍ය සහතික කිසිම සතෙකුට නොතිබුණි. එබැවින්, මෙසේ නීතිවිරෝධීව සතුන් මෙරටට ගෙන ඒම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සමඟ කියැවෙන රේගු ආඥා පනත (235 වන අධිකාරය) උල්ලංඝනය කිරීමකි.

කටුසු විශේෂ 32ක් , ඔවුන්ගෙන් වියහැකි ආක්‍රමණශීලීත්වය වැනි වියහැකි හානිකර ප්‍රතිඵල සැලකිල්ලට ගෙන, ප්‍රතිඅපනයනය කිරීමට සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ සත්ව නිරෝධායන සේවා මගින් නිර්දේශ කරන ලදි. මෙම කරුණු සියල්ලම සැලකිල්ලට ගෙන කටුසු විශේෂ 32 ප්‍රතිඅපනයනය කිරීමට තීරණය කරන ලදි. දින හයකට පසුව කටුස්සන් 32 අපනයන කරන ලද රටට ශ්‍රී ලංකාවෙන් ප්‍රතිඅපනයනය කරන ලදි.



**වටිනා ඒකදේශීක දැව - වල්ලාපට්ටා (Gyrinops walla) හසු කර ගැනීම්**

2018 අප්‍රේල් 14 වන දින ශ්‍රී ලාංකිකයන් හතරදෙනකු විසින් වල්ලාපට්ට කැබලි කි.ග්‍රෑ.119 ක් ඩුබායි රටට නිතිවිරෝධීව පිටමන් කිරිමට තැත්කිරීමේදී බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලේ මඟීන් පිටවන අංගනයේදී හසුකරගන්නා ලද අතර, එය ඉතිහාසය තුළ හසුකරගත් වාර්තාගත වැඩිම ප්‍රමාණය වේ. සාරාංශයක් වශයෙන් වල්ලාපට්ට කැබලි කි.ග්‍රෑ. 519.13ක් සහ වල්ලපට්ටා තෙල් අපනයනය කිරිමට තැත්කිරීම් 02 ක් නවත්වනු ලැබූ අතර, 2018 වර්ෂයේදී එම භාණ්ඩ බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලේ පිටවීමේ මඟීන් පිටවන අංගනයේදී තහනම් කරන ලදි. ඩුබායි ,ඉන්දියාව සහ බහරේන් වැනි ගමනාන්ත දක්වා නීතිවිරෝධීව රැගෙන යාමට තැත් කිරීමේදි එම භාණ්ඩ රාජසන්තක කරන ලදි.

වල්ලාපට්ට කැබලි සහ එයින් ලබාගන්නා තෙල් සුවද විලවුන් සහ දුම්මල නිෂ්පාදන කර්මාන්තවලදී අමුද්‍රව්‍යක් වශයෙන් ලෝක වෙළදපොලේ භාවිතා වේ. මෙම නිෂ්පාදන වලට ලෝක වෙළදපොලේ ඉහළ ඉල්ලුමක් ඇත. එමනිසා ජාවාරම් කරන්නන් විසින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනන්තරවලින් ඒවා එකතුකර විශාල වශයෙන් මුදල් ඉපයීම සඳහා අපනයනය කරයි. මෙම කටයුතු ශ්‍රී ලංකාවේ වනාන්තරවල පැවැත්මට හානිදායක වේ.

වල්ලාපට්ට වනාන්තර නිෂ්පාදනයක් වන බැවින් අපනයනය කිරිම තහනම් කර ඇත. වලංගු බලපත්‍රයක් රහිතව ආනයනය කිරීම වනන්තර ආඥා පනත සමඟ කියවෙන රේගු ආඥා පනත (235 වන අධිකාරය) උල්ලංඝනය කිරීමකි .



**කබල්ලෑ පොතු හසුකර ගැනීම. (*Manis crassicaudata*)**

2018 ජූලි 20 වන දින චීන ජාතිකයෙකු විසින් කබල්ලෑ පොතු (*Manis crassicaudata*) කි.ග්‍රෑ.1.70 ක් චීන රටට නිතිවිරෝධීව පිටමන් කිරිමට තැත්කිරීමේදී බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලේ මඟීන් පිටවන අංගනයේදී හසුකරගන්නා ලදි.

කබැල්ලෑවන් නීතිවිරෝධීව වෙළඳාම් කරන සතෙක් වශයෙන් හඳුනාගනු ලබයි. එබැවින් සියළුම කැබැල්ලා විශේෂ ජාත්‍යාන්තරව වෙළඳාම් කිරිම , තර්ජනයට ලක්වූ විශේෂ පිළිබඳ ජාතයාන්තර වෙළඳ සම්මුතිය මගින් තහනම් කර ඇත. මෙම සතුන් සාම්ප්‍රදායික චීන ඖෂධ සඳහා සහ විසිතුරු ආභරණ සැදීම සඳහා හොරෙන් දඩයම් කරති. කැබැල්ලා පොතු නීතිවිරෝධීව චීනය සහ ඉන්දියාව වැනි රටවලට අපනයනය කරනු ලබයි.

ජාත්‍යන්තර තහනම් කිරීම් වලට අමතරව, කබල්ලෑ පොතු (*Manis crassicaudata* ) අපනයනය කිරීම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සමඟ කියැවෙන රේගු ආඥා පනත (235 වන අධිකාරය) උල්ලංඝනය කිරීමකි.



**පණ පිටින් මාලු විශේෂ අත්අඩංගුවට ගැනීම.**

2018 සැප්තැම්බර් 13 වන දින සිංගප්පූරුවේ සිට පැමිණි ශ්‍රී ලාංකික මගියකු විසින් වලංගු බලපත්‍රයක් සහ සෞඛ්‍ය සහතිකයක් නොමැතිව අරවානා 10 දෙනෙක් සහ කොයිකාෆ් මසුන් 14 දෙනෙකු රටතුලට නීතිවිරෝධීව ගෙන ඒමට තැත් කිරීමේ දී අත්අඩංගුවට ගන්නා ලදී. එම භාණ්ඩ තොගයේ වටිනාකම රු.320,000/- ක් විය. එම භාණ්ඩ තොගය නැවත නිපන් රටට ප්‍රතිඅපනයනය කරන ලදී.

2018 සැප්තැම්බර් 15 වන දින කටුනායක ගුවන් භාණ්ඩ ආනයන පරියන්තයේ දී ප්‍රකාශයට පත් නොකරන ලද ආනයනය කරන ලද පණ ඇති මාලු 4435/- දෙනෙකු හසුකර ගන්නා ලදී. එම මාලු තොගයේ වටිනාකම රු.155,000/- විය. අපනයනකරුට දඩ පැණවූ අතර, භාණ්ඩ තොගය නිදහස් කරන ලදී.



**කොතල හිඹුටු හසුකර ගැනීම (*Salacia reticulata*)**

2018 වර්ෂයේ දී කොතල හිඹුටු භාජන 99 ක් චීන ජාතිකයෙකු විසින් චීනය වෙත නීති විරෝධී අයුරින් රැගෙන යාමට තැත් කිරීමේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මගීන් පිටත්වන පර්යන්තයේ දී රාජසන්තක කරන ලදී.

2018 .06.16 දින කොතල හිඹුටු කැබලි කි.ග්රෑ.3.2 ක්, 2018.07.20 කි.ග්‍රෑ.7.2 ක්, 2018.08.15 කි.ග්‍රෑ.2 ක් සහ 2018.09.07 කි.ග්‍රෑ.5 ක් ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යාමට තැත් කිරීමේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ මගීන් පිටත්වන පර්යන්තයේ දී රාජසන්තක කරන ලදී. චීන ජාතිකයන් මෙම සිද්ධිවල වරදකරුවන් බවට පත්විය.

දියවැඩියාව, සෙංගමාලය සුව කරන සහ ආහාර ජීර්ණ ක්‍රියාවලිය යනාදියේ දී ඉහළ විශේෂ ඖෂධීය වටිනාකමකින් යුත් කොතල හිඹුටු (*Salacia reticulata*) ශ්‍රී ලංකාවට ආවේණික වූ ශාකයෙකි. මෙම ශාකයට දැනට ලබාදී ඇති පේටන්ට් බලපත්‍ර හා ඉදිරිපත් කර ඇති පේටන්ට් අයදුම්පත්‍ර සංඛ්‍යාව 150 කට ආසන්නය. බහුතරය ලබා ගන්නේ ජපන් ජාතිකයන් විසිනි. ජපානය මෙම පැළය භාවිතා කරමින් ඖෂධ නිෂ්පාදනය කරන ප්‍රධාන නිෂ්පාදකයෙකි. ජාත්‍යන්තර වෙළඳපොළ තුල මේ සඳහා වන ඉල්ලුම ඉහළ යමින් පවතින නිසා මේවා නීති විරෝධීව පිටමං කිරීමට බොහෝ අය ප්‍රයත්න දරති. කොතල හිඹුටු (***Salacia reticulata***) වනාන්තර නිෂ්පාදනයක් ලෙස සලකනු ලබන අතර වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ සුරක්ෂිත කරනු ලැබ ඇත. කොතල හිඹුටු (***Salacia reticulata***) වල කිසියම් නිෂ්පාදනයක් අපනයනය කිරීම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සහ වන අඩවි සංරක්ෂණ ආඥා පනත සමග කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි.



**පණ ඇති පක්ෂීන් හසු කර ගැනීම**

2018 නොවැම්බර් 17 වන දින වලංගු බලපත්‍රයක් හා සෞඛ්‍ය සහතිකයක් නොමැතිව පණ ඇති කුරුල්ලන් 28 දෙනෙක් සිංගප්පූරුවේ සිට ශ්‍රී ලංකාවට නීති විරෝධීව ගෙන ඒමට තැත් කිරීමේ දී නිලධාරීන් විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ දී හසුකර ගන්නා ලදී. නීතිවිරෝධීව ගෙන එනු ලැබූ තැනැත්තාට දඩ පැනවූ අතර, පණ ඇති කුරුල්ලන් ආපසු සිංගප්පූරුවට ප්‍රතිඅපනයනය කරන ලදී.

මෙය වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත සමග කියවෙන රේගු ආඥා පනත (අධිකාරය 235) උල්ලංඝනය කිරීමකි.



**ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය විසින් 2018 වසරේදී සිදු කරන ලද විමර්ශන.**

| # | දිනය | විස්තරය | වටිනාකම(රුපියල්) | නඩු අංකය | සිද්ධි සටහන් |
|---|---|---|---|---|---|
| **1** | 2018-01-01 | වල්ල පට්ට කැබලි - 24.7 Kg | 2,140,000.00 | ENSP/BPU/01/2018 (BIA/D/CASE/04/2018) | විමර්ශණයෙන් පසු භාණ්ඩ රාජසන්තක කරන ලදී. පැනවූ දඩය රු. 100,000/- වන අතර, එම ප්‍රමාණය අලෙවි කරන ලදී. |
| **2** | 2018-01-02 | සඳුන් දැව කුඩු - 5 Kg | | ENSP/BPU/02/2018 | භාණ්ඩ රාජසන්තක කර 2018.04.04 දින ආයුර්වේදයට පරිත්‍යාග කරන ලදී. |
| **3** | 2018-01-02 | වියළි මුහුදු කැකිරි - 1 Kg | 5,000.00 | ENSP/BPU/03/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **4** | 2018-01-06 | ග්‍රැනයිට් කැබලි - මෙ.ටො. - 75 | 1,274,023.00 | ENSP/BPU/04/2018 | රු. 100,000/- ක දඩයක් පනවා භාණ්ඩ නිදහස් කරන ලදී. |
| **5** | 2018-01-30 | බහාලුම් පරීක්ෂාව (LCL) | 6,975,102.04 | ENSP/BPU/05/2018 | භාණ්ඩ රාජසන්තක කරනු ලැබූ අතර,රු. 5,000,000/- අයකර ගැනීමෙන් පසු නිදහස් කරන ලදී. |
| **6** | 2018-02-03 | රතු වියළි මිරිස් (බහාලුම් පරීක්ෂාව) | 2,306,288.00 | ENSP/BPU/06/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **7** | 2018-01-11 | කොතල හිඹුටු භාජන - 02 | | ENSP/BPU/07/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **8** | 2018-01-18 | කොතල හිඹුටු භාජන - 06 ,කොතල හිඹුටු කැබලි - 4.5 Kg | | ENSP/BPU/08/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **9** | 2018-02-02 | වියළි පලතුරු කැබලි - 8.6 Kg | | ENSP/BPU/09/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **10** | 2018-02-05 | කොතල හිඹුටු භාජන - 03 | 30,000.00 | ENSP/BPU/10/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **11** | 2018-02-07 | කොතල හිඹුටු භාජන - 01 | | ENSP/BPU/11/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **12** | 2018-02-07 | කොතල හිඹුටු භාජන - 02 | | ENSP/BPU/12/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **13** | 2018-02-09 | කොතල හිඹුටු භාජන - 07 , මොණර පිහිටු - මිටි 02, රාජාලියාගේ පිහාටු | | ENSP/BPU/13/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **14** | 2018-02-10 | වියළි මුහුදු කැකිරි - 1.5 Kg | 15,000.00 | ENSP/BPU/14/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| **15** | 2018-02-21 | කොතල හිඹුටු භාජන - 08 Nos | | ENSP/BPU/15/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **16** | 2018-02-27 | මොණර පිහිටු මිටිය | | ENSP/BPU/16/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **17** | 2018-03-04 | ශීත කළ මුහුදු කැකිරි - 4.6Kg | | ENSP/BPU/17/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **18** | 2018-03-05 | වල්ල පට්ට කැබලි - 116.3 Kg | 1,764,000.00 | ENSP/BPU/18/2018 | දඩය ගෙවීමට අපොහොසත් වූ සැකකරුවන් බන්ධනාගාරගත කරන ලදී. |
| **19** | 2018-03-09 | කොතල හිඹුටු භාජන - 01 | | ENSP/BPU/19/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **20** | 2018-03-15 | මුහුදු හක් බෙල්ලන් -100 | | ENSP/BPU/20/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **21** | 2018-03-16 | වල්ල පට්ට කැබලි - 24.5 Kg | 1,404,500.00 | ENSP/BPU/21/2018 (BIA/D/CASE/31/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ශණයෙන් පසු සැකකරු වෙතරු.100,000/- ක දඩයක් පනවන ලදී. |
| **22** | 2018-03-18 | කොතල හිඹුටු භාජන - 01 ,කොතල හිඹුටු කැබලි 7.3 Kg | 40,000.00 | ENSP/BPU/22/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **23** | 2018-03-20 | වල්ල පට්ට කැබලි - 7.4 Kg | 740,000.00 | ENSP/BPU/23/2018 (BIA/D/CASE/33/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ශණයෙන් පසු රු.100,000/- ක දඩයක් පනවන ලදී. |
| **24** | 2018-03-23 | බලයා මත්ස්‍යයන් ආනයනය. | | ENSP/BPU/24/2018 | පරීක්ෂණය සිදුකෙරෙමින් පවතී. |
| **25** | 2018-03-25 | කොතල හිඹුටු භාජන - 04 | | ENSP/BPU/25/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **26** | 2018-03-29 | හක් බෙල්ලන් - 01 අං සහිත ශීර්ෂකය 01, සයිප්‍රේ ගණයේ බෙල්ලා - 01 | | ENSP/BPU/26/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **27** | 2018-03-29 | කොතල හිඹුටු භාජන - 04 | | ENSP/BPU/27/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **28** | 2018-03-30 | කොතල හිඹුටු භාජන - 01 | 15,000.00 | ENSP/BPU/28/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **29** | 2018-03-31 | කොතල හිඹුටු භාජන - 0.8 Kg | | ENSP/BPU/29/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **30** | 2018-04-14 | වල්ල පට්ට කැබලි - 29 Kg | 2,910,000.00 | ENSP/BPU/30/2018 (BIA/D/CASE/55/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ෂණයෙන් පසු රු. 300,000/- ක දඩයක් පනවන ලදී. |
| **31** | 2018-04-14 | වල්ල පට්ට කැබලි - 25.5 Kg | 1,912,500.00 | ENSP/BPU/31/2018 (BIA/D/CASE/56/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | විමර්ෂණයෙන් පසු රු. 100,000/- ක දඩයක් පනවන ලදී. |
| **32** | 2018-04-14 | වල්ල පට්ට කැබලි - 39.5 Kg | 2,650,000.00 | ENSP/BPU/32/2018 (BIA/D/CASE/57/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ෂණයෙන් පසු රු. 100,000/- ක දඩයක් පනවන ලදී. |
| **33** | 2018-04-14 | වල්ල පට්ට කැබලි - 25 Kg | 2,000,000.00 | ENSP/BPU/33/2018 (BIA/D/CASE/58/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ෂණයෙන් පසු රු. 200,000/- ක දඩයක් පනවන ලදී. |
| **34** | 2018-04-14 | - කොතල හිඹුටු භාජන 01, කැමට ගතහැකි කුරුලු කූඩු - 350 g | | ENSP/BPU/34/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **35** | 2018-04-14 | වියලි මුහුදු අශ්වයන් - 100 g, වියලි මුහුදු කැකිරි - 1.9 Kg | | ENSP/BPU/35/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **36** | 2018-06-16 | කොතල හිඹුටු භාජන - 03, වියලි මුහුදු අශ්වයන්350g | | ENSP/BPU/36/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **37** | 2018-06-14 | ප්‍රකාශයට පත් නොකරන ලද උරගයන් - 32 | | ENSP/BPU/37/2018 | මුල් රටට ප්‍රතිඅපනයනය කිරීම. |
| **38** | 2018-04-29 | කැමට ගතහැකි කුරුලු කූඩු - 2.2 Kg | | ENSP/BPU/38/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **39** | 2018-04-30 | සයිප්‍රේ ගණයේ බෙල්ලා - 29 Kg, සයිප්‍රේ ගණයේ බෙල්ලා - 19 Kg | | ENSP/BPU/39/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **40** | 2018-05-10 | වල්ල පට්ට කැබලි - 19.6 Kg | 149,500.00 | ENSP/BPU/40/2018 (BIA/D/CASE/71/2018) | භාණ්ඩ රාජසන්තක කරනු ලැබූ අතර, දඩ පැනවීමක් සිදුනොකරන ලදී.. |
| **41** | 2018-05-16 | කොතල හිඹුටු භාජන - 07 Nos | | ENSP/BPU/41/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **42** | 2018-05-17 | කොතල හිඹුටු භාජන - 06 Nos | | ENSP/BPU/42/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **43** | 2018-05-19 | වල්ල පට්ට තෙල් - 0.68 Kg | 1,164,000.00 | ENSP/BPU/43/2018 (BIA/D/CASE/84/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ෂණයෙන් පසු රු. 100,000/- ක දඩයක් පනවන ලදී. ටෙන්ඩරයක් මගින් විකුණන ලදී. |
| **44** | 2018-05-20 | වල්ල පට්ට කැබලි - 15 Kg | 150,000.00 | ENSP/BPU/44/2018 (BIA/D/CASE/86/2018) | භාණ්ඩ රාජසන්තක කරන ලදී. දඩ පැනවීමක් සිදුනොකරන ලදී... |
| **45** | 2018-05-21 | වල්ල පට්ට තෙල් | | ENSP/BPU/45/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී.. |
| **46** | 2018-05-23 | කොතල හිඹුටු භාජන - 07 | | ENSP/BPU/46/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. දඩ පැනවීමක් සිදුනොකරන ලදී... |

| | | | | | |
|---|---|---|---|---|---|
| **47** | 2018-05-24 | ඔකිඩ් පැල - 1185 | 4,320.00 | ENSP/BPU/47/2018 | තීරු බදු අයකර ගෙන භාණ්ඩ නිදහස් කරන ලදී. |
| **48** | 2018-06-03 | කොතල හිඹුටු භාජන - 05 | | ENSP/BPU/48/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **49** | 2018-06-16 | කොතල හිඹුටු භාජන- 02 | | ENSP/BPU/49/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **50** | 2018-06-16 | කොතල හිඹුටු භාජන - 02, කොතල හිඹුටු කැබලි - 100g | | ENSP/BPU/50/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **51** | 2018-06-16 | කොතල හිඹුටු කැබලි - 3.2Kg, අං සහිත ශීර්ෂකය 01 | | ENSP/BPU/51/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **52** | 2018-06-26 | වල්ල පට්ට කැබලි - 18kg | 1,260,000.00 | ENSP/BPU/52/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී.. විමර්ෂණයෙන් පසු රු. 500,000/- ක දඩයක් පනවන ලදී. |
| **53** | 2018-07-05 | වල්ල පට්ට කැබලි - 61.8kg | 6858,000.00 | ENSP/BPU/53/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී.. විමර්ෂණයෙන් පසු රු. 400,000/- ක දඩයක් පනවන ලදී. |
| **54** | 2018-07-05 | වල්ල පට්ට කැබලි - 20.75kg, සඳුන් දර කැබලි - 10g, සඳුන් තෙල් - 600g | 2,075,000.00, R 150.00 | ENSP/BPU/54/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. විමර්ෂණයෙන් පසු රු. 100,000/- ක දඩයක් පනවන ලදී. |
| **55** | 2018-07-07 | වල්ල පට්ට - 2kg | 20,000.00 | ENSP/BPU/55/2018 | |
| **56** | 2018-07-20 | කබල්ලෑවා පොතු - 1.7kg, කළුවර ලී - 3kg, කොතල හිඹුටු -7.4kg | | ENSPU/BPU/56/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී.. රු. 50,000/- ක දඩයක් පනවන ලදී. |
| **57** | 2018-08-08 | මුව අං කොටස් | | ENSPU/BPU/57/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **58** | 2018-08-07 | කොතල හිඹුටු භාජන - 02, | 15,000.00 | ENSPU/BPU/58/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **59** | 2018-08-08 | කොතල හිඹුටු භාජන - 01 | | ENSPU/BPU/59/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **60** | 2018-09-08 | කොතල හිඹුටු භාජන -04, වියලි මුහුදු අශ්වයන් - 200g, වියලි මුහුදු කැකිරි - 0.6kg | | ENSP/BPU/60/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **61** | 2018-08-13 | වල්ල පට්ට කැබලි - 7.40kg, කොකුම් පොතු - 17.4kg | 500,000.00, 75,000.00 | ENSP/BPU/61/2018 | Goods were forfeited. A penalty of 100,000/- was imposed. |
| **62** | 2018-08-15 | කොතල හිඹුටු භාජන - 02 , කොතල හිඹුටු කැබලි 2kg | | ENSP/BPU/62/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **63** | 2018-08-19 | කොතල හිඹුටු භාජන 04 මුහුදු අශ්වයන් - 0.5kg | | ENSP/BPU/63/2018 | භාණ්ඩ රාජසන්තක |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | කරන ලදී. |
| **64** | 2018-08-25 | කොතල හිඹුටු භාජන 02, කොතල හිඹුටු කැබලි100g, වියලි මුහුදු කැකිරි 400g | | ENSP/BPU/64/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **65** | 2018-09-02 | කොතල හිඹුටු භාජන 04 | | ENSP/BPU/65/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **66** | 2018-09-07 | මුහුදු කැකිරි - 01kg | | ENSP/BPU/66/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **67** | 2018-09-17 | කොතල හිඹුටු කැබලි උර - 20 (ග්‍රෑම් 100 බැගින්) | | ENSP/BPU/67/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **68** | 2018-09-17 | කොතල හිඹුටු භාජන 01 | | ENSP/BPU/68/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **69** | 2018-09-17 | මුහුදු කැකිරි - 500g | | ENSP/BPU/69/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **70** | 2018-09-17 | මුහුදු සිප්පි කටු - 01 | | ENSP/BPU/70/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **71** | 2018-09-17 | මොණර පිහාටු - 02 | | ENSP/BPU/71/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **72** | 2018-09-17 | කොතල හිඹුටු උර - 50 (ග්‍රෑම් 100 බැගින්) | | ENSP/BPU/72/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **73** | 2018-09-17 | කොතල හිඹුටු භාජන 02 | | ENSP/BPU/73/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **74** | 2018-09-17 | මුහුදු සිප්පි කටු- 01 | | ENSP/BPU/74/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **75** | 2018-09-17 | කොතල හිඹුටු භාජන - 02 | | ENSP/BPU/75/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **76** | 2018-09-17 | කොතල හිඹුටු කැබලි පැකට් 4, කුඩු පැකට් 01සහ භාජන 05 | | ENSP/BPU/76/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **77** | 2018-09-17 | මී හරක් අං - 01 සහ අං - 02 | | ENSP/BPU/77/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **78** | 2018-09-17 | මුහුදු කැකිරි - 01kg | | ENSP/BPU/78/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **79** | 2018-09-17 | කොතල හිඹුටු භාජන - 02 | | ENSP/BPU/79/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **80** | 2018-09-17 | කොතල හිඹුටු භාජන -01 | | ENSP/BPU/80/2018 | භාණ්ඩ රාජසන්තක කරන ලදී. |
| **81** | 2018-05- | කොතල හිඹුටු භාජන - 06 | | ENSP/BPU/81/2018 | භාණ්ඩ රාජසන්තක |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 18 | | | | කරන ලදී. |
| **82** | 2018-09-13 | පණ ඇති මාලු -24. | | ENSP/BPU/82/2018 | භාණ්ඩ ප්‍රතිඅපනයනය කරන ලදී.. |
| **83** | 2018-09-15 | පණ ඇති මාලු - 4435 | 200,000.00 | ENSP/BPU/83/2018 | රු. 200,000/- දඩයක් පනවා භාණ්ඩ නිදහස් කන ලදී. |

**2018 වර්ෂය තුළ හසු කර ගත් සිද්ධීන්හි විශ්ලේෂණයක්**






## සහභාගී වූ රැස්වීම්, ක්‍රියාකාරී සහයෝගිතා, පුහුණුවීම් වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

### ජනවාරි මාසය

- ✓ 2018/01/16

  මහවැලි සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද වෝටර් එඩ්ජ් හි නෙළුම් ශාලවේ පැවති ජෛව විවිධත්ය පිළිබඳ සම්මුතිය සඳහා හයවන ජාතික වාර්තාව සකස්කිරිම පිළිබඳ සමාරම්භක වැඩමුළුව

- ✓ 2018/01/26

  මධ්‍යම පරිසර අධිකාරිය විසින් සංවිධානය කර මධ්‍යම පරිසර අධිකාරියෙහි පවත්වන ලද රොටර්ඩෑම් සම්මුතිය ක්‍රියාත්මක කිරීම උදෙසා ශ්‍රී ලංකාව තුළ කාර්මික රසායනික කළමනාකරණය සඳහා වන තාක්ෂණ උපදේශක කමිටුව.

- ✓ 2018/01/06

  වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පවත්වන ලද ශ්‍රී ලංකාව තුල EUROPHYT and RASFF නිවේදන සම්බන්ධ කර ගැනීමේ ජාලය විධිමත් කිරීම සඳහා සුදුසු ආයතන හඳුනා ගැනීමේ රැස්වීම.

  පෙබරවාරි මාසය

- ✓ 2018/02/19-20

  මහවැලි සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කර මීගමුව ජෙට්වින් හෝටලයේදි පවත්වන ලද ජෛව විවිධත්ය පිළිබඳ සම්මුතිය සඳහා හයවන ජාතික වාර්තාව සකස්කිරිම උදෙසා දෙදින නේවාසික වැඩමුළුව.

- ✓ 2018/02/08

  ලාකෝස්ට් ආයතනය විසින් සංවිධානය කර කොළඹ හිල්ටන් හෝටලයේදී පවත්වන ලද රේගු සන්නාම හඳුනාගැනීමේ වැඩමුළුව.

- ✓ 2018/02/14

  මහවැලි සංවර්ධන අමාත්‍යාංශය විසින් සංවිධානය කර ටාජ්සමුද්‍ර හෝටලයේ පවත්වන ලද ශ්‍රී ලංකාව තුල ජෛව විවිධත්ව මූල්‍ය අභිලාශ ව්‍යාපෘතිය පිළිබඳ වලංගුතාවයට පත්කිරීමේ ව්‍යාපෘතිය.

- ✓ 2018/02/26

  ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් සංවිධානය කර වෝටර් එඩ්ජ් හෝටලයේ පැවති ස්වභාව පදනම් කරගත් නායයෑම් අවධානය් කළමණාකරන පාර්ශව උපදේශණ වැඩමුළුව.

### මාර්තු මාසය

- ✓ 2018/03/05-06

  තිරසාර සංවර්ධන සහ වනජීවි අමාත්‍යාංශය විසින් සංවිධානය කර කොළඹ මුවෙන්පික් හෝටලයේ පවත්න ලද දකුණු ආසියානුකලාපීය වඳවීගෙන තල් මසුන් හා රේ මත්ස්‍ය විශේෂ විශේෂ පිළිබඳ ජාත්‍යාන්තර වෙළඳ සම්මුති ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව.

  2018/03/09

  එස්.එන්.බී රිඇක්ට් ආයතනය (සුගත් පෙරේරා ඇසෝසියේට්ස්) විසින් සංවිධානය කර ගෝල්ෆෝස් හෝටලයේ දී පවත්වන ලද බුද්ධිමය දේපළ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට එරෙහිව කටයුතු කිරීම සඳහා වන හඳුනා ගැනීමේ වැඩසටහන.

- ✓ 2018/03/13

  මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් සංවිධානය කර බත්තරමුල්ලේ සොබාදම් පියසේ පවත්වන ලද ජාතික ආක්‍රමණශීලී ආගන්තුක ජෛව්‍ය විශේෂ පිළිබඳ විශේෂ කණ්ඩායම් රැස්වීම 2018.

- ✓ 2018/03/13

  ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සංවිධානය කර එම අංශයේ ශ්‍රවණාගාරයේ දී ජාතික ඕසෝන් ඒකකය විසින් පවත්වන ලද රේගු නිලධාරීන් සඳහා වන හැකියා වර්ධන වැඩමුළුව.

- ✓ 2018/03/14

  මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් සංවිධානය කර බත්තරමුල්ලේ සොබාදම් පියසේ පවත්වන ලද පාශාණ සහ වැලි ආනයනය පිළිබඳ රැස්වීම.

- ✓ 2018/03/28

  මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් සංවිධානය කර බත්තරමුල්ල වෝටරස් එඩ්ජ් හෝටලයේ පවත්වන ලද ජානමය ලෙස වෙනස් කරන ලද අංගෝපාංග ආරක්ෂිතව භාවිතා කිරීමේ මාධ්‍ය වැඩමුළුව සහ ජෛව විවිධත්වය පුවත්පත් ලිපිය එළිදැක්වීම.

### මැයි මාසය

- ✓ 2018/05/31

  මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් සංවිධානය කර එම අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද "පර්යේෂණ අරමුණු සඳහා පැළ සහ සතුන් සාම්පල් අපනයනය කිරීම නියාමනය කිරීම" සඳහා වන උපකමිටුවේ රැස්වීම.

### ජුනි මාසය

- ✓ 2018/06/22
  අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කළ මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශයේ දෙවන මහලේ ශ්‍රවණාගාරයේ පැවැති අපනයන සංවර්ධන රැස්වීම.

- ✓ 2018/06/05
  මහවැලි සංවර්ධන හා පාරිසරික අමාත්‍යාංශය විසින් සංවිධානය කර එම අමාත්‍යාංශයේ දෙවන මහලේ ශ්‍රවණාගාරයේ පැවැති "ජෛව ආරක්ෂාව පිළිබඳ කාටිජනා ප්‍රොටෝකෝලයට අනුව ජාතික ජෛව ආරක්ෂක රාමුව ක්‍රියාත්මක කිරීම" ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරකම් (ජෛව ආරක්ෂාව සඳහා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, උපකාරක සහ නියාමන රාමුව) සඳහා වන දෙවන ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම.

### අගෝස්තු මාසය

- ✓ 2018/08/28
  කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික සහ පැළ ආරක්ෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කර ගන්ඕරුව අයි.එස්.ටී.අයි.(ISTI) හි පවත්වන ලද බීජ සහතික කිරීම සහ පැළ ආරක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ අනාගත නියමයන් සම්බන්ධයෙන් පාර්ශවකරුවන්ගේ සාකච්ඡා වැඩමුළුව.

### සැප්තැම්බර් මාසය

- ✓ 2018/09/17-18

  ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සංවිධානය කර කොළඹ මොවෙන්පික් හෝටලයේ පවත්වන ලද වනසතුන්නීති විරෝධීව වෙළඳාම් කිරීම ඉහල යාම පිළිබඳව වැඩමුලුව -පුහුණු මොඩියුලය; WCO INAMA.

**ඔක්තෝබර් මාසය**

- ✓ 2018/10/11

  පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කර එම අමාත්‍යාංශයේ පවත්වන ලද කාන්තාර වැලි සහ හාරා ගන්නා ලද පාෂාණ අපනයනය කිරීම සඳහා වන මාර්ගෝපදේශය: කෙටුම්පත.

- ✓ 2018/10/19

  ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පවත්වන ලද මෝරුන් සංරක්ෂණය කර කළමනාකරණය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම 201-2022.

- ✓ 2018/10/23

  ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කර ටාජ් සමුද්‍රා හෝටලයේ පවත්වන ලද එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනේ ජෛව විවිධත්ව මූල්‍යනය සමාරම්භක ව්‍යාපෘතිය(BIOFIN) යටතේ ජෛව විවිධත්ව මූල්‍ය සැලැස්ම පිළිබඳ තහවුරු කිරීමේ වැඩමුලුව.

## <u>විශේෂ කටයුතු</u>

**<u>ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුමයන් ආරක්ෂණ අංශයේ 25 වන සංවත්සරය</u>**

***"තිරසාර ආර්ථිකයක් උදෙසා ජෛව, විවිධත්වය ආරක්ෂා කිරීම, වසර 25 ක විශිෂ්ඨත්වය"***

ජෛව විවිධත්වය සහ ස්වකීය රටේ සම්පත් ආරක්ෂා කිරීම සඳහා කැපවී සිටින ලෝකයේ ප්‍රථම රේගු ඒකකය ශ්‍රී ලංකා රේගුවේ කැපවීමෙන් කටයුතු කරන දිරිමත් නිලධාරීන් විසින් ආරම්භ කරන ලදී. "ජෛව විවිධත්ව බලකාය" වශයෙන් මෙම දැවැන්ත පියවර ගන්නා ලද්දේ 1993 ජුලි 17 වන දිනයේ දීය. මෙම බලකාය ජෛව විවිධත්ව ආරක්ෂක බලකාය වශයෙන් 1997 දී නැවත නම් කරන ලද අතර, එහි සාර්ථක සහ බලපෑම් සහගත හසුකර ගැනීම් නිසා ඉතා ඉක්මණින් එය ප්‍රසිද්ධියට පත්විය.

2018 වර්ෂය ලෝකයේ ප්‍රථම ජෛව විවිධත්ව ඒකකයේ 25 වන සංවත්සරය සනිටුහන් කරයි.

පසුගිය වසර 25 තුල, ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය විසින් අපගේ ජෛව විවිධත්වය සහ ජාතික උරුමය ආරක්ෂා කරමින් අතිවිශාල සේවයක් කර ඇති අතර, දේශ සීමාව තුළ දැනටමත් සක්‍රීයව රට ආරක්ෂා කිරීමේ නිරතව සිටී.

ශ්‍රී ලංකා රේගුවේ ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශයේ 25 වන සංවත්සරය සමරනු වස් රේගු අධ්‍යක්ෂක ජනරාල්, පී.එම්.එස්. චාර්ල්ස් මහත්මියගේ මුලිකත්වයෙන් 2018 ජුලි 24 වන දින රේගු මූලස්ථානයේ දී විශේෂ උත්සවයක් සංවිධානය කර පවත්වන ලදී.

ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ආරම්භයේ සිට සියලු දුෂ්කරතා යටතේ කටයුතු කළ පෙර සිටි රේගු නිලධාරීන්, මෙම ප්‍රයත්නයේ දී මෙම අංශයට සහයෝගය දැක්වූ අනෙකුත් දෙපාර්තමේන්තු වල සහ ආයතනවල නියෝජිතයන්, ජෛව විවිධත්ව සහ අදාල ක්ෂේත්‍ර වල වෘත්තිකයන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සහ මාධ්‍යයට මෙම විශේෂ අවස්ථාවට සහභාගී වීම සඳහා ආරාධනා කරන ලදී.

ප්‍රවීන පරිසරවේදී ජගත් ගුණවර්ධන මහතා (AAL) සහ හිටපු රේගු නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශයේ නිර්මාතෘ සමන්ත ගුණසේකර මහතා විසින් විශේෂ දේශණ පවත්වන ලදී. රාජසන්තක කරන ලද මුහුදු සිප්පිකටු ශිෂ්‍යයන්ගේ විද්‍යාත්මක අධ්‍යයනය සඳහා රුහුණු විශ්ව විද්‍යාලයට සහ සාගර විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කිරීම ද මෙම අවස්ථාවේ සිදුවිය. එසේම තැපැල් මඟින් සහ කුරියර් සේවා මඟින් රටින් පිටතට/ රට තුළට යවනු ලැබිය හැකි තහනම් කරන ලද සහ සීමා කරන ලද ජෛව විවිධත්වය සහ ජාතික උරුමයට අදාල ද්‍රව්‍ය පිළිබඳ

මහජනතාව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් නිර්මාණය කරන ලද දැනුවත් කිරීමේ පෝස්ටර් තැපැල් දෙපාර්තමේන්තුව වෙත බෙදා හැරීමේ වැඩපිළිවෙලක් ද සංවිධානය කර තිබුණි.

ඊට අමතරව, ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශයේ රිදී ජුබිලිය සැමරුම නිමිත්තෙන්, විවිධ ක්ෂේත්‍රයල වෘත්තිකයන් සහ සේවයේ සිටි සහ දැනට සේවය කරන රේගු නිලධාරීන්ගේ දායකත්වයෙන් සකස් කරන ලද "Green wall" - නැමැති දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික ප්‍රකාශනය එම උත්සවයේ දී එළිදක්වන ලදී.














## පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය

දැනට රටේ බලපැවැත්වෙන රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව ආනයනික භාණ්ඩවල තත්ත්වය පාලනය හා අධීක්ෂණය කිරීමේ අදහසින් 2011 දී පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. ආනයනික හා අපනයනික භාණ්ඩවල බුද්ධිමය දේපල අයිතීන් සම්බන්ධ නීති බලාත්මක කරන ශ්‍රී ලංකා රේගුවේ කේන්ද්‍රීය ස්ථානය ලෙස පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර සම්මේලනවලදී ගන්නා තීන්දු හා තීරණ මත නීති හා බලාත්මක කිරීම තුළින් වෙනත් සම්බන්ධිත ආයතනවල සහයෝගීතාවය හරහා පරිසරය ආරක්ෂා කිරීමට ද පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය දායක වේ.

ප්‍රධාන කාර්ය භාරයන්

1. යම් උල්ලංඝනයවීම් හෝ වංචා වළක්වා ගැනීම පිණිස බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පනත (IPR), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (SLSI) , ජාතික ඖෂධ නියාමන පනත (NMRA), පරමාණු බලශක්ති අධිකාරී පනත (AEA), පාරිභෝගික කටයුතු අධිකාරි පනත (CAA), පරිසර අමාත්‍යාංශය, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීති, අණපනත්වල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. ඉහත අධිකාරි බලයන්ගෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කිරීම අවශ්‍ය වී ඇත.
2. මෙම අරමුණ උදෙසා ඉහත සඳහන් අධිකාරි ආයතන වෙනුවෙන් සකස් කරන ලද ඇපකර එක් එක් ආනයනකරු වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා ලේඛණ පවත්වා ගෙන යෑම.
3. අදාළ අධිකාරි ආයතනවලින් පැනවූ රෙගුලාසි ක්‍රියාත්මක වන පරිදි රේගු පටිපාටි යාවත්කාලීන කිරීම.
4. අවශ්‍යතාවයන් පැන නැගුණ විට භාණ්ඩ පරීක්ෂණ අංගන සඳහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයේ නිලධාරීන් අනුයුක්ත කිරීම.
5. මෙතෙක් හඳුනාගෙන ඇති රේගු නීතියට සම්බන්ධ වෙනත් අණ පනත්වල සඳහන් රෙගුලාසි සමාලෝචනය කිරීම.
6. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ වෙනත් අණ පනත් සමග කියවෙන රේගු ආඥා පනත ප්‍රකාරව නීති බලාත්මක කිරීම.

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය | තථ්‍ය | ඉටු කරන නොලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| **ප්‍රධාන කාර්යය 01 : මොන්ට්‍රියල් සම්මුතිය මගින් ආවරණය කරනු ලබන ඕසෝන් ස්ථරයට හානිවිය හැකි ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | | |
| **1.** පරිසර අමාත්‍යාංශයේ, ජාතික ඕසෝන් ඒකකයේ පූර්ව ලියාපදිංචිය නියම කරමින් සහ ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් නියම කරමින් භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 100% | |
| **2.** ඕසෝන් ස්ථරයට හානි වියහැකි ද්‍රව්‍ය සහ වඩාත් අනුකූලවීම/බලාත්මක කිරීම සඳහා ඉහත (2) හි ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පිළිබඳ රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |

| | | | |
|---|---|---|---|
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| 4. ඉල්ලීම් වලට අනුව ඕසෝන් ස්ථරයට හානිවන ද්‍රව්‍ය පිළිබඳ ආනයන දත්ත ජාතික ඕසෝන් ඒකකයට ලබාදීම. | 100% | 100% | |
| **ප්‍රධාන කාර්යයන් 02 : බාසල් ප්‍රඥප්තිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශ සීමා හරහා සංක්‍රමණයවීමට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.** | | | |
| 1. පහත සඳහන් කරණු එනම්,<br>• බාසල් ප්‍රඥප්තියේ ඇමුණුම් I සහ III ඇතුළත් කරනු ලැබූ;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයන කිරීම තහනම් කරනු ලැබූ;<br>• ආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් නියම කරමින් භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම. | 100% | 50% | **ආනයන ඉතා අවම මට්ටමක පවතී.** |
| 2. අනුකූලවීම/බලාත්මක කිරීම පහත සඳහන් කරණු එනම්,<br>• බාසල් ප්‍රඥප්තිය යටතේ සඳහන් වන හානිකර අපද්‍රව්‍ය ;<br>• ශ්‍රී ලංකාව තුළට අපනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ ;<br>• ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ අනෙකුත් පරිසර භාණ්ඩ ආනයනය කිරීම ;<br>• අන්තරාදායක හානිකර භාණ්ඩ තොග හසු කරගන්නා අවස්ථාවකදී ගතයුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග සහ තහනම් කිරීමේ තීරණ ;<br>පිළිබඳ රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| **ප්‍රධාන කාර්යය 03 : ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය කරන දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය ආනයන කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.** | | | |

| | | | |
|---|---|---|---|
| 1. පහත සඳහන් එනම්,<br>• ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තුගත කර ඇති ;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>• ආනයනය කිරීමට පෙර ආනයනය පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම ආ; භාවිතය තහනම් කරන ලද) ;<br>දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම දත්ත බෙදා හැරීම. | 100% | 50% | |
| 2. අනුකූලවීම/බලාත්මක කිරීම පහත සඳහන් එනම්,<br>• ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තුගත කර ඇති ;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;<br>• ආනයනය කිරීමට පෙර ආනයනය පාලන බලපත්‍රයක් අවශ්‍ය වන (ඇමුණුම ආ; භාවිතය තහනම් කරන ලද) ;<br>දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | 100% | 100% | |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| **ප්‍රධාන කාර්යය 04: රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය කරන (පූර්ව දැනුම්දීමේ අනුමැතිය) ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | | |
| 1. පහත සඳහන් කරුණු එනම්.<br>• රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ;<br>• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරනු ලැබූ ;<br>• කෘමිනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා යටතේ පූර්ව ලියාපදිංචිය අවශ්‍ය වන්නාවූ ආනයනය කිරීමට පෙර කෘමිනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ අන්තරායදායක රසායන සහ කෘමිනාශක පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |

| | | | |
|---|---|---|---|
| **ප්‍රධාන කාර්යයන 05: රසායනික අවි සම්මුතිය (රසායනික අවි වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම සහ භාවිතය තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ ප්‍රඥප්තියට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.** | | | |
| 1. පහත සඳහන් එනම් –<br>• රසායනික අවි ප්‍රඥප්තියේ ;<br>• ශ්‍රී ලංකාව තුළ තහනම් කරන ලද ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය කරන රසායනික පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| 2. හානි කර රසායනික ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිශ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 50% | ආනයන ඉතා අවම මට්ටමක පවතී |
| **ප්‍රධාන කාර්යය 06: බුද්ධිමය දේපළ හිමිකම් යටතේ ගැනෙන භාණ්ඩවලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | | |
| 1. පහත සඳහන් එනම් –<br>• ලියාපදිංචි වෙළඳ සන්නාම ලබාගැනීම;<br>• ශ්‍රී ලංකාවේ තහනම් කරන ලද ආනයන<br>අයිතිය දරන්නන්ගේ නිල ලැයිස්තුවක් ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 100% | |
| 2. බුද්ධිමය දේපළ යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |

| | | | |
|---|---|---|---|
| 4. ලෝක රේගු සංවිධානයේ IPM tool මගින් රේගු නිලධාරීන්ගේ නිවැරදි අයිතිකරුවන් පිළිබඳ දැනුම ඉහළ නැංවීම | 100% | 100% | |
| **ප්‍රධාන කාර්යය 07: ශ්‍රී ලංකා ප්‍රමිතිය යටතේ ගැනෙන භාණ්ඩවලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.** | | | |
| 1. පහත සඳහන් එනම් – <br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ; <br>• ආනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකයක් අවශ්‍ය වන ; <br>• ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන; <br>නිල භාණ්ඩ ලැයිස්තුවක් ලබාගැනීම සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම. | 100% | 100% | |
| 2. ශ්‍රී ලංකා ප්‍රමිතිය යටතේ ගැනෙන භාණ්ඩ ආනයනයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය ගත කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම. | 100% | 100% | |
| 3. වඩාත් ස්වෙච්ඡාවෙන් අනුකූලවීම සඳහා ඉහත (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාජ්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම. | 100% | 100% | |
| **ප්‍රධාන කාර්යය 08: "බුද්ධිමය දේපළ අයිතියට අදාළ ක්‍රියා මාර්ග ඒ/පී - 2" කූඨානුකරණය සහ සාහිත්‍ය හොරකමට එරෙහිව ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම** | | | |
| 1. බුද්ධිමය දේපළ අයිතියට අදාළ නීති බලාත්මක කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 100% | 100% | |
| 2. බුද්ධිමය දේපළ පනත උල්ලංඝනය කරන භාණ්ඩ සහිත සැක කරනු ලබන ආනයන තොග අතරමගදී සෝදිසි කිරීම. | 100% | 100% | |
| 3. බුද්ධිමය දේපළ පනත උල්ලංඝනය කරන භාණ්ඩ සහිත සැක කරනු ලබන ආනයන තොග අල්ලා ගැනීම පිළිබඳ වාර්තා කිරීම. | 100% | 100% | |
| 4. ලෝක රේගු සංවිධානයට සහ ආර්අයිඑල්ඕ කාර්යාලයට ප්‍රතිඵල පිළිබඳ කාලය වාර්තා කිරීම. | 100% | 100% | |
| 5. "බුද්ධිමය දේපළ ක්‍රියාමාර්ගයේ ප්‍රතිඵල පිළිබඳ කාර්යන් පසු විපරම් කිරීම". | 100% | 100% | |

| ප්‍රධාන කාර්යය - 09: අනෙකුත් පාර්ශවකරුවන් සහ රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණය ඉහළ නැංවීම | | | |
|---|---|---|---|
| 1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, එන්අයිපීඕ, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ රැස්වීම් සංවිධානය කිරීම. | 100% | 100% | |
| 2. පාර්ශවකරුවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම. | 100% | 100% | |
| 3. පාරිභෝගික ආරක්ෂණ කටයුතුවලදී අනෙකුත් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සංවිධානය කිරීම. | 100% | - | සම්බන්ධීකරණ කිරීමට නොහැකි විය |
| 4. මාධ්‍ය තුලින් පාරිභෝගික ආරක්ෂණ කටයුතු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 100% | 100% | |

**සාරාංශය**

**2018 වර්ෂයේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට අදාළ සිද්ධී.**

| | |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මුළු සිද්ධි සංඛ්‍යාව | **159** |
| ප්‍රමිති ආයතනයේ සිද්ධීන් වෙනුවෙන් පැනවූ මුළු දඩ ප්‍රමාණය(රු.) | **167,387,186.00** |

**2018 වර්ෂයේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අදාළ සිද්ධි.**

| | |
|---|---|
| බුද්ධිමය දේපළ අයිතිවාසිකම් වලට අදාළ මුළු සිද්ධි ප්‍රමාණය | **21** |
| රාජසන්තක කරන ලද භාණ්ඩ වල වටිනාකම (රු.) | **13,732,923.80** |

# පාලන ඒකකය

## හැඳින්වීම

දේශ සීමා හරහා සිදුවන අපරාධ මැඩපැවැත්වීමේ අදහසින් මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ ලෝක රේගු සංවිධානයේ බහාලුම් පාලන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය පිහිටුවන ලදී. වර්තමානයේ දී මෙම ඒකකය මධ්‍යම විමර්ශන අංශයේ විෂය පථයට යටත්ව පවතී. එමෙන්ම, යාත්‍රා මෙහෙයුම් කරුවන් /නැව් තොග වාර්තාකරුවන් සහ ගුවන් යානා මෙහෙයුම් කරුවන්ගෙන් ගුවන් හා නැව් භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ලබා ගනු ලබන්නේ මෙම ඒකකය විසිනි. මූලික විමර්ශණයන් අවදානම් විශ්ලේෂණය පදනම් කරගෙන සිදු කරන අතර ඒ අනුව සුදුසු පියවර ගනු ලැබේ. එසේම ගුවන් භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ගුවන්යානා මෙහෙයුම්කරුවන්ගෙන් වරාය පාලන අධිකාරිය වෙත ලැබෙමින් පවතී.

කාර්යයන්

1. ගුවන් සහ මුහුදු කටයුතු වලට අදාළ පූර්ව විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛණ ලබා ගැනීම සහ විධිමත් කිරීම මෙන්ම වරාය කටයුතු පාලනය සහ අධීක්ෂණය කිරීම.

2. අදාල ගුවන් යානා මෙහෙයුම්කරුවන්ගෙන් වැදගත් මගී තොරතුරු ලබාගැනීම.

3. විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛන භාවිතා කරමින් බහාලුම් හා අනෙකුත් නැව් භාණ්ඩ හඳුනා ගැනීම, වරාය පාලන ඒකකයේ ඇති මෙවලම් මගින් ඒවා විශ්ලේෂණය කිරීම හා තවදුරටත් ඒ පිළිබඳ විමර්ශනය කිරීම, සහ, භෞතිකව පරීක්ෂා කිරීම සඳහා ඉහල අවදානමක් ඇති බවට සලකනු ලබන බහාලුම් හා නැව් භාණ්ඩ පරීක්ෂා කිරීම.

4. විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛන භාවිතා කරමින් ඉහළ අවදානම් සහිත ගුවන් භාණ්ඩ තොග හඳුනා ගැනීම , පරීක්ෂා කිරීම සහ අවශ්‍ය අවස්ථාවන් හිදී වැඩිදුර පරීක්ෂණ පැවැත්වීම.

5. ලෝක රේගු සංවිධානය මගින් සපයන ලද භාණ්ඩ ඉලක්ක ගත පද්ධතිය අධීක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම.

6. අනෙකුත් ආයතන සමඟ සහයෝගීතා පවත්වාගෙන යාම.

## ප්‍රගති වාර්තාව

1. නැව් භාණ්ඩ වෙනුවෙන් කල්තබා විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛනගත කිරීම, අධීක්ෂණය කිරීම.
නැව් ඒජන්තවරු - යාත්‍රා නොවන පොදු වාහක (NVOCC) මෙහෙයුම්කරුවන් - නැව් භාණ්ඩ ඉදිරිපත් කරන්නන්ගේ විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛනගත කිරීම් අධීක්ෂණය කිරීම.

2. මුහුදු භාණ්ඩ වාර්තාකරණයට අදාළ නීති බලාත්මක කිරීම.
රේගු දත්ත සඳහා වන ස්වයංක්‍රීය පද්ධතිය ( ASYCUDA) වෙත විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛන යොමු කිරීම නියාමනය කිරීම සඳහා අංක **1886/55 2014.10.31** දිනැති ගැසට් පත්‍රය (අති විශේෂ) නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී**.** එම ගැසට් නිවේදනයෙහි විධිවිධාන ප්‍රකාරව, විද්‍යුත් නැව් භාණ්ඩ ලේඛන ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කිරීමට නැව් තොග වාර්තාකරුවන් සඳහා උපදෙස් ලබා දී ඇත. 2016.10.27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි "ඕ" ශාඛාව විසින් විද්‍යුත් භාණ්ඩ ලේඛනවල සංශෝධනය බලාත්මක කරන ලදී. භාණ්ඩ ලේඛන සංශෝධනය සඳහා පනවන ලද දඩ මුදලේ මුළු වටිනාකම රු. 345,000.00.

4. ගුවන් භාණ්ඩ සඳහා කල්තබා විද්‍යුත් භාණ්ඩ ලේඛනගත කිරීම අධීක්ෂණය කිරීම .
   ගුවන් යානා සමාගම් සහ භාණ්ඩ ප්‍රවාහනකරුවන් විසින් විද්‍යුත් ගුවන් භාණ්ඩ ලේඛනගත කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම
5. සැක සහිත භාණ්ඩ විමර්ශනය කිරීම.
   විස්තර පහත සඳහන් වේ.

| | |
|---|---|
| ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව | - 59 |
| සම්පූර්ණ කරන ලද සිද්ධි සංඛ්‍යාව | - 35 |
| අවසන් නොකරන ලද සිද්ධි සංඛ්‍යාව | - 24 |
| පනවන ලද දණ්ඩනලිහිල් කරන ලද/ රාජසන්තක කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම | -රු. 65,631,990.00. |

6. දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන්.

   1. 2018 අගෝස්තු 6 වන දින සිට 8 වන දින දක්වා කොළඹ දී පැවැති සී.සී.පී.(CCP) උසස් පුහුණු වැඩසටහන (ඖෂධ හා පුරෝගාමීන් හසුකර ගැනීම)
   2. 2018 සැප්තැම්බර් 04 වන දින සිට 06 වන දින දක්වා බංගලාදේශයේ ඩකා නුවර පැවැති ගුවන් භාණ්ඩ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එක්සත්ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - ලෝක රේගු සංවිධානයේ (UNODC-WCO) බහාලුම් පාලන වැඩසටහන.

# මධ්‍යම විමර්ශන අංශය

**හැඳින්වීම**

රේගු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් ප්‍රකාරව අනෙකුත් මෙහෙයුම් අංශ මගින් හසුකරගනු ලබන රේගු නීති සහ වෙනත් අදාල නීති උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශණ කටයුතු සිදුකිරිම මධ්‍යම විමර්ශණ අංශයේ වගකීම වේ. මධ්‍යම සිද්ධි ලේඛණය පවත්වාගෙන යාමද එහි වගකීමක් වේ.

එමනිසා මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් වේ.

1) සියළුම රේගු විමර්ශණ මධ්‍යගත කිරිම සහ වෘත්තිය මට්ටමින් ඒවා විමර්ශණය කිරිම

2) මධ්‍ය සිද්ධි ලේඛණය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම

3) ත්‍යාග බෙදාදීම මධ්‍යගත කිරිම සහ පාරදෘෂ්‍යභාවයකින් ඒ පිළිබඳ කටයුතු කිරීම.

ප්‍රධාන කාර්යයන්

1) අනෙකුත් අංශ (විශේෂ කාර්ය සාධන බලකාය සහ සුපරික්ෂා සහ නිවාරණ අංශ හැර) මගින් හසුකරගන්නා සිද්ධීන් විමර්ශණයට ලක්කිරිම.
2) රේගු උල්ලංඝනය කිරීම් හසුකර ගැනීම සහ විමර්ශණය කිරිම .
3) මධ්‍යම සිද්ධි ලේඛණය පවත්වාගෙන යාම .
4) විශේෂ කාර්ය සාධන බලකාය සහ සුපරික්ෂා සහ නිවාරණ අංශ මගින් සිදුකරනු ලබන විමර්ශණ වල ප්‍රගතිය අධීක්ෂණය කිරිම.
5) මධ්‍යම සිද්ධි ලේඛණයේ අවසන් කරනු ලැබ ඇති සිද්ධි යාවත්කාලීන කිරීම .
6) දෙපාර්තමේන්තුව තුල අවසන් කරන ලද සියළුම සිද්ධිවල ත්‍යාග මුදල් බෙදාහැරීම.

## 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා- ප්‍රගතිය

### මධ්‍යම විමර්ශන අංශය

**ඇ. මධ්‍යම විමර්ශන අංශය විසින්(CIB)- 2018.01.01සිට 2018.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන**

01. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 291

02. අවසන් වූ සිද්ධි සංඛ්‍යාව - 105

ඇ. දඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු. 216,174,246.00
ආ. ආපසු අය කර ගත් අතිරේක සටහන්කර - රු. 9,348,615.00
ඇ. අලෙවියෙන් ලද මුදල - රු. 10,425,597.00

03. මධ්‍යම සිද්ධි ලේඛනයේ ප්‍රගතිය
ඇ. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව - 3755
ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව - 1077

**ආ. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන**

1. අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව - 00
2. විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ වෙත යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව - 00

**ඇ. මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම**

1. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ගොනු ගණන - 3755
2. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත්කාලීන කරන ලද සිද්ධි ගණන - 1077
3. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 225

### මධ්‍යම විමර්ශන අංශයේ ප්‍රගතිය - 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා
### මධ්‍යම විමර්ශණ කාර්යාංශය

**ඇ. මධ්‍යම විමර්ශන කාර්යාංශය විසින් (CIB) - 2017.01.01සිට 2017.12.31 දක්වා සිදු කරන ලද විමර්ශන**

01. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව - 420
02. අවසන් වූ සිද්ධි සංඛ්‍යාව - 213

ඇ. දඩ මුදල් /ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම් / තව දුරටත් රාජ සන්තක කිරීම් - රු. 371,629,914.00
ආ. ආපසු අය කර ගත් මුදල - රු. 11,606,265.00
ඇ. අලෙවියෙන් ලද මුදල - රු. 12,029,531.00

03. මධ්‍යම සිද්ධි ලේඛනයේ ප්‍රගතිය

ඇ. මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව - 5,464
ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව - 3,055

**ඉ. අනෙකුත් අංශ මගින් සිදු කරන විමර්ශන**

1. එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපි ගොනු සංඛ්‍යාව - 01
2. විමර්ශනය සඳහා මෙම අංශයෙන් අනෙකුත් අංශ සඳහා යවන ලද ලිපි ගොනු සංඛ්‍යාව -00

**ඊ. මධ්‍යම සිද්ධි ලේඛනය පවත්වාගෙන යාම**

1. 1. මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද ලිපි ගොනු ගණන - 5,464
   2. මධ්‍යම සිද්ධි ලේඛනයේ යාවත්කාලීන කරන ලද සිද්ධි ගණන - 3,055




3. නිර්දේශ කරන ලද ත්‍යාග මුදල් ලැයිස්තු ගණන - 296

**සුවිශේෂී සිද්ධි**

CIB/INV/198/2018 - මධ්‍යම විමර්ශණ කාර්යාංශය වෙත ලැබුණු තොරතුරු අනුව නඩුව ආරම්භ කරන ලදී. ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම වශයෙන් රු.73,000,000.00 ක මුදලක් අය කර ගන්නා ලදී.

CIB/INV/125/2018 –ලැබුණු තොරතුරකට අනුව අතිරික්ත භාණ්ඩ සහ නිෂ්කාශනය නොකළ භාණ්ඩ තොගයක් අනාවරණය කරගන්නා ලදී. ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම වශයෙන් රු.11,000,000.00 ක මුදලක් සහ රු.100,000.00 ක දඩ මුදලක් අයකර ගන්නා ලදී.

CIB/INV/124/2018 - රජයට අයවිය යුතු බද්දෙන් මග හැරීමේ අරමුණ ඇතිව ලෝහ මිශ්‍ර කළා වූ වානේ දඟර ලෙස ප්‍රකාශ කරන ලද ලෝහ මිශ්‍ර නොකළ වානේ දඟර තොගයක් මධ්‍යම විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් සොයා ගන්නා ලදුව, ලිහිල් කරන ලද රාජ සන්තක කිරීම වශයෙන් රු. 9,300,000.00ක මුදලක් සහ 200,000.00 දඩ මුදලක් අයකර ගන්නා ලදී.



## ලියාපදිංචි සිද්ධි තොරතුරු සංසන්දනය කිරීම - 2018 සහ 2017




## මානව සම්පත් සංවර්ධනය

පුහුණු සහ වැඩමුළු

අ. විදේශ

| ක්ෂේත්‍රය | ස්ථානය | දින සංඛ්‍යාව | නිළධාරි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. අනුකූලවීමේ සහ බලාත්මක කිරීමේ යෝජනාවලිය පිළිබඳ ආසියානු / පැසිපික් කලාපීය වැඩමුළුව. | ජපානය | දින 05 | 1 |
| 2. මෙහෙයුම් පැන්ජියා ආසියානු පැසිපික් කලාප එස්පීඕසි (SPOC ) රැස්වීම | සිංගප්පූරුව | දින 3 | 1 |
| 3ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා රේගු සංඛ්‍යා ලේඛණ සහ ආදායම් කළමනාකරණ සම්මන්ත්‍රණය . | චීනය | දින 11 | 1 |
| 4.ගෝලීය ආරක්ෂණ සමුළුව. | බෙල්ජියම් | දින 3 | 1 |

ආ. දේශීය

| ක්ෂේත්‍රය | ස්ථානය | දින සංඛ්‍යාව | නිළධාරි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. ලාකොස්ටේ එස්.ඒ. (LACOSTE S.A.) ආයතනය විසින් පවත්වන ලද රේගු නිලධාරීන් සඳහා වන නිෂ්පාදන පුහුණු වැඩසටහන. | කොළඹ හිල්ටන් හෝටලය | දින 01 | 6 |
| 2. රේගු නිලධාරීන් සඳහා හැකියා වර්ධන වැඩමුළු. | මානව සම්පත් සංවර්ධන අංශයේ ශ්‍රවනාගාරය | දින 01 | 6 |
| 3. රේගු නිලධාරීන් සඳහා නිෂ්පාදනය හඳුනාගැනීමේ පුහුණු වැඩසටහන. | ගෝල්ෆේස් හෝටලය කොළඹ | දින 01 | 4 |
| 4. ජාතික රේගු තොරතුරු බලාත්මක කිරීමේ ජාලය (nCEN) ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු වැඩසටහන. | තොරතුරු සංනිවේදන තාක්ෂණ අංශය | දින 01 | 2 |
| 5. දේශ සීමාව තුල බුද්ධිමය දේපල අයිතිවාසිකම් බලාත්මක කිරීමේ වැඩමුළුව. | තාජ් සමුද්‍රා හෝටලයේ ලෝටස් පොන්ඩ් රැස්වීම් ශාළාව | දින 02 | 7 |
| 6. රේගු නිලධාරීන් සඳහා අවධානම් කළමනාකරණ වැඩමුළුව. | ප්‍රධාන ශ්‍රවනාගාරය | දින 03 | 8 |
| 7. නඩු පැවරීම හා විමර්ශණය කිරීම පිළිබඳව වැඩමුළුව. | සිනමන් ලේක්සයිඩ් හෝටලය | දින 02 | 11 |
| 8. පශ්චාත් නිශ්කාශණ විගණනය පිළිබඳ ජාතික වැඩමුළුව. | මූවැන්පික් හෝටලය | දින 05 | 2 |

# නීති කටයුතු අංශය

**හැඳින්වීම**

අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ඒ සම්බන්ධයෙන් ලිපි ගනුදෙනු කිරීම නීති කටයුතු අංශයේ කාර්යභාරය වේ. අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙම අංශයට එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක්, රේගු අධිකාරිවරයෙක්, නියෝජ්‍ය රේගු අධිකාරිවරු දෙදෙනෙක් සහ සහකාර රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු අයත්ය.

**ප්‍රධාන කාර්යයන්**

1.) අනෙකුත් අංශයන් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබා දීම පිළිබඳව සහතික වීම
2.) දෙපාර්තමේන්තුවේ සියළු නෛතික කටයුතු හා නඩු පැවරීමේ කටයුතු සම්බන්ධව සහභාගී වීම.

**<u>ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනා අධිකරණයේ අයදුම්පත් - 2018</u>**

| | |
|---|---|
| 2018 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද නඩු සංඛ්‍යාව | 48 |
| **ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත්** | 22 |
| **අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත්** | 21 |
| **මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අයදුම්පත්** | 5 |
| **2017 වර්ෂයේ සිට පවතින නඩු** | **125** |
| **2018 වර්ෂය තුළ අවසන් කරන ලද අයදුම්පත්** | 46 |
| **ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්** | 8 |
| **අභියාචනාධිකරණ අයදුම්පත්** | 38 |

<u>අනෙකුත් නෛතික කරුණු</u>

| | | |
|---|---|---|
| සිදු කරන ලද අභ්‍යන්තර නෛතික උපදෙස් ලබාදීම් සංඛ්‍යාව | | **35** |
| | **සහයෝගය දක්වන ලද ජාත්‍යන්තර ගිවිසුම් සංඛ්‍යාව** | 1 |
| | **සහයෝගය දක්වන ලද දේශීය ගිවිසුම් සංඛ්‍යාව** | 37 |
| | **නීතිපති දෙපාර්තමේන්තුවෙන් නෛතික උපදෙස් ලබාගැනීමේ සංඛ්‍යාව** | 5 |
| | **සහයෝගය දක්වන ලද මහාධිකරණ/දිසා අධිකරණ/මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත්සංඛ්‍යාව** | 47 |
| | **නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවති උපදෙස් සාකච්ඡා වලට සහභාගිවීම.** | 59 |

# මධ්‍යම බුද්ධි අංශය

**හැඳින්වීම.**

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ නිවැරදි, කාලානුරූපී හා ඵලදායී බුද්ධි තොරතුරු මෙහෙයුම් ඒකකවලට හා ඉහළ කළමනාකාරිත්වයට ලබාදීම මගින්, ආදායම් අභිමිකර ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වන "සමාජ ආරක්ෂණ" අරමුණු ළඟාකර ගැනීමය.

මෙහි පරමාර්ථයන් පහත පරිදිවේ :

- ඉහළම තීරණ ගැනීමේ මට්ටම්වලට අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම.
- බුද්ධි තොරතුරු මත පදනම් වන භාණ්ඩ හා මගීන් නිෂ්කාශන පාලන ක්‍රම අවධාරණය සහ නියාමනයට අදාළ ක්‍රියාවලීන්ට බුද්ධි තොරතුරු සැපයීම.
- දේශසීමාවලදී කෙරෙන භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව පිළිබඳව වගකීම.
- ජාතික හා ජාත්‍යන්තර බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය **24** පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය *(PIRD).*
3. බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීම හා වර්ධනය කිරීම
4. දේශීය වශයෙන් කාර්යාංශය අතරත් ජාත්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
5. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සම්බන්ධීකරණය කිරීම
6. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීම
7. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක ආරම්භක ව්‍යාපෘතිය (Container Security Initiative project**)** ක්‍රියාත්මක කිරීම
8. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම
9. නැව් බඩු ලේඛන සමාලෝචනය හා බුද්ධි තොරතුරු පාදක කර ගනිමින් අධි අවදානම් භාණ්ඩ තොග අල්ලා ගැනීම හා විමර්ශන සිදු කිරීම
10. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
11. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
12. ජාතික රේගු බලාත්මක කිරීමේ ජාල (nCEN*)* දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

## 2018 වර්ෂයේ කාර්ය සාධනය

වගුව 1: ලබා ගත් හා බෙදා හරින ලද තොරතුරු

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| PIRD මගින් ලබාගත් තොරතුරු සංඛ්‍යාව | 32 | 42 | 55 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, විද්‍යුත් තැපැල්, ලිපි, ප්‍රවෘත්ති) ලබාගැනීම | 03 | 02 | 13 |
| එකතුව | **35** | **44** | **67** |
| | | | |
| අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද බුද්ධි තොරතුරු සංඛ්‍යාව | 28 | 43 | 50 |

වගුව 2: බෙදාහරින ලද බුද්ධි අනතුරු ඇඟවීම් සංඛ්‍යාව

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| මධ්‍යම බුද්ධි අංශයේ අනතුරු ඇඟවීම් | | 06 | 07 |
| බුද්ධි වාර්තා | | 05 | |
| WCO CEN අනතුරු ඇඟවීම් | 16 | 14 | 05 |

වගුව 3: අනෙකුත් අංශ වෙත බෙදාහරින ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව:

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| පෙර වැරදිකරුවන්ගේ වාර්තා සංඛ්‍යාව | 62 | 124 | 114 |

වගුව 4: රේගු නියෝජිතවරු සහ වැට් බදු (CHA සහ VAT )ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| රේගු නියෝජිත බලපත්‍ර අලුත් කිරීම | 5825 | 6611 | 6885 |
| ශ්‍රී.ලං.ව.අ.වාප්පු බලපත්‍ර (A අවසර පත්‍ර) | 1942 | 1424 | 1431 |
| ආනයනකරුවන්ගේ වැට් අංකය ලියාපදිංචියට පෙර පරීක්ෂා කිරීම | nil | 1777 | 1963 |

වගුව 5: බහාලුම් ආරක්ෂිත මූලික වැඩසටහන යටතේ පරිලෝකනය කරන ලද බහාලුම් සංඛ්‍යාව

(CSI) වැඩසටහන:

| | | 2017 | 2018 |
|---|---|---|---|
| නැවකින් නැවකට මාරු කරන ලද බහාලුම් සංඛ්‍යාව | | 455 | 469 |
| දේශීය අපනයන බහාලුම් සංඛ්‍යාව | | 07 | 26 |
| මුළු බහාලුම් සංඛ්‍යාව | | 462 | 435 |

වගුව 6: දේශීය හා විදේශීය විමර්ශන සහ බුද්ධි නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණ කටයුතු :

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | **2016** | **2017** | **2018** | **2016** | **2017** | **2018** |
| ආදායම් බුද්ධි අංශය -ඉන්දියා | 09 | 13 | 16 | 04 | 12 | 16 |
| ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 15 | 03 | 17 | 11 | 4 | 15 |
| එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | | | 01 | | | |
| එක්සත් රාජධානියේ HM රේගුව | | | | | | |
| සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | | | | | | |
| ඩුබායි හි තානාපති කාර්යාලය | 01 | | | | | |
| එක්සත් රාජධානියේ තානාපති කාර්යාලය | 01 | | | 01 | | |
| තායිලන්ත රේගුව | | | | | | |
| මැලේසියා රේගුව | 01 | | 02 | 01 | | 01 |
| වියට්නාම් රේගුව | | | | | | |
| තායිලන්ත තානාපති කාර්යාලය | | | | | | |
| කලාපීය බුද්ධි සම්බන්ධීකරණ කාර්යාලය - කොරියාව | 05 | 02 | | 01 | | |

වගුව 7: නීති බලාත්මක කිරීමේ කාර්ය සාධනය

| | **2018** |
|---|---|
| වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය විසින් ආරම්භ කරන ලද - සෝදිසි කරන ලද සිද්ධි සංඛ්‍යාව | 46 |
| වර්ෂය තුළදී අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | 17 |
| විමර්ශන අවධියේ පවතින සිද්ධි සංඛ්‍යාව | 59 |
| භාණ්ඩ අලෙවියෙන් මුදල් එකතු කර ගැනීමට නියමිත සිද්ධි සංඛ්‍යාව | 41 |
| තීරණයක් ලබාදීම සඳහා විමර්ශන අවධියේ පවතින සිද්ධි සංඛ්‍යාව | 207 |
| අය කර ගන්නා ලද මුළු මුදල (රු.) | 49,324,643 |

# ආදායම් හා සේවා පර්ෂදය

# ප්‍රකාශන අංශය

### හැඳින්වීම

"ප්‍රකාශක" යනුවෙන් හඳුන්වන්නා වූ ආනයනකරුවන්ගේ නියෝජිතයින් විසින් මුහුදෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රකාශ අංශය වෙත වේ. මෝටර් වාහන සඳහා ඉදිරිපත් කරන රේගු ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මේ වනවිටත් මුළුමනින්ම පවරා ඇත්තේ මෙම අංශය යටතේ ඇති මෝටර් රථ වාහන අංශය වෙතයි.
ප්‍රකාශන අංශය පහත සඳහන් ඒකක වලින් සමන්විත වේ.

- "D" අංශය
- දිගු කාමරය
- මෝටර් රථ ඒකකය
- කර්මාන්ත හා සේවා ලේඛන සැකසුම් ඒකකය
- ලේඛණ (DOC) මධ්‍යස්ථානය

නව ප්‍රතිසංවිධාන සැලැස්ම පරිදි ආදායම් හා සේවා (කොළඹ) පර්ෂදය යටතේ මෙම සියලු අංශයන් ක්‍රියාත්මක වේ.
ප්‍රකාශන අංශයේ සංවිධාන ව්‍යුහය තුළ දක්වනු ලබන මෙම අංශයේ සංක්ෂිප්ත ධූරාවලිය ඇමුණුම (අ) හි දැක්වේ.

### අංශයේ විෂය ක්ෂේත්‍රය

මෙම අංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ ආනයනික හා ගුදම්ගත කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීමයි. මෙය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පරිදි පහසුකම් සපයා ඇත.

i. DT1 මගින් රේගු සටහන්කර ලබාගැනීම.
ii. රේගු සටහන්කරයේ ඇති තීරුබදු සහ අනෙකුත් බදු ගෙවීම් යාවත්කාලීන කරගැනීම හා නැව් බඩු ලේඛන අවලංගු කිරිම.
iii. තෝරාගත් ආනයනකරුවන්ට ඉක්මන් නිශ්කාෂණ පහසුකම සපයාදීම.
iv. රේගු අධිකාරි/තක්සේරුකරු විසින් රේගු සටහන්කර අනුමත කිරීම.
v. FCL බහාලුම් SLPA SAGT,CICTඅංගන වලින් එලියට ගෙන යාමට අභ්‍යන්තර අවසර පත්‍ර නිකුත් කිරිම.
vi. FCL භාණ්ඩ බහාලුම් මධ්‍යස්ථානවලදීත් LCI භාණ්ඩ ගුදම්වලදීත් නිශ්කාෂණය කිරිම
vii. "**Asycuda World**" මගින් සම්පූර්ණ ස්වයංක්‍රියකරණය ක්‍රියාත්මක වන අතර, එමගින් ආනයනකරුවන්ට පහසුවෙන් හා අප්‍රමාදව රේගු සටහන්කර කටයුතු කර ගත හැකි වේ. දැන් 2 වන මහලේ දිගු කාමරයේදී "**Asycuda**" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියලු කටයුතු ඉටු කරන අතර DTI පහසුකම මගින් පරිහරණය කරන්නන්ට තමාගේ කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඍජුවම ඇතුලත් කර හැක.
viii. භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ කටයුතු පමණක් දැනුමැති රේගු අධිකාරී හා තක්සේරු කරුවන්ගෙන් සමන්විත කාර්යය මණ්ඩලයක් අතින් සිදු කරති.

### කාර්යාංශයේ අරමුණු

i. ආනයනය භාණ්ඩ නිශ්කාෂණය පහසුකිරිම.
ii. භාණ්ඩ ගුදම් ගත කිරීමට පහසුකම් සැලසීම.
iii. භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා ආදායම් අඩුවීම් හා විදේශ විනිමය අහිමි වීම අවම කිරිම.
iv. "D" අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති වලට අනුව බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම.
v. ආනයන භාණ්ඩ මත පනවන බදු ආදායම නියමිත පරිදි ගණනය හා එකතු කිරීම.
vi. මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති භාණ්ඩ නිශ්කාෂණ ව්‍යාපෘති වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
vii. බලපත්‍ර හිමියන්ට/ නීත්‍යානුකුල ආනයනකරුවන්ට තම වාහන / භාණ්ඩ ඉතා ඉක්මනින් නිදහස් කර ගෙන යාමට පහසුකම් සැලසීම.
viii. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට සැලසීම. රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු අඩු කිරීම/ අත්හැර දැමීම හා ප්‍රමාද කිරීම ක්‍රියාත්මක කිරීම.

ix. තහනම් කිරිම සහ සීමා කිරීම් පිළිබඳ බලාත්මක කිරීම ක්‍රියාත්මක කිරීම.

**මෙම අංශයේ නිලධාරීන්ගේ වගකීම්**

ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා පරිපාටිය අයුතු පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමටත් රජයට නියමිත බදු ආදායම එකතු කර දීමටත් දිගු කාමරයේ නිලධාරීන් සහතික වෙයි. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආහාර හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, සීනි පර්යේෂණ ආයතනය, සුවඳ විලවුන් උපාංග හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පරමාණුක බල ශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමන කොමිෂම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබාගෙන තිබේදැයි සහ තනාපති, තීරු බදු නිදහස්, ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතික සහ පූර්ණ නැව් ගතකිරීමේ වාර්තාව යනාදි සහතිකයන් අපනයන කරන ලද රටවලින් නිකුත් කරන්නේ දැයි අවධානයෙන් සිටීමට මෙම නිලධාරීන් වග බලා ගනී. තවද පහත අවශ්‍යතා ආනයනකරුවන් සම්පූර්ණ කර තිබේදැයි සලකා බලයි.

- භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අනුමැතිය.
- පරිගණක පද්ධතියේ ඇති නියමිත කේත යොදා ගනිමින් භාණ්ඩවල සම්පූර්ණ විස්තරය
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කර සැදූ ආනයන තීරුබදු නාමාවලියට අදාලව භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව සිදු කිරීම
- භාණ්ඩවල සත්‍ය හුවමාරු වටිනාකම ප්‍රකාශ කිරීම.
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩවල වටිනාකම ප්‍රකාශ කිරීම
- භාණ්ඩ සඳහා අනුමත බැංකුවකින් විදේශ විනිමය හුවමාරුව සිදුවී ඇත්ද යන බව
- අවශ්‍ය පරිදි අදාළ අනුමැති, සහතික, බලපත්‍ර අමුණා තිබීම

ඉහත සියලුම කරුණු නිසි පරිදි සම්පූර්ණ කර ඇත්නම්, අදාළ නිලධාරීන් භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා රේගු සටහන්කර අනුමත කිරීම සිදු කරයි.
ඉහත සඳහන් කර ඇති පරිදි මෙම කාර්යාංශය යටතේ ඇති කාර්යයන්ට අනුකූලව මෙම ප්‍රධාන ඒකක පහකි. එකී ශාඛා වලින් සිදු කරන කාර්යයන් අනුව එම ශාඛා / ඒකක වලට බෙදනු ලැබේ.

## “D” ශාඛාව

“D” ශාඛාව කාර්යාංශයේ ලේකම් කාර්යාලය ලෙස සැලකිය හැකිය. ඓතිහාසික වශයෙන් වසර **200** කට පමණ පෙර රේගු පාලක ජනරාල්වරයා පත් කිරීමේ දී ඔහු යටතේ සේවයේ නියුතු ‘A’ විෂයය, ‘B’ විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ලිපිකරුවන් **4** දෙනෙකු සේවයේ යෙදී සිට ඇත. පසු කාලයේදී ‘A’ විෂයය දැනට පවතින මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය ලෙස (මින් පෙර පරිපාලන ශාඛාව) විකාශය විය. “C” ලිපිකරු වරයා රාජකාරි ඉටු කළ අතර, පසුව එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් වෙනමම ආයතනයක් ලෙසින් ස්ථාපිත විය. ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කළ, බදු විරාමයක් / නිදහස් ලබා දුන් හා නැව් භාණ්ඩ ලේඛන භාරගත් පැරණි “D” ශාඛාව තවමත් එම කාර්යයන්ට සමාන කාර්යභාරයක් ඉටු කරන අතර තවමත් ඒ නමින්ම හැඳින්වේ.

ආනයනකරුවන්/සාමාන්‍ය මහජනයාට පහසුකම් සැලසීම සඳහා "D" ශාඛාව සතුව අංශ කීපයක් පවතී. ඒවා නම්,

- DRA අංශය
- බැංකු ඇපකර අංශය
- තීරුබදු සහන අංශය
- තොග භාණ්ඩ අධීක්ෂණ අංශය
- Carnet අංශය
- නැව් බඩු ලේඛන අංශය
- විමර්ශන අංශය
- නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (D) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීමේ හා අවලංගු කිරීමේ අංශය

"D" ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් හා මුඛ්‍ය කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

1. මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරුබදු සහන ලියාපදිංචි කිරීම මගින් නිශ්කාෂණයට පහසුකම් ලබාදීම.
2. පාර්ලිමේන්තුවෙන් පනවන ආදායම් සංරක්ෂණ වාර්තාව අනුව තීරුබදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
3. විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ප්‍රකාරව තානාපති කාර්යාල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ හා තානාපති සේවා භාණ්ඩ නිශ්කාෂණයට අවසර දීම.
4. විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා නිදහස් තීරුබදු හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
5. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ආයතන සඳහා වූ භාණ්ඩ නිශ්කාෂණයේදී පසුව ගෙවීම් කොන්දේසි ලබාදී පහසුකම් සැලසීම.
6. භාණ්ඩ නිශ්කාෂණය සඳහා විවිධ හේතු මත රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවේදී හා තාවකාලික ප්‍රකාශපත්‍ර (Provisional Basis ) ක්‍රමය යටතේ යම් කාර්යයක් සඳහා ආනයනය කර ප්‍රතිඅපනයනය සිදුකරන අවස්ථාවේදී ඒ සඳහා පහසුකම් සැලසීම.
7. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රතිආනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
8. නාවික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන නැව් බඩු ලේඛන හා ඒවායේ සංශෝධන භාර ගැනීම.
9. රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකර හෝ ආයතනික ඇපකර ලබාගැනීම.
10. CPD Carnet or ATA Carnet මත තාවකාලිකව ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
11. තොග භාණ්ඩ ආනයනය කිරීම, අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අමතර අයකිරීම් ලබාගැනීම.
12. තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබඳ වාර්තා සකස් කිරීම හා ඒවා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
13. එතනෝල් වැටලීම් හා වාහන කැබලි අත්අඩංගුවට ගැනීම වැනි විවධ ආනයනය පාලන නීති රේගු නීති කඩකිරීම් හසු කරගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියා කිරීම.
14. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම.

# දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර, අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත්විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා; ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම කේන්ද්‍ර කොට ගත් රජයේ ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැකිය. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමඟ සමාජ ආරක්ෂණ බැදීම් බවට පරිණාමය වී ඇති නමුත් ආදායම එකතු කිරීම නම් වූ මූලික ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.

රේගු ආඥාපනතේ **10** වන වගන්තිය රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි **47** වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව) ගෙවිය යුතුය.

රේගුව විසින් රේගු බදුවලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අය කරනු ලැබේ.

- අගය එකතු කිරීමේ බද්ද (VAT)
- වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද (PAL)
- ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)

- විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL)
- නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)
- අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බදු (Cess)

  පහසුවෙන් අධීක්ෂණ හා මෙහෙයවීම සඳහා සංයෝජිත වර්ගීකරණ ක්‍රමයේ (HS) කේත අංක අනුව රේගු සටහන් කර ක්‍රියාවලිගත කිරිම සඳහා දිගු කාමරය තුළ රේගු සටහන්කර ක්‍රියාවලිගත කිරීමේ නිලධාරීන් ඒකක 5 කට බෙදා ඇත. එම ඒකක පහත දැක්වේ.

- A අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 01-44
- B අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 45-73
- C අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 74-84
- D අංශය - සංයෝජිත වර්ගීකරණ ඡේද 85-97 (මෝටර්රථ හැර)
- E අංශය - කෑම වර්ග, බෙහෙත්, තොග භාණ්ඩ, ඉක්මණින් විනාශ වන භාණ්ඩ.

**රේගු සටහන්කර ඉදිරිපත් කිරීම.**

CusDec යනු රේගු සටහන්කරය යනු ඉංග්‍රීසි යෙදුමේ කෙටි යෙදුමයි. රේගු ආඥා පනතේ **47** වන පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේදී ආනයනකරුවන් විසින් (වොරන්ට් පිටපත, බාරදීමේ පිටපත, භාරදීමේ පිටපත, විනිමය පිටපත හා පාර්ශවකරුගේ පිටපත) ලෙස සටහන්කරය පිටපත් හතරකින් ඉදිරිපත් කලයුතුව ඇත. තවද එම පිටපත් සමග පහත ලියකියවිලි ද ඉදිරිපත් කල යුතුව ඇත.

- නැව් භාර පත්රය
- භාර දීමේ නියෝගය
- ඉන්වොයිස් පත්‍රය (විදේශ විනිමය අදාළ නොවන භාණ්ඩ ආනයනයකදී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද)
- ඇසුරුම් ලේඛනය
- HS හඳුනා ගැනීමට අදාළ තාක්ෂණික තොරතුරු
- නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි
- ආනයන භාණ්ඩ, සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ ආනයන බලපත්‍ර, ප්‍රමිති කාර්යාංශ සහතික ආදී බලපත්‍ර
- නිවැරදිව පුරවන ලද වටිනාකම ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍ර දෙකක්
- ණයවර ලිපි, විදුලි සංදේශ හුවමාරු වැනි විනිමය සංසරණ ක්‍රමය ගැන ඔප්පු කිරීම.
- වෙනත් විශේෂ ලේඛන (තානාපති, තීරු බදු සහන, ශාක සනීපාරක්ෂක සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්තාව සහ සීනි පර්යේෂණ ආයතනය)

එක් රේගු සටහන්කරයක භාණ්ඩ කිහිපයක් විවිධ වර්ගීකරණ කේත HS අංක යටතේ ඇති විට වැඩිම තීරුබදු ප්‍රමාණයක් ගෙවීමට ඇති භාණ්ඩය අඩංගු ඒකකය අදාළ ඒකකය ලෙස තෝරා ගැනේ.

ආඥා පනතේ **12**, **43** වගන්තිය හා 'ආ' යටතේ රේගුව බලාත්මක කර ඇති උපලේඛනයට අනුව භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියකින් සීමාවන් හා තහනම් පැනවිය යුතුය. මෙම ඉතා පුළුල් විධිවිධානයට අනුව දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි **33**කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම රේගුවට සිදු වේ. මින් ප්‍රධානතම පනත වන්නේ **1969** අංක **01** දරණ ආනයන හා අපනයන පාලන පනතයි.

## රථ වාහන අංශය

AsyCuda World' මෘදුකාංගය හා ඇඳුනු ACCESS ජාලය හා සම්බන්ධ වීමෙන් රේගුවට බැංකු සමඟ සම්බන්ධ වී වාහන ආනයනයේදී ප්‍රේෂණය කෙරෙන විදේශ විනිමය පරික්ෂා කර බැලිය හැක. ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය පහසු කරවාගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟද සම්බන්ධ කර ඇත. එමගින් රේගු බදු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැලැක්විය හැකිය.

රේගු සටහන්කර පිළියෙල කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ.

- ✓ ත්‍යාග හා පරණ වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර
- ✓ තීරුබදු සහන යටතේ රාජ්‍ය සේවකයන්ට පාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන ප්‍රවර්ධන අධිකාරී බලපත්‍ර
- ✓ රාජ්‍ය තාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රධානීන්ට තීරුබදු රහිත බලපත්‍ර ලබාදීම.
- ✓ ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන් කර පිළියෙල කිරීම.

ඊට අමතරව රේගු සටහන් කර පිළියෙල කිරීමේදී පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලැබේ,

- පහත සඳහන් ලේඛනවල ප්‍රකාර භාණ්ඩ විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලීම.
    - ♦ ලියාපදිංචි කිරීමේ සහතිකය
    - ♦ පරීක්ෂා කිරීමේ සහතිකය
    - ♦ ඉන්වොයිසිය
    - ♦ අංගනයේ සිටින තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- ▪ වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
- ▪ වාහනයට ලැබෙන රේගු වටිනාකම නිවැරදිද යන වග
- ▪ ඉන්වොයිස් පත්‍රය අනුව ඇති මුදල් වර්ගය නිවැරදිව සටහන් කර තිබීම නිවැරදිදැයි බැලීම.
- ▪ නිපන් රට නිවැරදිව ප්‍රකාශ කිරීම.
- ▪ නිෂ්පාදිත නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද?,
- ▪ පරික්ෂා කිරීමේ සහතිකය සමඟ ඇති අමතර උපාංග ගැලපීම.
- ▪ සහනදායී ආනයන සඳහා අදාළ බලපත්‍ර අනුමත කිරීම, වාහනයේ නිශ්කාෂණය කිරීම රථවාහන අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ අනුමත කල යුතුය.

### කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීමේ ඒකකය

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ ගුදම් ගතකිරීමේ ( To - Bond)- ගුදමෙන් නිදහස් කිරීමේ (Ex- Bond) සටහන් කර අනුමත කිරීම වන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර මෙය බැඳුම්කර ඒකකයේ කොටසක්ව පැවතිණ. කර්මාන්ත හා සේවා සඳහා වෙනම කාර්යාංශයක් තිබුණද, අදාල රේගු සටහන්කර අනුමත කිරිම සිදුකරනුයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි.

## ලේඛනගත කිරිමේ මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ වාර්මිස් තොටමළුවේ වන අතර ඉදිරියේදී එය නව මූලස්ථාන කාර්යාලයේ දෙවන මහළෙහි වන රේගු දිගු කාමරය සමගින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිතය. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යභාරය පහත පරිදි වේ.

- ✓ සියළුම තොග සඳහා (අභ්‍යන්තර) රේගු ගේට්ටු අවසරපත් නිකුත් කිරීම (ආනයන, ආයෝජන මණ්ඩල, **NRFC,** බැඳුම්කර, UPD, කැටුව නොඑන පුද්ගලික බඩු ද ඇතුළුව විවිධ ශාඛා විසින් රඳවා තබාගත් කන්ටේනර්)

- ✓ කන්ටේනර් ඒවායෙහි (අපනයනය සඳහා වන තාවකාලික ආනයන) පර්යන්තවලින් ඉවත් කිරීම සඳහා SLPA/SAGT/CICT ගේට්ටු අවසරපත් නිකුත් කිරීම පිණිස නියෝග නිකුත් කිරීම

- ✓ **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට ලැබෙන ලේඛන**

  - රේගු දිගු කාමරයේ සහ බැඳුම්කර අංශයේ ඇති සුපරීක්ෂණ ඒකක මගින් පරීක්ෂා කර යොමු කරනු ලබන රේගු ප්‍රකාශනවලට අදාළව අභ්‍යන්තර රේගු ගේට්ටු අවසරපත් නිකුත් කිරීම සඳහා ඒවා ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.

  - SLPA/SAGT/CICT ට අදාළ පර්යන්තවලින් කන්ටේනර් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් අදාළ පර්යන්තවලින් කන්ටේනර් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමට SC – DOC හට හැකිවනු පිණිස ඉන්වොයිසිය සහ නැව් භාර පත්‍රය සමඟින් භාරදීමේ ඇණවුමෙහි රෝස පැහැති පිටපත SC – DOC වෙත ඉදිරිපත් කරනු ලැබේ. භාරදීමේ ඇණවුමෙහි මෙකී රෝස පැහැති පිටපත ප්‍රථම වරට රේගුවට භාරදෙනු ලබන්නේ මෙම ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී වේ. **(**එකී පිටපතෙහි රේගුව විසින් සිදුකළ කිසිදු පිටසනක් සඳහන් නොවන බැවින් එය ප්‍රකාශ අංශයේදී රේගු පරීක්ෂණාගාරයේදී භාරගන්නා ලේඛන කට්ටලයට ඇතුළත් නොකරනු ලැබේ.**)**

- ✓ **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී අනුගමනය කරනු ලබන කාර්යපටිපාටිය**

  - පරික්ෂාවට ලක් කළ රේගු ප්‍රකාශයේ රෝස පැහැති පිටපත සහ භාරදීමේ නියෝගයෙහි රෝස පැහැති පිටපත ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේ ලියාපදිංචි කරනු ලැබේ. (ICC I විසිනි)

  - ලියාපදිංචි කළ ලේඛන SC (Doc Centre-වෙත ඉදිරිපත් කෙරේ)

  - SC (Doc Centre-විසින් ලේඛන සහතික කළ පසු

    පද්ධතියට තොරතුරු ඇතුළත් කර, කන්ටේනරය පර්යන්තයෙන් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපතක් ලබාගැනීම සඳහා භාරදීමේ ඇණවුමෙහි රෝස පැහැති පිටපත SLPA/SAGT/CICT වෙත ඉදිරිපත් කරනු ලැබේ.

  - පද්ධතියට තොරතුරු ඇතුළත් කර ASC (Doc Centre) විසින් නිකුත් කරන අභ්‍යන්තර ගේට්ටු අවසරපත ලබාගැනීම සඳහා, SLPA/SAGAT/CICT ගේට්ටු අවසරපත සමඟින් රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපත ASC (Doc Centre) වෙත යොමු කරනු ලැබේ.

- ✓ රේගු ගේට්ටු අවසරපත නිකුත් කිරීමෙන් අනතුරුව, CICC (Doc Centre) විසින් අදාල රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපතෙහි ඡායා පිටපත් සහ වාප්පු ලිපිකරුගේ අවසරපත මෙන්ම රේගු අභ්‍යන්තර ගේට්ටු අවසරපතේ කොළ පැහැති පිටපත ගොනුගත කර ලියාපදිංචි කරනු ලැබේ.

- ✓ මෙකී ගේට්ටු අවසරපත් දෙක (SLPA/SAGT/CICT සහ රේගු අභ්‍යන්තර ගේට්ටු අවසරපත) ලබාගත් පසු කන්ටේනර් එම කන්ටේනර් පර්යන්තවලින් ඉවත් කරගෙන නව කන්ටේනර් ගේට්ටුව (New Container Gate) දක්වා රැගෙන ඒමට අවසර ලැබෙන අතර, එහිදී රේගු බාහිර අවසරපත නිකුත් කර කන්ටේනරය වරාය පරිශ්‍රයෙන් ඉවතට ගෙන යාමට අවසර ලබාදෙනු ලැබේ.
- ✓ නව කන්ටේනර් ගේට්ටුවේදී එකී කන්ටේනරයෙහි රේගුවේ කන්ටේනර් මුද්‍රාව තබන අතර, එම මුද්‍රා අංකය රේගු ගේට්ටු අවසරපතෙහි මුද්‍රණය කරනු ලැබේ.

## බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙන යාමට රේගුවෙන් ලබාදෙන අවසරපත් Carnet

**1.** බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙන යාමට ලබාදෙන රේගු අවසරපත්‍ර වර්ග දෙකකි. ඒවා ATA and CPD නම් වේ.

2. ATA අවසරපත්‍ර - "ATA" යනු "Admission Temporaire / Temporary Admission" ප්‍රංශ සහ ඉංග්‍රීසි වචනවල මුල අකුරු එකතු කර සකස් කරන ලද කෙටි නාමයකි.

3. වාණිජ භාණ්ඩ සාම්පල, ප්‍රදර්ශන භාණ්ඩ සහ වෘත්තීයවේදී උපකරණ තාවකාලිකව රටක් තුළට ආනයනය කිරීම ATA අවසරපත්‍ර මගින් ආවරණය කෙරේ.

4. CPD අවසරපත්‍ර - මෝටර් වාහන සහ ට්‍රේලර් සඳහා "Carnet De Passages En Douane"

5. Triptique - යතුරුපැදි සඳහා

6. 1992 වර්ෂයේදී සංශෝධනය කරන ලද පෞද්ගලික මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1954) සහ වාණිජ මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1956) පිළිබඳව වන රේගු සම්මුතින්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව සකස් කරන ලද මෙම බදු ගෙවීමෙන් තොරව භාණ්ඩ ගෙන ඒමට ලබාදෙන රේගු අවසර පත්‍රය ලැයිස්තුගත රටවල රේගු ප්‍රදේශසීමා තුළ භාවිතා කළ හැක.

7. ආනයනය කරන ලද ස්වභාවයෙන්ම ප්‍රතිඅපනයනය කිරීමට ඇති භාණ්ඩ ඇතුළත් වන ඕනෑම තාවකාලික කාර්යකරණයකට.T.A. ක්‍රියාපටිපාටිය උපයෝගී කර ගත හැක.

8. නියම කර ඇති වලංගු කාලසීමාව තුළ අවසර පත්‍රය හිමිකරු විසින් වාහනය ප්‍රතිඅපනයනය කරන බවට සහ තාවකාලික මෝටර් වාහන බලපත්‍රවලට අදාළ රේගු නීති සහ නියමයන්ට අනුකූල විය යුතු බවට වන කොන්දේසි මත එය නිකුත් කරනු ලැබේ.

**9** A.T.A. අවසරපත්‍රයක් පිළිගනු ලැබූ විටෙකදී එය නියම කරනු ලබන වෙනත් කිසිදු අපනයන ලිපිලේඛනයකට (විනිමය පාලන අවසරපත්‍රයට හෝ අපනයන බලපත්‍රයකට) හිලව් කළ නොහැක. එවැනි අවශ්‍යතාවයන් වෙනමම සම්පූර්ණ කළයුතුවේ.

**10.** Carnet අවසරපත්‍රය නිවැරදිව නිදහස් කිරීමට නම්, ඇතුළත්වීමේදී රේගුව විසින් මුද්‍රා තබනලද ආනයන වවුචරයට අනුරූප අපනයන වවුචරය වාහනය රටින් පිටවන අවස්ථාවේදී රේගුව විසින් මුද්‍රා තැබිය යුතුය.

**11.** Carnet අවසරපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේදී අවසර පත්රකරු එම අවසර පත්‍රය භාවිතා කිරීම සඳහා දී ඇති නියමයන්ට අනුව එම අවසර පත්‍ර නිකුත් කිරීමේ අදාළ අධිකාරය සමඟ ප්‍රකාශයක් සහ ගිවිසුමක් අත්සන් කළයුතු වේ.

12. සම්මුතියේ සඳහන් කිසියම් විධිවිධානයක් කඩ කිරීමක්, කිසියම් ආදේශ කිරීමක්, සාවද්‍ය ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් සිදුකර ඇත්නම්, එම වරද සිදුකරනු ලැබ ඇති රටෙහි ඇති නීති මගින් නියම කර ඇති දඩුවම්වලට යටත්ව එම වරද සිදුකරන ලද පුද්ගලයා ඒ සඳහා වගකිව යුතු වේ.

13. රේගු අධිකාරීන් .T.A. Carnet අවසරපත්‍ර සම්මුතියට අමතරව පහත සඳහන් සම්මුතීන්ටද ගිවිසුම්කාර පාර්ශවයන් වන්නේ නම් පමණක් පහත සඳහන් කාර්යකරණයන් සඳහා A.T.A. Carnet අවසරපත්‍රය භාවිතා කළ හැක.

**13.1** වෘත්තීයවේදී උපකරණ සම්මුතිය

**13.2** ප්‍රදර්ශන සහ සල්පිල් සම්මුතිය

**13.3** වෙළඳ සාම්පල සම්මුතිය

**13.4** ඇසුරුම් සම්මුතිය

**13.5** මුහුදු ප්‍රවාහන සම්මුතිය

**13.6** විද්‍යාත්මක උපකරණ සම්මුතිය

**13.7** අධ්‍යාපනික ආධාරක ද්‍රව්‍ය සම්මුතිය

**13.8** පෞද්ගලික මහාමාර්ග සහ වෙළඳ මහාමාර්ග වාහන සම්මුතිය

**13.9** අහස්යානා සහ විනෝද බෝට්ටු සම්මුතිය

## Carnet De Passage අවසරපත්‍ර ක්‍රියාපටිපාටිය

**1.** මෙම අවසරපත්‍රය පිට කවරයකින් සහ අවසරපත්‍රය මගින් ආවරණය වන භාණ්ඩවල එක් එක් ගමනය සඳහා අවශ්‍ය වන පිටුවලින් සමන්විත වේ. පිටකවරයේ ඉදිරිපස කොටසින් පහත සඳහන් තොරතුරු සපයා දෙයි.

1.1 නිකුත් කිරීමේ සංගමය

1.2 අභ්‍යන්තර ඇප පත්‍රදාමය

1.3 හිමිකරුගේ නම

1.4 වලංගු කාලසීමාව

**1.5** එය වලංගු වන රටවල් සහ එම රටවල අනුරූප ඇපවීමේ සංගම් සහ

**1.6** හිමිකරුගේ නියෝජිතයෙකු විසින් අවසර පත්‍රය භාවිතා කරන්නේ නම් එම නියෝජිතයාගේ නම

**2.** භාණ්ඩ යොදාගැනීමට අපේක්ෂා කරනු ලබන කාර්යය ඉදිරිපස පිටකවරයේ සඳහන් කර ඇත. (උදාහරණ : ප්‍රදර්ශනය සඳහා සාම්පල ආදි වශයෙනි) Carnet අවසරපත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියලුම භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තරය පිටකවරයේ පිටුපස ඇති පොදු ලැයිස්තුවට ඇතුළත් කර ඇත. මෙම අවසර පත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියලුම භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා පිටකවරයේ සහ අනෙකුත් පිටුවල ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවල අමතර පිටු ඇතුළත් කරනු ලැබිය හැක. අවශ්‍ය කරන තොරතුරු වන්නේ විස්තර කිරීම්, සළකුණු සහ අංක (තිබේ නම්) අවසර පත්‍රය නිකුත් කරනු ලබන රටෙහිදි භාණ්ඩයේ වටිනාකම සහ නිෂ්පාදනය කරනු ලැබූ රට ආදිය වේ. පැහැදිලි හඳුනාගැනීමේ අංක භාණ්ඩවල සඳහන් නොවේ නම්, රේගුව විසින් හඳුනා ගැනීමේ සළකුණු ඇලවිය හැක.

**3.** Carnet අවසරපත්‍රය කාර්යගත කිරීම රේගු අධ්‍යක්ෂ (DC) විසින් අනුමත කර වලංගු කාලසීමාව තීරණය කරනු ලබයි.

4. එම අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට ‘D’අංශයේ රේගු අධිකාරිවරයාට (SC) නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂක විසින් උපදෙස් දෙනු ලබයි

5 අවසරපත්‍රය ලියාපදිංචි කිරීමට සහ එම ලේඛනවල පිටපත් තබාගන්නා ලෙස රේගු අධිකාරි විසින් සහකාර රේගු අධිකාරි වෙත උපදෙස් දෙනු ලබයි.

6. සහකාර රේගු අධිකාරි විසින් අවසරපත්‍රය ලියාපදිංචි කර මෝටර් වාහන අංශයේදී රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමට භාණ්ඩ තොග ලබන්නාට අවසර දෙනු ලබයි.

7. ගොනුගත කර ඇති ආනයන ලියවිල්ලෙහි රේගු අධිකාරි විසින් අත්සන් කර මුද්‍රාව තබා, එම අවසර පත්‍රය යටතේ ආනයනය කරනු ලබන එකී වාහනය මාස 03 ක කාලයක් ඇතුළත ප්‍රතිඅපනයනය කරන බවට සහතික වෙමින් රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන අංශය) ඉදිරියේ ගිවිසුමක් අත්සන් කරන ලෙසට ආනයනකරුවන්ට උපදෙස් දෙනු ලබයි.

8. පාලක ලේඛනය පවත්වාගෙන යනු ලබන අතර, වලංගු දිනය මත ලේබලයක් තබයි.

9. රේගු අධ්‍යක්ෂ විසින් එකී වාහනය නිදහස් කිරීමට අවසර ලබාදිය හැකිවන පරිදි රේගු ප්‍රකාශන සමඟ එම අවසරපත්‍රය ඉන්පසුව මෝටර් වාහන ඒකකය වෙත යවනු ලැබේ.

10. විදේශීය භාණ්ඩ විකිණීමේ අරමුණ ඇතිව පෞද්ගලික අභිමතාර්ථයන් සඳහා සාප්පුවල හෝ ව්‍යාපාරික ස්ථානවල සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන මෙම අවසර පත්‍රය මගින් ආවරණය කරනු නොලබයි.

10.1 වලංගු කාලය මාස 03 ට වඩා අඩු කාලයක් නොවන්නේ නම් මිස, තාවකාලික ඇතුලත්වීමේ අවසරය ලබාදී ඇති භාණ්ඩ මාස 03 ක කාලයක් ඇතුළත ප්‍රතිඅපනයනය කළ යුතුය.

10.2 ඇතුලත්වීමේ ස්ථානයන්හිදී Carnet අවසර පත්‍ර රේගුවට ඉදිරිපත් කරනු ලැබූ විටදී, රේගු නිලධාරින් විසින් අදාළ භාණ්ඩ අවසර පත්‍රයේදී ඇති පොදු භාණ්ඩ ලේඛනයෙහි සඳහන් භාණ්ඩවල නම් සමඟ සංසන්දනය කර බලා, හැකි නම් භාණ්ඩ මත හඳුනාගැනීමේ සළකුණු තබා, එම හඳුනා ගැනීමේ සළකුණු අවසර පත්‍රයේ උප පත්‍රිකාවෙහි සටහන් කර, ආනයන වවුචරයේ රේගුව සඳහා ඇති කොටස රඳවා තබාගත යුතුය. අවශ්‍ය විස්තර රේගුව විසින් උපපත්‍රිකාව පිටපැත්තෙහි ලියනු ඇත. අදාළ භාණ්ඩ ප්‍රතිඅපනයනය කරන විටදී නැවත පරීක්ෂා කිරීම සඳහා වවුචරය ගොනු ගතකර ආරක්ෂිතව තබාගැනීම පිණිස එය 'D' ශාඛාව වෙත යැවිය යුතුවේ.

**11.** Carnet අවසර පත්‍රයක් මත ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රතිඅපනයනය කරන විටදී, එම භාණ්ඩ ආනයනය කිරීමට අදාළ විස්තර රේගුව විසින් පරීක්ෂා කර බලා ප්‍රතිඅපනයනය කිරීමේ වවුචරයේ රේගුව සඳහා ඇති කොටස වෙන් කරගෙන උපපත්‍රිකාවෙහි අවශ්‍ය පිටසන් යොදනු ලැබේ. ප්‍රතිඅපනයනය කිරීමේ වවුචරයේ වෙන්කරගන්නා ලද කොටස `D` ශාඛාව වෙත යවනු ලැබේ.

12. භාණ්ඩ ආනයනය කිරීම සහ/හෝ අපනයනය කිරීම සඳහා අවසරපත්‍ර භාවිතය රටෙහි ජාතික නීතිරීතිවලට යටත්වන්නේය.

**13.** අවසරපත්‍රයේ සඳහන් විධිවිධානයන්ට හෝ රටෙහි ජාතික නීතිවලට එරෙහි කිසිදු වංචාවක්, උල්ලංඝනය කිරීමක් හෝ අයුතු ලෙස යොදාගැනීමක් සිදුකරනු ලබන ඕනෑම අවසරපත්‍ර හිමියෙකුට එරෙහිව ක්‍රියාකිරීමේ අයිතියමෙන්ම එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දණ්ඩනය කිරීමේ අයිතිය ද රේගුව සතුවේ.

## 2018 වර්ෂය තුළදී ප්‍රකාශන කාර්යංශයේ කාර්යසාධනය

1. Asycuda world යනුවෙන් හඳුන්වනු ලබන ස්වයංක්‍රිය ක්‍රමය යටතේ ව්‍යාපාර සඳහා **පහසුකම්** සැපයීම ආනයනකරුවන්ගේ භාණ්ඩ කඩිනමින් නිශ්කාෂනය හේතුවෙන් ආනයනකරුවන් විසින් සාර්ථක ලෙස මෙම සේවය ලබාගෙන ඇත. විශේෂයෙන්ම **සෘජු** ව්‍යාපාර **යෙදවුම්** (DTI) ක්‍රමය ව්‍යාපාරිකයින් අතර ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර, එමගින් ව්‍යාපාර සඳහා අමතර වටිනාකමක්ද ලැබී ඇත.

2. **සෘජු** ව්‍යාපාර **යෙදවුම** (DTI) මගින් රේගු නිලධාරීන් මත පැටවී ඇති අධික වැඩ ප්‍රමාණය අඩු වී ඇති අතර, ඔවුන්ගේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවා ඇත.

3. නව හඳුන්වාදීම මගින් මෙම අංශයේ සාමාන්‍ය ලේඛනගත කිරීමේ කටයුතු අඩුවී ඇති අතර, තොරතුරු එකතු කිරීමේ තත්වය සහ අඩු කාලය හේතුවෙන් නිලධාරින්ට මෙන්ම මහජනයාටද පහසු කටයුත්තක් වනු ඇත.

4. මෙම අංශය මගින් 2018 වසරේ එකතු කරන ලද සම්පූර්ණ ආදායම රු.605,318,350,758 ක් වන අතර, රු.605,252,979,902 මුදලක් රේගු බදු ආදායම ලෙස රාජ්‍ය ආදායමට එකතු විය. එකී අයකිරීම්වලට අමතරව රු.55,370,856 ක මුදලක් පිළිවෙලින් රාජසන්තක කල/ දඩ මුදල් සහ අතිරේක අයකිරීම් වශයෙන් **D** අංශයෙන් එකතු කර ඇත.

5. තෝරාගත් රන් කාඩ්පත් තබා ඇති ව්‍යාපාරිකයින්ට හරිත මාර්ග පහසුකම ගිය වසරේ දී හඳුන්වා දී ඇත. 2014 වසරේ රන් කාඩ්පත් තබා ඇති ව්‍යාපාරිකයන්ට හා සමහර ඉහළ ව්‍යාපාරිකයින්ට **"සීඝ්‍ර මාර්ග නිෂ්කාශන ක්‍රමය"** රේගුව හඳුන්වා දී ඇත. දැනට මෙම කාණ්ඩයට ගැනෙන ව්‍යාපාරිකයන් සංඛ්‍යාව 218 කි. මෙම විශේෂ ව්‍යාපාරිකයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විශේෂයෙන් පත්කර ඇත.

6. **"ඉලෙක්ට්‍රොනික නැව් බඩු ලේඛන** ක්‍රමයක්" දැන් හඳුන්වා දී ඇත. නැව් නියෝජිතයින් ඔවුන්ගේ භාණ්ඩ ලේඛන නැවෙන් නැවට වෙනම මුද්‍රිත පිටපත් ඉදිරිපත් නොකර ක්ෂණිකව රේගුවට ඉදිරිපත් කරයි. දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන්ට මෙම ක්‍රමය ඉතා ප්‍රයෝජනවත් වේ.

7. D අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් **මෝටර් රථ බලපත්‍ර** අවලංගු කිරීම විද්‍යුත් මාර්ගය මගින් සිදු කරයි.

8. ඉලෙක්ට්‍රොනික DTI පද්ධතිය සහ ඉලෙක්ට්‍රොනික නැව් බඩු ලේඛනය හඳුන්වාදීම, දිගුකාමරයේ කාර්යයන්හි කාර්යක්ෂමතාව හා ඵලදායිත්වය වර්ධනය කිරීම සඳහා සාර්ථක අයුරින් බලපා ඇත.

09. 2018 වර්ෂයේ කාර්යය සාධනය පිළිබඳ සාරාංශය පහත වේ.

| | | |
|---|---|---|
| i. | ප්‍රකාශන අංශයේ සංවිධාන සැලැස්ම | - ඇමුණුම අ |
| ii. | මාසික ප්‍රගති වාර්තාව 2018 - මෝටර් වාහන අංශය | - ඇමුණුම ආ |
| iii. | මුළු ආදායම 2018- ප්‍රකාශන අංශය | - ඇමුණුම ඇ |
| iv. | ආදායම් සංසන්දනය කිරීම - දිගු කාමරය සහ මෝටර් වාහන අංශය - | ඇමුණුම ඈ |
| v. | ආදායම් වර්ගීකරණය දිගුකාමරය සහ මෝටර් වාහන | - ඇමුණුම ඉ |
| vi. | ප්‍රගති වාර්තාව 2018- ඩී අංශය | - ඇමුණුම ඊ |
| vii. | ඩී අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් | - ඇමුණුම උ |
| viii. | 2018 වර්ෂයේ ප්‍රගති වාර්තාව | - ඇමුණුම ඌ |

# කර්මාන්ත හා සේවා අංශය

## හැඳින්වීම

කර්මාන්ත හා සේවා අංශය ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හා වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීමට ආරක්ෂිත / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු සිදු කරයි. එමෙන්ම රේඛීය ආයතන අතර එනම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සම්බන්ධිකරණ කටයුතු පවත්වාගෙන යාම මගින් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන / අපනයන කර්මාන්ත විවිධාංගීකරණ ප්‍රවණතාව ගවේෂණය කිරීමේ අරමුණින් කටයුතු කිරීම සඳහා එකී කර්මාන්ත ප්‍රවර්ධනය කරයි.

### ප්‍රධාන ශාඛා සහ ඒවායෙහි ඒකක

- පරිපාලන සහ බැංකු ඇප ඒකකය
- බැංකු ඇප ඒකකය
- අපනයන සඳහා පහසුකම් සැලසීම සහ ව්‍යාපෘති ශාඛාව
- අපනයන පහසුකම් සැලසීමේ ඒකකය
- ව්‍යාපෘති ඒකකය
- ගුදම් තැබීමේ ඒකකය
- පෝෂක බැඳුම්කර ඒකකය
- විමර්ශණ සහ සත්‍යාක්ෂණ ශාඛාව
- බැඳුම්කර විමර්ශණ ඒකකය
- රේගු ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ ඒකකය
- ආයෝජක පහසුකම් සැලසීමේ ඒකකය **(INFAC)**
- අධීක්ෂණ සහ පද්ධති විගණන ශාඛාව
- අධීක්ෂණ සහ ආපසු ගෙවීමේ ඒකකය
- තැපැල් තක්සේරු ශාඛාව

### ප්‍රධාන කාර්යයන්

1) වෙළඳාම පහසු කිරීමේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.
2) රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම.
3) අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන හා තීරුබදු ප්‍රතිදාන පරිපාටි ආදී අපනයන පහසුකරවීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම.
4) තීරු බදු රහිත සාප්පුවල කටයුතු කළමනාකරණය කිරීම.
5) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාර විසින් ආනයනය කරනු ලබන / අපනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාශනය කිරීමේදී ආයෝජන මණ්ඩලය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.
6) බඩු ගබඩා කිරීම, තොග පාලනය, නැව් බඩු පාලනය හා ආයෝජන මණ්ඩලයේ ආනයන/අපනයන සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වාගෙන යාම සඳහා ICT කාර්යාංශය සමඟ සම්බන්ධිකරණය කිරීම.
7) ‘විලම්බන තන්ත්‍ර’ රේගු සටහන්කර සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමඟ සම්බන්ධිකරණය කිරීම.

## බැඳුම්කර විමර්ශන ඒකකය

| | |
|---|---|
| 2017 වර්ෂයේ සිට එන නඩු | **33** |
| 2018 වසර තුළදී ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | **22** |
| පෙර වර්ෂයේ නඩු ඇතුළුව අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | **14** |
| 2018 වර්ෂයේ තීරණ ලබාදීමට ඇති නඩු සංඛ්‍යාව | **12** |
| 2017 වර්ෂයේ තීරණ ලබාදීමට ඇති නඩු සංඛ්‍යාව | **29** |
| මුළු රාජසන්තක කිරීම් ප්‍රමාණය | රු**. 72,205,561.00** |

## ව්‍යාපෘති ඒකකය

### බන්ධිත ගුදම් මෙහෙයුම්

| | |
|---|---|
| බැඳුම්කර අළුත්කිරීම් | 107 |
| නිර්දේශිත නව බැඳුම්කර | 10 |
| ප්‍රති බැඳුම්ගත කිරීම් | 01 |
| ගුදම්ගත භාණ්ඩ ප්‍රවාහන අවසර පත් අළුත්කිරීම. | 14 |

### ආයතන/පෞද්ගලික ඇප සහතික

| | |
|---|---|
| ඇප සහතික අළුත්කිරීම | 131 |
| නව ඇපකර | 13 |

### බැංකු ඇපකර

| | |
|---|---|
| භාරගනු ලැබූ ඇපකර | 1147 |
| ඉල්ලා සිටින ලද ඇපකර | 2321 |
| නිදහස් කරන ලද ඇපකර | 2900 |

### විමර්ශන

| | |
|---|---|
| 2017 වර්ෂයේ සිට ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | 25 |
| ආරම්භ කරන ලද නඩු සංඛ්‍යාව | 10 |
| අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 8 |
| තීරණයක් ලබාදීමට නියමිත නඩු සංඛ්‍යාව | 27 |
| දණ්ඩන/රාජසන්තක කිරීම් අයකර ගැනීම් | රු. 215,536,142.00 |

**දේශීය අලෙවිය**

| | |
|---|---|
| රේගු සටහන්කර සංඛ්‍යාව | 16405 |
| රේගු ආනයන බදු | Rs.278,307,425.00 |
| වරාය හා ගුවන් තොටුපල බදු | Rs.356,104,988.00 |
| එකතු කළ අගය මත බදු | Rs.1,087,505,031.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු | Rs.129,376,152.00 |
| නිෂ්පාදන බදු | Rs.17,192,838.00 |
| එකතු කළ අගය මත බදු | Rs.408,784,275.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | Rs.303,993,943.00 |
| CON | Rs.255,436,490.00 |
| සත්‍යේක්ෂණ ගාස්තු | Rs.8,442,500.00 |

**අපනයන පහසුකම් සැලසීමේ ඒකකය**

**(අපනයන සැකසුම් සඳහා තාවකාලික අපනයන ඒකකය)**

| | |
|---|---|
| අපනයන සැකසුම් සඳහා තාවකාලික අපනයනය- 1 නව | 79 |
| අපනයන සැකසුම් සඳහා තාවකාලික අපනයනය- 1 -1V නව | 17 |
| IBG නව | 22 |

| | |
|---|---|
| අපනයන සැකසුම් සඳහා තාවකාලික අපනයනය - අළුත්කිරිම් 1 | 391 |
| IBG අළුත්කිරීම | 330 |

| | |
|---|---|
| O/E | රු.3,448,000.00 |
| ලියාපදිංචි කරන ලද | රු..354,000.00 |
| අළුත්කිරිම් | රු..782,000.00 |

## තැපැල් තක්සේරු ශාඛාව

**කොළඹ ශාඛාව :**

1. **බෙ.හැ. ස (POD)** සංඛ්‍යාව (භාණ්ඩ තොග)

| | |
|---|---|
| ගුවන් | 18345 |
| මුහුදු | 12612 |
| සාමාන්‍ය | 969 |
| විශාල තොග | 8878 |
| කඩිනම් | 6334 |

2. නිදහස් කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම : **Rs.225,610,465.00**

3. අයකරගත් මුළු බදු ප්‍රමාණය :

| | |
|---|---|
| රේගු ආනයන බදු | **රු.4,197,181.00** |
| වරාය හා ගුවන් තොටුපල බදු | රු.9,518,734.00 |
| එකතු කළ අගය මත බදු | රු.9,518,734.00 |
| සෙස් බදු | රු.7,559,031.00 |
| නිෂ්පාදන බදු | රු.13,934.00 |
| ජාතිය ගොඩනැගීමේ බදු | රු.3,682,911.00 |
| රේගු ආනයන බදු | රු.11,496.00 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | රු.2,448,973.00 |
| මුළු බදු ප්‍රමාණය | රු.35,627,550.00 |

4. අයකරගත් මුළු දඩ ප්‍රමාණය : රු**. 244,085.00**

5. පිටත වරාය තැපැල් තක්සේරු ශාඛාවලින්- අයකරගත් මුළු බදු ප්‍රමාණය:

| | |
|---|---|
| ත්‍රිකුණාමලය | රු. **3,204,894.00** |
| ගාල්ල | රු. 6,821,409.00 |
| යාපනය | රු. 4,649,022.00 |
| මහනුවර | රු. 4,500,100.00 |
| එකතුව | රු.19,175,425.00 |

6. 2018 වර්ෂයේදී මෙහෙයවන ලද සිද්ධි :

| | |
|---|---|
| වසර තුළ ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව | **20** |
| ජෛව,විවිධත්ව සංස්කෘතික ජාතික උරුමයන් ආරක්ෂණ අංශය වෙත භාරදුන් සිද්ධි සංඛ්‍යාව | 03 |
| මත්ද්‍රව්‍ය නාශක අංශයට භාරදුන් සිද්ධි සංඛ්‍යාව | 17 |

| වාර්ෂික ප්‍රගති වාර්තාව 2018 | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | විස්තරය | | | | | ත්‍රිකුණාමලය | මහනුවර | ගාල්ල | යාපනය | එකතුව |
| | ගුවන් | මුහුදු | සාමාන්‍ය | තොග | කඩිනම් | | | | | |
| බෙ.හැ. ස (POD) සංඛ්‍යාව | 18345 | 12612 | 969 | 8878 | 6334 | 3223 | 7017 | 5534 | 6987 | 69899 |
| පරීක්ෂා කර භාරදුන් පාර්සල් සංඛ්‍යාව | 18835 | 13906 | 1141 | 9525 | 6920 | 3485 | 7401 | 5904 | 7838 | 74955 |
| රඳවාගත් පාර්සල් සංඛ්‍යාව | 45 | 92 | නැත | නැත | නැත | නැත | නැත | නැත | 65 | 212 |
| මාසය අවසානයේදී ඉතිරිවතිබූ (POD) සංඛ්‍යාව | නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත | නැත | NIL |
| වටිනාකම | 55,311,046 | 24,244,386 | 27,026,752 | 3,184,666 | 115,843,615 | 23,699,042 | 37,675,235 | 22,427,952 | 39,143,328 | **348,556,023** |
| රේගු ආනයන තීරු බදු | 1,073,302 | 445,872 | 489,128 | 600 | 2,188,279 | 56,735 | 319,652 | 526,951 | 189,241 | **5,289,760** |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු | 3,058,427 | 1,214,282 | 1,481,109 | 8,283 | 3,756,633 | 895,664 | 2,058,394 | 1,148,658 | 1,285,141 | **14,906,591** |
| එකතු කළ අගය මත බදු | 2,201,489 | 720,530 | 1,013,207 | 4,407 | 4,255,657 | 441,909 | 1,059,444 | 1,265,726 | 607,370 | **11,569,739** |
| සෙස් බදු | 2,691,925 | 1,687,118 | 812,334 | 5,841 | 2,361,813 | 1,166,066 | 2,362,415 | 1,113,519 | 1,507,019 | **13,708,050** |
| නිෂ්පාදන බදු | 11,020 | 40 | 1,489 | 0 | 1,385 | 1,763 | 3,526 | 11,399 | 0 | **30,622** |
| ජාතිය ගොඩ නැගීමේ බදුද | 1,136,313 | 468,950 | 627,210 | 3,417 | 1,447,021 | 554,407 | 870,468 | 521,319 | 890,529 | **6,519,634** |
| විභාග ගාස්තු විභාග ගාස්තු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **0** |
| පරිගණක ගාස්තු | 10,496 | 0 | 0 | 0 | 1,000 | 0 | 0 | 6,600 | 0 | **18,096** |
| දඩ | 1,335,206 | 224,583 | 29,727 | 985 | 858,472 | 5,200 | 131,310 | 0 | 8,000 | **1,890,230** |
| ආරක්ෂිත කාමර ගාස්තු | 0 | 0 | 0 | 0 | 0 | 83,150 | 16,200 | 54,850 | 12,800 | **58,950** |
| මුළු බදු ප්‍රමාණය | **11,518,178** | **4,761,375** | **4,454,204** | **23,533** | **14,870,260** | **3,204,894** | **6,821,409** | **4,649,022** | **4,500,100** | **54,802,975** |

# භාණ්ඩ පරීක්ෂණ අංශය

**හැඳින්වීම**

රට තුළට ආනයනය කරනු ලබන මුහුදු භාණ්ඩ ඒවා අදාල ආනයනකරුට නිදහස් කිරීමට පෙර රේගු අරමුණු උදෙසා පරීක්ෂා කිරීම භාණ්ඩ පරීක්ෂණ අංශයේ ප්‍රධාන වගකීම වේ. ආනයනය කරන ලද භාණ්ඩ මත නිවැරදි ආදායම් අයකර ගෙන ඇති බවට තහවුරු කර ගැනීම සඳහා සහ රේගු ආඥා පනත සහ අනෙකුත් අදාළ නීති මඟින් පනවා ඇති සීමා කිරීම් සහ තහනම් කිරීම් වලට අතිශයින් අනුකූලව කටයුතු කර ඇති බවට ද තහවුරු කිරීම සඳහා තාක්ෂණය සහ භෞතික වලංගුතාවය භාවිතා කරමින් සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි. මෙම ක්‍රියාවලිය තුල නීතානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම මෙම අංශයේ මූලික වගකීම වේ.

ගෘහස්ථ භාවිතය සඳහා, ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්ත පදනම් කරගත් අපනයන සඳහා සහ අපනයන සැලසුම් සඳහා තාවකාලිකව ආනයනය කරනු ලබන භාණ්ඩ මෙන්ම රේගු බන්දිත යෝජනා ක්‍රමය මුහුදු භාණ්ඩ පරීක්ෂණ විෂය පථය තුලින් ආවරණය කරනු ලබයි පූර්ණ භාණ්ඩ තොග සහිත බහාලුම්, අඩු භාණ්ඩ තොග සහිත බහාලුම්, වෙන් කරන ලද තොග සහිත බහාලුම් ආකාරයෙන් මුහුදු භාණ්ඩ ගෙන එනු ලබයි. පූර්ණ බහාලුම් තුල අර්ධ අවදානම් හා ඉහල අවදානම් භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා වරායෙන් පිටත ග්‍රේ ලයින් 1 සහ ග්‍රේ ලයින් II වශයෙන් බහාලුම් අංගන 02 ක් ක්‍රියාත්මක වන අතර, අඩු අවදානම් භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා රැන්ක් බහාලුම් පරියන්තය නමින් 03 වන පරියන්ත අංගනය ක්‍රියාත්මක වේ. අඩු භාණ්ඩ සහිත බහාලුම් වරායෙන් පිටත පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන දෙකක දී වරායෙන් පිටත පිහිටා ඇති එක් ගුදමක පරීක්ෂාවට ලක්කරනු ලබයි. ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන එහෙත් නිදහස් වෙළඳ කලාප වලින් පිටත පිහිටා ඇති ආයතන විසින් ආනයනය කරනු ලබන පූර්ණ භාණ්ඩ සහිත බහාලුම් පරීක්ෂා කිරීම සඳහා මධ්‍යම සතෝක්ෂණ පර්යන්තය යනුවෙන් හැඳින්වෙන වෙනම අංගනයක් ක්‍රියාත්මක වේ. එක්රේ ස්කෑන් යන්ත්‍ර 02 ක් එනම් එකක් වරාය තුළ සහ අනෙක් ස්කෑන් යන්ත්‍රය රැන්ක් බහාලුම් පරියන්තයෙහි ක්‍රියාත්මක වේ.

ප්‍රධාන කාර්යයන්:

1. ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනයේ නිරවැදිතාවය තවදුරටත් සතෝක්ෂණය කිරීම සඳහා සියලුම ආනයන රේගු සටහන්කර පරීක්ෂා කර බැලීම.
2. විවිධ පරීක්ෂණ මට්ටම් යටතේ විවිධ පරීක්ෂණ අංගන වලදී පරීක්ෂා කිරීම සඳහා භාණ්ඩ යොමු කිරීම.
3. භාණ්ඩ පරීක්ෂා කිරීමේ දී හා නිදහස් කිරීමේ දී භාණ්ඩ වර්ණීය ක්‍රමවේදය පදනම් කරගත් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම.
4. භාණ්ඩ ප්‍රකාශණයට දැන දැනම අනුකූල නොවීමට කටයුතු කිරීම, හසුකර ගැනීම හා වලක්වා ගැනීම සඳහා භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම.
5. අයවිය යුතු ආදායම් එකතු කිරීම තහවුරු කිරීම සඳහා ඉලක්කගත භාණ්ඩ තොග භෞතිකව පරීක්ෂා කිරීම.
6. සීමා කරන ලද හා තහනම් කරන ලද භාණ්ඩ සංචලනය පිළිබඳ අනෙකුත් දේශ සීමා පාලන නීති රීති අදාළ කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා භාණ්ඩ පරීක්ෂා කිරීම.
7. සැඟවීම් සහ ප්‍රකාශ නොකළ භාණ්ඩ හසුකර ගැනීම මෙන්ම කඩිනමින් නිෂ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීමේ මෙවලමක් වශයෙන් එක්රේ ස්කෑන් යන්ත්‍ර භාවිතා කිරීම.

## පොදු භාණ්ඩ

| | | | |
|---|---|---|---|
| **1** | ලියාපදිංචි කළ රේගු සටහන්කර සංඛ්‍යාව | | **293,051** |
| **2** | පරීක්ෂණ වර්ගය | | |
| | පරීක්ෂා කිරීමට ලක්විය | 163,151 | |
| | විස්තර සහිත | 11,791 | |
| | ඉහළ අවධානම් සහිත | 3,221 | |
| | පරීක්ෂා කළයුතු භාණ්ඩ | 6,588 | |
| | ආයෝජන මණ්ඩල | 100,025 | |
| | අනිකුත් | 8,275 | |
| **3** | ලියාපදිංචි කළ බහාලුම් සංඛ්‍යාව (FCL) | | 273,636 |
| | හරිත මාර්ගය ඔස්සේ නිදහස් කරන ලද බහාලුම් සංඛ්‍යාව | | |
| | අඩු අවධානම් භාණ්ඩ | | 122,807 |
| | රැන්ක් බහාලුම් පර්යන්ත පරීක්ෂණ ස්ථානය(RCT) | | 14,393 |
| | කණ්ඩායම් වශයෙන් ගොස් පරීක්ෂා කිරීම් | | 108,389 |
| | හරිත මාර්ගය ඔස්සේ l | | 25 |
| **4** | ක්‍රියාවලිගතකරන ලද අතිරේක සටහන්කර සංඛ්‍යාව | | 7,550 |
| **5** | අයකර ගැනීම් සංඛ්‍යාව (වටිනාකම) රු. | | 788,869,705 |
| **6** | අයකර ගැනීම් සංඛ්‍යාව (අනිකුත්) රු. | | 229,188,963 |
| **7** | හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | | 30 |
| **8** | අයකරගනු ලැබූ දඩ රු. | | 48,711,394 |
| **9** | රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම | | 53,741,206 |
| **10** | අතිකාල අයකරගැනීම් | | 18,989,896 |
| **11** | ආරක්ෂිත කාමර ගාස්තු | | 6,400 |
| **12** | මුද්‍රාගාස්තු | | - |

## භාණ්ඩ සතොයක්ෂණ පර්යන්තය හා ආයෝජන පහසුකම් සැලසීමේ ඒකකය

| | භාණ්ඩ සතොයක්ෂණ පර්යන්තය | | ආයෝජන පහසුකම් සැලසීමේ ඒකකය | |
|---|---|---|---|---|
| | ආනයන | අපනයන | ආනයන | අපනයන |
| **රේගු සටහන්කර සංඛ්‍යාව.** | 21,831 | 41,807 | 113 | 1 |
| **බහාලුම් සංඛ්‍යාව** | 32,945 | 17,896 | 30 | - |
| **නිෂ්කාශනය කරන ලද (එල්සීඑල්)සංඛ්‍යාව** | 1,583 | 15,627 | - | - |
| **අයකර ගන්නා ලද අතිරේක සටහන්කර රු.** | 27,164,356 | 6,654,226 | - | - |
| **දඩ සහ රාජසන්තක කිරීම් රු** | 494,778 | - | - | - |
| **රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම (රු)** | - | - | - | - |
| **අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව** | 01 | - | - | - |

# මගී සේවා (කොළඹ) අංශය

**අරමුණු:**

කොළඹ වරායේදී හා මගීන් හා කැටුව නොඑන භාණ්ඩ (UPB) ගබඩාවලදී මගීන් හා වෙනත් සම්බන්ධිත ආයතනවල භාණ්ඩ නිෂ්කාශනයේදී විදේශගත වූවන් හා මව්බිමට නැවත එන අය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඔවුනට කාර්යක්ෂම හා ආචාරශීලි සේවාවක් සැපයීම.

ප්‍රධාන කාර්යයන්

1. රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිෂ්කාශනය පහසු කිරීම
2. ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැලැක්වීම
3. සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
4. UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

**ගමන් මලු සංචලනය 2017 / 2018 සංසන්දනාත්මකව**

| | ගමන් මලු සංඛ්‍යාව 2017 | ගමන් මලු සංඛ්‍යාව 2018 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ) | - | - |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | - | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | - | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 91,781 | 20,969 |
| ලක්සිරිසේවා - කොළඹ | 106,971 | 78,847 |
| ලක්සිරිසේවා – නින්දවූර් | - | 10,852 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 71,756 | 57,120 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | - | 7,435 |
| මිඩ්කෝ | 62,130 | 61,045 |
| ට්‍රයිකෝ-කොළඹ) | 80,734 | 66,615 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | - | 39,781 |
| ට්‍රයිකෝ – ගාල්ල | - | 18,745 |
| CSL- කොළඹ | 85,703 | 64,898 |
| CSL – මහනුවර | - | 310-,088 |
| එකතුව (රු) | 499,075 | 457,395 |

දඩ අයකර ගැනීම් 2017 / 2018 සංසන්දනාත්මකව

| | 2017 | 2018 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ) | 269,999 | 1,338,300 |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | - | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | - | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 6,646,372 | 4,666,214 |
| ලක්සිරිසේවා - කොළඹ | 3,284,339 | 864,990 |
| ලක්සිරිසේවා – නින්දවූර් | - | 118,550 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 2,157,466 | 1,287,887 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | - | 76,972 |
| මිඩ්කෝ | 1,033,235 | 550,089 |
| ට්‍රයිකෝ-කොළඹ) | 1,787,238 | 3,110,159 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | - | 996,800 |
| ට්‍රයිකෝ – ගාල්ල | - | 325,590 |
| CSL- කොළඹ | 2,338,536 | 2,034,345 |
| CSL – මහනුවර | - | 202,528 |
| මත්තල | - | - |
| බ.ජා.ගු | - | 97,993,767 |
| එකතුව රු. | 17,567,185 | 113,566,191 |

අතිකාල අයකරගැනීම් 2017 / 2018 සංසන්දනය කිරීම

| | 2017 | 2018 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ) | - | - |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | - | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | - | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | - | - |
| ලක්සිරිසේවා - කොළඹ | 7,834,686 | 8,606,906 |
| ටරාන්ස්කෝ – වත්තල | 2,157,466 | 4,992,294 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | - | 984,396 |
| මිඩ්කෝ | | 5,671,996 |
| ට්‍රයිකෝ-කොළඹ | 4,916,581 | 5,344,364 |
| ට්‍රයිකෝ – කුරුණෑගල | - | 9,087,150 |
| ට්‍රයිකෝ – ගාල්ල | - | 8,348,520 |
| CSL- කොළඹ | 2,388,536 | 6,995,625 |
| CSL – මහනුවර | - | 7,395,206 |
| බ.ජා.ගු | - | 6,987,455 |
| එකතුව රු. | 23,153,015 | 64,413,912 |

බදු අයකරගැනීම් 2017/2018 සංසන්දනාත්මකව

| | 2017 | 2018 |
|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ)- ආනයනය | 6,230,368 | 27,772,190 |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | - | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | 49,703,647 | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 51,201,175 | 44,643,611 |
| ලක්සිරිසේවා - කොළඹ | 41,288,349 | 37,303,386 |
| ලක්සිරිසේවා – නින්දවූර් | - | 2,870,375 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 42,061,139 | 35,590,859 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | - | 4.361,145 |
| මිඩ්කෝ | 27,846,524 | 26,189,170 |
| ටයිකෝ-කොළඹ | 56,591,639 | 45,144,924 |
| ටයිකෝ – කුරුණෑගල | - | 16,540,245 |
| ටයිකෝ – ගාල්ල | - | 8,601,293 |
| CSL- කොළඹ | 48,569,538 | 56,737,224 |
| CSL – මහනුවර | - | 12,778,117 |
| බ.ජා.ගු | - | 245,579,583 |
| එකතුව රු. | 323,492,379 | 564,112,122 |

කාර්ය සාධනය 2018 (රු.)

| | ගමන්මලු සංඛ්‍යාව | දඩ | අතිකාල | බදු |
|---|---|---|---|---|
| ගමන් බඩු කාර්යාලය (සමූහ)- ආනයනය | - | 1,338,330 | - | 27,772,190 |
| ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය) | - | - | - | - |
| ගමන් බඩු කාර්යාලය (විකුණුම්) | - | - | - | - |
| ගමන් බඩු කාර්යාලය (NNR) | 20,969 | 4,666,214 | - | 44,643,611 |
| ලක්සිරිසේවා - කොළඹ | 78,847 | 864,990 | 8,606,906 | 37,303,386 |
| ලක්සිරිසේවා – නින්දවූර් | 10,852 | 118,550 | - | 2,870,375 |
| ට්‍රාන්ස්කෝ – වත්තල | 57,120 | 1,287,887 | 4,992,294 | 35,590,859 |
| ට්‍රාන්ස්කෝ – දඹුල්ල | 7,435 | 76,972 | 984,396 | 4,361,145 |
| මිඩ්කෝ | 61,045 | 550,089 | 5,671,996 | 26,189,170 |
| ටයිකෝ-කොළඹ | 66,615 | 3,110,159 | 5,344,364 | 45,144,924 |
| ටයිකෝ – කුරුණෑගල | 39,781 | 996,800 | 9,087,150 | 16,540,245 |
| ටයිකෝ – ගාල්ල | 18,745 | 325,590 | 8,348,520 | 8,601,293 |
| CSL- කොළඹ | 64,898 | 2,034,345 | 6,995,625 | 56,737,224 |
| CSL – මහනුවර | 31,088 | 202,528 | 7,395,206 | 12,778,117 |
| බ.ජා.ගු | - | 97,993,767 | 6,987,455 | 245,579,583 |
| එකතුව රු. | **457,395** | **113,566,191** | **64,413,912** | **564,112,122** |

2018 වර්ෂයේදී ගමන් බඩු අංශයේ සම්පූර්ණ අයකර ගැනීම්

| | **2018(Rs)** |
|---|---|
| **ගමන් බඩු කාර්යාලය (සමූහ)- ආනයනය** | 35,648,090 |
| **ගමන් බඩු කාර්යාලය ((සමූහ)- – අපනයනය** | 1,706,900 |
| **ගමන් බඩු කාර්යාලය (කවුන්ටරය)** | - |
| **ගමන් බඩු කාර්යාලය (විකුණුම්)** | - |
| **ගමන් බඩු කාර්යාලය (NNR)** | 49,329,175 |
| **ලක්සිරිසේවා - කොළඹ** | 47,008,432 |
| **ලක්සිරිසේවා – නින්දවූර්** | 3,041,739 |
| **ට්‍රාන්ස්කෝ – වත්තල** | 42,091,739 |
| **ට්‍රාන්ස්කෝ – දඹුල්ල** | 5,465,578 |
| **මිඩ්කෝ** | 32,620,655 |
| **ට්‍රයිකෝ-කොළඹ** | 53,939,047 |
| **ට්‍රයිකෝ – කුරුණෑගල** | 26,702,045 |
| **ට්‍රයිකෝ – ගාල්ල** | 17,458,053 |
| **CSL- කොළඹ** | 66,086,594 |
| **CSL – මහනුවර** | 20,404,251 |
| **බ.ජා.ගු** | 345,113,655 |
| **එකතුව රු.** | **755,615,454** |

# අපනයන අංශය

### හැඳින්වීම

අපනයන අංශය එහි ක්‍රියාපරිපාටීන් සරල කිරීම තුලින් මෙන්ම අපනයන රේගු ප්‍රකාශන විද්‍යුත් ක්‍රමය හඳුන්වා දීම මගින් නිත්‍යානුකූල අන්තර්ජාතික භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර, ඍජු අපනයන හා ප්‍රතිඅපනයන නිෂ්කාශනය කිරීමේ කටයුතුවලට පහසුකම් සලසාලයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

1. මෙම අංශය, වරාය මගින් හා ගුවන් මගින් කරනු ලබන අපනයන සම්බන්ධව සියලු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම.
2. මෙරටින් අපනයනය කරනු ලබන සියලුම භාණ්ඩ පිළිබඳව වන සෑම කරුණක් සම්බන්ධවම ක්‍රියා කිරීම.
3. අපනයන භාණ්ඩ රේගු අවශ්‍යතා සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා පරික්ෂා කිරීම.
4. අපනයන බදු, සෙස් බදු, රාජ්‍යභාග සියලු අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් අය කිරීම.
5. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බහාලුම් රඳවා තබන ස්ථාන කළමනාකරණය.
6. බහු දේශ ඒකාබද්ධ තොග ගබඩා ( Multi County Consolidation Warehouses) පවත්වාගෙන යාම.
7. Carnet ක්‍රමය යටතේ තාවකාලික ආනයන/අපනයන පහසු කරවීම.
8. ආපසු ගෙවීම් ඉල්ලීම් අනුමත කිරීම.
9. නැව්ගත කිරීමේ සහතික නිකුත් කිරීම.
10. තීරුබදු ප්‍රතිදාන ලේඛන සහතික කිරීම.
11. නිදහස් ප්‍රතිඅපනයන සහතික ලියාපදිංචිය.
12. මූලික නිතිරීතිවලට අදාළව වෙළඳ දෙපාර්තමේන්තුව නැව්ගත කිරීම සහතික කිරීම.
13. ප්‍රතිනැව්ගත කිරීම් කටයුතු පහසු කරලීම.
14. ජාතික වෙළඳ සංඛ්‍යා ලේඛන සැපයීම.
15. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම
16. පුද්ගලික අංශය, රාජ්‍ය ආයතන ඇතුළුව සියලු පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය ගොඩ නැගීම.
17. සියලු ව්‍යාපාරික ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය නිරන්තරයෙන් වර්ධනය කෙරෙන ආකාරයට පද්ධති හා ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගීම.
18. අපනයන වෙළඳාම පහසු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ආකාරයට භාවිතයට ගැනීම .

### අපනයන ආදායම 2018

| | අපනයන කාර්යාලය EFC, සහ CFS අංගනවල ආදායම (රු.) | ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය (KTEX1) (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| අපනයන තීරුබදු | 121,173,458 | | 121,173,458 |
| අපනයන සංවර්ධන මණ්ඩල සෙස් | 888,495,116 | 65,383 | 888,560,499 |
| සෙස් - රබර් | 637,635 | | 637,635 |
| සෙස් - තේ | 227,953,584 | | 227,953,584 |
| තේ වෛද්‍ය ආධාර සෙස් | 1,122,259 | | 1,122,259 |
| සෙස් - පොල් | 72,038,887 | | 72,038,887 |
| පරීක්ෂණ ගාස්තු | 5,970,100 | 18,111,866 | 24,081,966 |
| බාහිර පරීක්ෂණ ගාස්තු | 402,000 | 2,147,203 | 2,549,203 |
| රාජ්‍ය භාගය | 43,808 | | 43,808 |
| • ආනයන බදු (1/10) | 14,224,206 | | 14,224,206 |
| • වරාය හා ගුවන් තොටුපල බද්ද (1/10) | 28,677,222 | | 28,677,222 |
| අනෙකුත් | 11,534,006 | | 11,534,006 |
| සංශෝධන ගාස්තු, සංශෝධන දඩ සහ අවලංගු කිරීමේ ගාස්තු | 4,376,529 | 4,258,426 | 8,634,955 |
| දඩ සහ තවදුරටත් රාජසන්තක කිරීම් | | | - |
| අතිකාල ගාස්තු | 34,113,701 | 3,496,060 | 37,609,761 |
| නැව්ගත කිරීමේ සහතික ගාස්තු | 161,000 | | 161,000 |
| පරිගණක ගාස්තු | 15,462,150 | 1,264,950 | 16,727,100 |
| එකතුව | **1,426,385,661** | **29,343,888** | **1,455,729,549** |

* ප්‍රතිඅපනයනය කරන අවස්ථාවේදී අයකර ගන්නා ලදි.

# <u>කාර්ය සාධන වාර්තාව - 2018</u>

**01. ඉදිරිපත් කරන ලද හා අවසන් කරන ලද රේගු ප්‍රකාශන සංඛ්‍යාව**

**I.** අපනයන කාර්යාලය

| | | |
|---|---|---|
| අ. මුදල් | - 70,519 | |
| ආ. ජංගම ගිණුම | - 15,305 | |
| **උප එකතුව** | **- 85,824** | |

**II.** **ගුවන් භාණ්ඩ**

| | | |
|---|---|---|
| අ. මුදල් | - 78,034 | |
| ආ. ජංගම ගිණුම | - 4,942 | |
| **උප එකතුව** | **- 82,976** | |
| **III.** ශ්‍රී ලාංකික භාණ්ඩ තොග | - 2,228 | |
| **එකතුව** | | **- 168,800** |

**02. සමූහ අයදුම්පත්**

පරීක්ෂණ සංඛ්‍යාව - **7,304**

**03. එකතු කරන ලද පරීක්ෂණ ගාස්තු**

| | |
|---|---|
| අපනයන කාර්යාලය | - රු. 5,970,100/- |
| ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය | -රු. 20,259,069/- |
| ශ්‍රී ලාංකික භාණ්ඩ කාර්යාලය | -රු. 402,000/- |
| **එකතුව** | **-රු. *26,631,169/-*** |

**04. එකතු කරන ලද පරිගණක ගාස්තු**

| | |
|---|---|
| අපනයන කාර්යාලය | -රු. 15,462,150/- |
| ගුවන් භාණ්ඩ අපනයන කාර්යාලය | -රු. 893,950/- |
| ශ්‍රී ලාංකික භාණ්ඩ කාර්යාලය | -රු. 371,000/- |
| **එකතුව** | **-රු. *16,727,100/-*** |

**05. එකතු කරන ලද අපනයන බදු**

| | | |
|---|---|---|
| අපනයන බදු | -රු. 121,173,458/- | |
| රාජ්‍ය භාගය | -රු. 43,808/- | |
| සෙස් අ) EEC - අපනයනය සංවර්ධන සෙස් | | -රු. 888,560,499/- |
| ආ) CC1 - පොල් සංවර්ධන අධිකාරියේ සෙස් | | -රු. . 72,038,887/- |
| ඇ) TC1 - තේ මණ්ඩලයේ සෙස් | | -රු. 227,953,584/- |
| ඇ) TC2 - තේ වෛද්‍ය ආධාර සෙස් | | -රු. 1,122,259/- |

| | |
|---|---|
| ඉ) RC1 - රබර් සෙස් | -රු. 637,365/- |
| ඊ) RC4 - රබර් වෛද්‍ය ආධාර සෙස් | -රු. - |
| උ) ආනයන තීරුබදු (1/10) | -රු. 14,224,206/- |
| ඌ) වරාය හා ගුවන් සේවා | -රු. 28,677,222/- |
| එ) වෙනත් | -රු. . 11,534,006/- |
| **එකතුව** | -රු. ***1,365,965,564/-*** |

**06. අතිකාල ගෙවීම්**

| | |
|---|---|
| අපනයන කාර්යාලය | -රු. 429,661/- |
| ගුවන් භාණ්ඩ | -රු. 34,520,060/- |
| CFS අංගන | -රු. 15,879,250/- |
| ශ්‍රී ලාංකික භාණ්ඩ | -රු. 446,000/- |
| අපනයන පහසුකම් සැලසීම් මධ්‍යස්ථානය (EFC) | -රු. 17,804,790/- |
| **එකතුව** | -රු. . **69,079,761/-** |

**07. ජංගම ගිණුම්**

| | | |
|---|---|---|
| i. | ජංගම ගිණුම් හිමිකරුවන්ගේ සංඛ්‍යාව | - 47 |
| ii. | සක්‍රීය ජංගම ගිණුම් සංඛ්‍යාව | - 47 |
| iii. | කාල පරාසය තුළදී තැන්පතු ප්‍රමාණය | -රු. 1,338,091,343/- |
| iv. | කාල පරාසය තුළදී ගිණුමෙන් අඩුවූ ප්‍රමාණය | -රු. 1,485,485,635/- |
| **08.** | **ඉල්ලීම මත නිකුත් කළ FRIC සංඛ්‍යාව** | **- 1064** |

| | | |
|---|---|---|
| **09.** | **නිකුත් කරන ලද නැව් සහතික සංඛ්‍යාව** | **- 644** |
| **10.** | **නැව් සහතික කිරීමේ ගාස්තු එකතුව** | -රු. **161,000/-** |

**11. අය කරගන්නා ලද නැව්/ගුවන් යානා/ සංශෝධන දඩ/සංශෝධන ගාස්තු සහ අවලංගු කිරීමේ ගාස්තු**

| | |
|---|---|
| අපනයන කාර්යාලය | -රු. 894,250/- |
| ගුවන් භාණ්ඩ | -රු. 4,256,426/- |
| ශ්‍රී ලාංකික භාණ්ඩ කාර්යාලය | -රු. 2,000/- |
| අපනයන පහසුකම් සැලසීම් මධ්‍යස්ථානය (EFC) | -රු. 3,482,279/- |
| **එකතුව** | -රු. **8,634,955/-** |

| | | |
|---|---|---|
| **12.** | **ප්‍රතිනැව්ගත කිරීම** | |
| | මුළු තැන්පතු සංඛ්‍යාව (බහාලුම්) | - 1,184,462 |
| | නැවත නැව්ගත කරන ලද බහාලුම් සංඛ්‍යාව | - 1,717,805 |
| **13.** | **රේගු වැරදි සඳහා අයකරගනු ලැබූ දඩ** | **-** |
| **14.** | **අපනයනය කරන ලද මුළු බහාලුම් සංඛ්‍යාව** | **- 173,774** |

# සහාය සේවා පරිෂදය

# ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

**හැඳින්වීම**

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර්ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.:

1. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කරුණු වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම හා එම ප්‍රතිපත්ති අදාළ අංශයන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම, එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීමට හා අනුගත වීම සඳහා දැනුම් දීම.
2. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට,
   (i) ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සහ
   (ii) එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතුවලට සහාය වීම;
3. තීරුබදු උපාය මාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැනගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.
4. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙනයාම සහතික වීම, සියලුම තීරුබදු සම්බන්ධ විමසුම්වලට අවශ්‍ය කටයුතු කිරීම, තීරුබදු සම්බන්ධ ආරවුල් නිරාකරණය කිරීම.
5. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
6. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව ලෝක රේගු සංවිධානයේදී හා එහි ප්‍රාදේශීය සංවිධානවලදී හා අනෙකුත් අන්තර්ජාතික සංවිධාන (ලෝක රේගු සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධානවලදී නියෝජනය කිරීම.
7. දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කරගනු පිණිස ලෝක රේගු සංවිධානයේ නිර්දේශ හා සාර්ථක අත්දැකීම් ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම මගින් එම සංවිධානයේ කටයුතුවලට අනුගත වීම.

**ප්‍රධාන කාර්යයන්:**

1. මහා භාණ්ඩාගාරය විසින් දක්වන තීරු බදු ප්‍රතිපත්ති තීරණ දෙපාර්තමේන්තු නියෝග (DOPL) මගින් ක්‍රියාත්මක කිරීම.
2. දෙපාර්තමේන්තු නියෝග මගින් රේගු ප්‍රතිපත්ති තීරණ දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ආනයන තීරුබදු මාර්ගෝපදේශය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙනයාම
4. මහජනතාවගේ මෙන්ම කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ජාතික තීරුබදු නාමාවලිය, පොත් හා සංයුක්ත තැටි යන දෙයාකාරයෙන්ම ප්‍රකාශයට පත් කිරීම.
5. තීරුබදු ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යයේදී අවශ්‍ය විට සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ ක්‍රමය තුළ ජාතික උප අංශ නිර්මාණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට සහාය වීම.
6. දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
7. ඒ ඒ අංශයෙහි ප්‍රගතිය සමාලෝචනය කරමින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
8. ලෝක රේගු සංවිධානය (WCO), WCO ආසියා පැසිපික් කලාප කාර්යාලය, ලෝක වෙළඳ සංවිධානය (WTO) අනෙකුත් අන්තර්ජාතික සංවිධාන හා රේගු සංවිධානයන්හි සම්බන්ධීකරණ කේන්ද්‍රය ලෙස කටයුතු කිරීම.
9. අනෙකුත් රේගු පරිපාලන ආයතනයන් සමඟ රේගු ආයතන හා අන්‍යෝන්‍ය පරිපාලන සහාය ගිවිසුම්වලට අදාල කරුණු සම්බන්ධ කටයුතු කිරීම.
10. වරණීය වෙළඳ ගිවිසුම් (PTAs) සහ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) සම්බන්ධ කටයුතු සඳහා සහභාගීවීම.
11. නාමකරණ කමිටුව, වෙළඳ පහසුකම් සැපයීමේ කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව යන කමිටුවල ලේකම් කටයුතු සඳහා සහභාගිවීම සහ අනෙකුත් තාක්ෂණ කමිටුවල සම්බන්ධීකරණ කටයුතු.
12. තීරුබදු, වෙළඳ හා නිෂ්කාශන පිළිවෙත් ආදියට අදාල කරුණු සම්බන්ධව පර්යේෂණ කටයුතුවල යෙදීම.
13. කාර්ය පටිපාටි සංග්‍රහය පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම.
14. විනිමය අනුපාත දැන්වීම් පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.
15. මහජන සම්බන්ධතා කටයුතු සහ රේගු තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධ කාර්යයන් කිරීම.
16. වාර්ෂික සමරනු ලබන ලෝක රේගු දිනය සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

## රේගු තීරුබදු නාමාවලිය
අන්තර්ජාතික වෙළඳාම මත පනවා ඇති සියලු බදු රැස් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා රේගුව වෙත පැවරී ඇත. 2017 වර්ෂය තුළ ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් රේගුව විසින් ආනයන බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද, ආනයන සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු මගින් ආදායම් රැස්කර ඇත. සමහර අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් අපනයන බදු හා අපනයන සෙස් බදු ගෙවිය යුතුවේ. මීට අමතරව ශ්‍රී ලංකාව හා ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඇති කරගත් රටවල නිෂ්පාදන භාණ්ඩ සඳහා අදාළ වන වරණීය සහ වරණීය තීරුබදු අනුපාත තෝරා ගත් භාණ්ඩවලට පනවා ඇත. භාණ්ඩ සඳහා අයවියයුතු රේගු බදු හා බදු අනුපාත තනි පොතකට අන්තර්ගත කරමින් රේගු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික තීරුබදු නාමාවලියක් එළිදැක්වීමට කටයුතු යොදා ඇත.

## ජාතික උප අංශ (NSD)
අයවැය යෝජනාවලට ඇතුළත් කළයුතු සංයෝජිත වෙළඳ භාණ්ඩ විස්තර හා සංකේතාංක ක්‍රමයට අදාළ ජාතික උප අංශ පිළිබඳ යෝජනා ශ්‍රී ලංකා රේගුව විසින් වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තු වෙත ඉදිරිපත් කරනු ලබයි.

## දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ
ප්‍රතිපත්තිමය තීරණයක් සන්නිවේදනය කිරීමට අවශ්‍ය වූ විට දෙපාර්තමේන්තුමය චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එමෙන්ම පවත්නා ක්‍රියාපරිපාටීන්හි වෙනසක් සිදු වූ විටද, නව ක්‍රියාපරිපාටි හඳුන්වාදීමට අවශ්‍ය වූ විටද, එසේ නැතහොත් ක්‍රියාපරිපාටි අත්පොතෙහි වෙනසක් සිදු වූ විටද මේ ආකාරයට දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තු චක්‍රලේඛ වැදගත් නිල ප්‍රවෘත්ති මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරයි. අදාළ අංශයන්හි ප්‍රතිපත්ති පිළිබඳ සංකල්ප බිහිවන අතර ඒවා ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට යොමු කෙරේ.

අන්තර්ගතය පවත්නා චක්‍රලේඛ සමඟ අන්තර්ගතය හා ක්‍රියාපටිපාටි සසඳා නොගැලපීම් ඇත්දැයි පරීක්ෂා කොට අවසාන වශයෙන් එහි පෙළ සකස් කෙරේ. ඉන්පසු එම චක්‍රලේඛය නිල ස්වරූපයක් දරන අතර නියමිත ආකෘතියට අනුව සැකසේ. එය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කිරීමෙන් පසුව මුද්‍රණය කොට කාර්ය මණ්ඩලය අතර බෙදා හැරේ.

ආදායම් ආරක්ෂණ නියෝග තවත් චක්‍රලේඛ විශේෂයක් වන මෙමගින් බදු හා අය බදුවල වෙනස්කම් සන්නිවේදනය කරනු ලබන අතර, එමගින් නිලධාරීන්ට ඒවා බලාත්මක වන දිනයේ හා වේලාවේ සිටම නව අනුපාතයන්ට අනුව ආදායම් රැස්කරගැනීමට ඉඩ ලැබේ. මෙකී වෙනස්කම් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් වන අතර මෙම නියෝග බදුකරණයේදී අත්‍යවශ්‍ය කොටසක් ඉටු කරනු ලබයි.

## හුවමාරු අනුපාත චක්‍රලේඛ
බැංකු සහ මුදල් හුවමාරු කරන ආයතන භාවිතා කරන්නා වූ නිරන්තරයෙන්ම විචලනය වන (පාවෙන) විනිමය අනුපාතික වෙනුවට, ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති පරිදි ලංකා රේගුව භාවිතා කරන්නේ එක් වැඩකරන සතියක කාලයක් සඳහා අදාළ කරගත හැකි සාමාන්‍ය විනිමය අනුපාතියකි. සියළුම රේගු බදු මෙන්ම අනෙකුත් අය කිරීම් (235 අධිකාරිය) යටතේ ගෙවියයුතු අනෙකුත් සියළුම ගාස්තු, දඩ සහ අහිමි කිරීම් ගෙවීම සඳහා අදාල වන මෙම හුවමාරු අනුපාතය තීරණය කරනු ලබන්නේ රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වන අතර, එය සෑම සිකුරාදාවකම ප්‍රකාශයට පත් කර ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසින් රේගු ප්‍රකාශන (CusDec) සම්බන්ධයෙන් කටයුතු කරන සියළුම ඒකකවලට සහ රේගු වෙබ් අඩවියේ පල කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය වෙත බෙදා හරනු ලැබේ. මෙම චක්‍රලේඛය සියළුම නිලධාරීන්ට මෙන්ම වෙළඳුන්ට ද අත්‍යාවශ්‍ය මාර්ගෝපදේශයකි.

## ජාත්‍යන්තර මට්ටමේ කටයුතු
රේගුව සම්බන්ධ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වගකීම ද දරනු ලබන්නේ ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසිනි. රේගුවේ ජාත්‍යන්තර මට්ටමේ කටයුතු ශක්තිමත් කිරීම හා වඩාත් හොඳින් කළමනාකරණය කරගැනීමේ අදහස ඇතිව රේගු ජාත්‍යන්තර කටයුතු අංශය පිහිටුවා ඇත. ලෝක රේගු සංවිධානය හා එහි ආසියා පැසිෆික් කලාප කාර්යාලය, විදෙස් රටවල රේගු පරිපාලන ආයතන සහ අදාළ වන අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමඟින් රේගුව සම්බන්ධ ජාත්‍යන්තර කටයුතු පිළිබඳව සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කරමින් ඔවුන්ට රේගුව සමඟින් සම්බන්ධ විය හැකි කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම එහි කාර්යභාරයට ඇතුළත් වේ. ලෝක රේගු සංවිධානයෙන් නිරන්තරයෙන්ම විවිධ කරුණු පිළිබඳ සන්නිවේදනය කරන අතර මෙම අංශය මගින් ඊට නිසි ප්‍රතිචාර දක්වනු ලැබේ. වර්ගීකරණය පිළිබඳව වන ආරවුලක්, ලංකා රේගුවට නිරාකරණය කරගැනීමට නොහැකි වුවහොත් එමගින් එය ලෝක රේගු සංවිධානයට යොමු කරනු ලැබේ. සම්බන්ධීකරණය කරන ලද සංයෝජිත නාමකරණ ක්‍රමවේදයෙහි (Harmonized System Nomenclature) සිදුකර ඇති වෙනස්කම් පිළිබඳව ලෝක රේගු සංවිධානයෙන් දැනුම් දෙන අතර, ඒවා මෙම අංශය මගින් පිළිගනු ලැබේ. ඊට අමතරව, ද්වි පාර්ශවික සහ බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් සහ රේගු සහයෝගීතා ගිවිසුම් සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම් හා සම්බන්ධ කටයුතු සිදුකරන්නේ ද ප්‍රතිපත්ති, සැලසුම්කරණ සහ පර්යේෂණ අංශය විසින් වේ. ශ්‍රීලංකාව, තායිලන්තය, වියට්නාමය සහ නේපාලය සමගින් ද්විපාර්ශවික ගිවිසුම් තුනක් අත්සන් තබා ඇත.

2018 වර්ෂය තුළදී නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග

| දෙපා:නියෝග අංකය | දිනය | අදාල වන්නේ | විෂයය |
|---|---|---|---|
| 1205B | **2018.01.10** | නිෂ්පාදන බදු | දෝෂ ඉවත් කිරීම, දෙ.නියෝග 1205 |
| 1196A | **2018.01.10** | සෙස් (ආනයන) | දෝෂ ඉවත් කිරීම, දෙ.නියෝග 1196 |
| 1207 | **2018.01.10** | අපනයන | අපනයන වෙලඳ සාම්පල්වල උපරිම වටිනාකම් සීමාව සංශෝධනය කිරීම. |
| 1208 | **2018.01.12** | එකතු කළ අගය මත බදු (වැට්) | වැට් බදු නිදහස් කිරීම - HS 8704.22.51 |
| 1209 | **2018.01.18** | විශේ.වෙළ.භා.බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1210 | **2018.02.01** | විශේ.වෙළ.භා.බද්ද | තිරිඟු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද. |
| 1211 | **2018.02.02** | අත්හිටුවීම | සී./ස. එම්/එස්. ඒ ස්ටාර් ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනය සඳහා රේගු පහසුකම් අත්හිටුවීම. |
| 1212 | **2018.02.15** | CIU | ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලය (nCEN) |
| 1213 | **2018.02.16** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1192E | **2018.02.16** | නිෂ්පාදන බදු | දෙ.නියෝග 1192 සංශෝධන |
| 1192F | **2018.02.16** | නිෂ්පාදන බදු | දෙ.නියෝග 1192 සංශෝධන |
| 1214 | **2018.02.16** | අපනයන | අපනයන වෙලඳ සාම්පල්වල වටිනාකම් සහ ප්‍රමාණාත්මක සීමාවන් |
| 1215 | **2018.02.21** | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු නිවේදන 07/2018 |
| 1216 | **2018.02.23** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | අර්තාපල් මත විශේ.වෙළ.භා.බද්ද |
| 1211 A | **2018.03.05** | ප්‍රතිස්ථාපනය | සී./ස. එම්/එස්. ඒ ස්ටාර් ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනය සඳහා රේගු පහසුකම් ප්‍රතිස්ථාපනය. |
| 1217 | **2018.03.08** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1218 | **2018.03.19** | ආදායම් ආ.නි.RPO | ආදායම් ආරක්ෂණ නියෝග 01/2018 |
| 1219 | **2018.03.19** | විශේ.වෙළ.භා.බද්ද | උඳු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම. |
| 1220 | **2018.03.21** | තොරතුරු සංනිවේදන තාක්ෂණය | ආසිකුඩා බහාලුම් අවසර පත්‍රය ස්වංක්‍රීය කිරීම. |
| 1018 F | **2018.04.02** | ජා.ඖ.නි.අ.(NMRA) | ඖෂධ ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීම සහ ජා.ඖ.නි.අ. හි ලියාපදිංචි කිරීම. |
| 1221 | **2018.04.02** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |

| | | | |
|---|---|---|---|
| 1222 | **2018.04.03** | අත්හිටුවීම | එම්/එස්. එම්.වයි.ඩී. ඔටෝ ට්‍රේඩිං සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම. |
| 1223 | **2018.04.04** | CCED | බහාලුම්ගත භාණ්ඩ කඩිනමින් නිශ්කාෂනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා වන කමිටුව. (FCL) |
| 749 E | **2018.04.06** | තක්සේරු කිරීම | තක්සේරු කිරීමේ කමිටුව |
| 562 H | **2018.04.06** | නාමකරණ හා වර්ගී කරන කමිටුව | නාමකරණ හා වර්ගී කරන කමිටුව |
| 1191 A | **2018.04.06** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | දෙ.නියෝග 1191 සංශෝධන |
| 1224 | **2018.04.09** | ව.හා ගු. සං. බද්ද | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද |
| 1201 B | **2018.04.11** | ව.හා ගු. සං. බද්ද | දෙ.නියෝග 1201 සංශෝධන |
| 1225 | **2018.04.12** | නිෂ්පාදන බදු | **1989 අංක 13 දරණ** නිෂ්පාදන බදු **(**විශේෂ විධිවිධාන**)** පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1226 | **2018.04.18** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 02/2018 |
| 1227 | **2018.04.19** | පරිපාලන | අභියාචන කමිටුව |
| 1228 | **2018.04.23** | අපනයන සෙස් බද්ද | කේන්ද්‍ර ආපසාරී යන්ත්‍රය (Cetrifuged Latex) මත ආනයන සෙස් බදු ගණනය කිරීම. |
| 1229 | **2018.04.24** | නිෂ්පාදන බදු | **1989 අංක 13 දරණ** නිෂ්පාදන බදු **(**විශේෂ විධිවිධාන**)** පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1230 | **2018.04.26** | ජා.ඖ.නි.අ.(NMRA) | ලියාපදිංචි සහතිකය ඉවත්කර ගැනීම. |
| 1231 | **2018.04.26.** | ජා.ඖ.නි.අ.(NMRA) | ලියාපදිංචි සහතිකය ඉවත්කර ගැනීම. |
| 1232 | **2018.04.26** | ජා.ඖ.නි.අ.(NMRA) | ලියාපදිංචි සහතිකය ඉවත්කර ගැනීම. |
| 1233 | **2018.04.26** | ජා.ඖ.නි.අ.(NMRA) | ලියාපදිංචි සහතිකය ඉවත්කර ගැනීම. |
| 1234 | **2018.05.01** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 03/2018 |
| 1235 | **2018.05.02** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1236 | **2018.05.03** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 04/2018 |
| 1212A | **2018.05.08** | CIU | ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලය ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් |
| 1237 | **2018.05.08** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1238 | **2018.05.09** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | පරිප්පු මතවිශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1239 | **2018.05.16** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 05/2018 |
| 1240 | **2018.05.16** | තීරුබදු ඉවත් කිරීම | පෙට්‍රල් ඩීසල් තීරුබදු නිදහස් කිරීම। |

| | | | |
|---|---|---|---|
| 1241 | **2018.05.16** | නිෂ්පාදන බදු | **1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1242 | **2018.05.22** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේ.වෙළ.භාණ්ඩ බද්ද |
| 1243 | **2018.05.28** | අත්හිටුවීම | සී./ස. ෆාගෝ ස්පෙලෙන්ඩිඩ් ආයතනය සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම. |
| 1244 | **2018.05.30** | | ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ ආනයනය කිරීම. |
| 1245 | **2018.05.31** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | බොර තෙල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද. |
| 1246 | **2018.05.01** | නිෂ්පාදන බදු | **1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1240A | **2018.06.04** | තීරු බදු ඉවත් කිරීම. | **2018.05.10** සහ **2018.05.16** අතර කාලය තුලදී ආනයනය කරන ලද පෙට්‍රල් හා ඩීසල් මත පනවන ලද ආනයන බදු අයකර ගැනීම. |
| 1192G | **2018.06.08** | නිෂ්පාදන බදු | **1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1247 | **2018.06.14** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද. |
| 1048B | **2018.06.14** | පාලන | මෙහෙයුම් උපදෙස් - ටින් මාලු |
| 1246A | **2018.06.14** | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු |
| 1215A | **2018.06.18** | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු ආඥා පනත යටතේ නිෂ්පාදන බදු අංක:.10/2018 |
| 1248 | **2018.07.09** | පාලන | විද්‍යුත් වෙළඳ ප්‍රතිපත්තිය මත පාරිභෝගික ගණුදෙනු අදාල ව්‍යාපාරික කටයුතු (B2C) පාලනය කිරීම සඳහා රේගු ආඥා පනතේ (අධිකාරිය **235)** නියෝග යටතේ ගැසට් නිවේදනය.. |
| 1249 | **2018.07.06** | ආසිකුඩා | කේ.ටී.අයි.එම්.**2** කාර්යාලයේ ආනයනය භාණ්ඩ ස්වයංක්‍රීය කරණ ක්‍රියාවලිය |
| 1250 | **2018.07.06** | ආසිකුඩා | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල(Bia), මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල (Mria), කොළඹ වරාය, මාගම රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය (Mrmrp), ගාල්ල වරාය සහ ත්‍රිකුණාමලය වරාය යන ස්ථානයන්හි වලංගු මුදල් ප්‍රකාශයට පත්කිරීම. |
| 1251 | **2018.07.11** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 05/2018 |
| 1201C | **2018.07.11** | ව.භා ගු. සං. බද්ද | සංශෝධන-දෙපාර්තමේන්තු නියෝග |

| | | | |
|---|---|---|---|
| | | | 1201 -වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද |
| 1252 | **2018.07.13** | පාලන | අතිකාල රාජකාරී කාලය තුල අධීක්ෂණ නිලධාරීන් විසින් කොළඹ වරාය සහ තදාසන්න ප්‍රදේශ, කටුනායක ගුවන් භාණ්ඩ පරීක්ෂාවට ලක්කිරීම. |
| 1253 | **2018.07.17** | නිෂ්පාදන බදු | **1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1254 | **2018.07.18** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1192H | **2018.07.19** | නිෂ්පාදන බදු | **1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1255 | **2018.07.19** | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය। | අනිවාර්ය ආනයන පරීක්ෂණ ක්‍රියාමාර්ගය උදෙසා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරවල සංශෝධන - ආහාර හා ආහාර නොවන ද්‍රව්‍යයන්. |
| 1234A | **2018.07.19** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 06/2018 |
| 1256 | **2018.07.31** | ජාතිය ගොඩනැගීමේ බද්ද | **2018** අංක **20** දරණ ජාතිය ගොඩනැගීමේ (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම. |
| 1043 C | **2018.07.27** | අපනයන සෙස් බද්ද | තේ මත අපනයන සෙස් බද්ද. |
| 1253 A | **2018.07.26** | නිෂ්පාදන බදු | දෝෂ ඉවත් කිරීම - දෙපාර්තමේන්තු නියෝග 1253<br>**1989** අංක **13** දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පලකරන ලද ගැසට් නිවේදනය |
| 1192 I | **2018.07.31** | නිෂ්පාදන බදු | මෝටර් වාහන මත නිෂ්පාදන බදු |
| 1192 J | **2018.08.01** | නිෂ්පාදන බදු | සිගරට් මත නිෂ්පාදන බදු |
| 1257 | **2018.08.01** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | මත්ස්‍යයන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1258 | **2018.08.09** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | ඉරුඟු මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1192 K | **2018.08.10** | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග 1192 I සංශෝධන - මෝටර් වාහන මත නිෂ්පාදන බදු |
| 1259 | **2018.08.10** | බැඳුම්කර | බන්ධිත ගුදම් ක්‍රියාපටිපාටිය |
| 1260 | | දෙපාර්තමේන්තු නියෝග නිකුත් නොකරන ලදී. | |
| 1261 | **2018.08.15** | ධීවර | ධීවර කර්මාන්තයට අදාළ විද්‍යුත් උපකරණ ආනයනය |
| 1262 | **2018.08.16** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | සීනි මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |

| | | | |
|---|---|---|---|
| 1263 | **2018.08.21** | පාලන | වාහන සඳහා විමෝචන ප්‍රමිති පිළිබඳ මෙහෙයුම් උපදෙස් සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග/ ප්‍රමිති |
| 1264 | **2018.08.16** | එකතු කළ අගය මත බදු | එකතු කළ අගය මත බදු නිදහස් කිරීම ඉවත් කිරීම. |
| 1265 | **2018.08.25** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | බොර තෙල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1266 | **2018.09.07** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 1217-සංශෝධන - මැකරල්, මෑ ඇට, කඩල සහ බීජ |
| 1222A | **2018.09.06** | අත්හිටවීම ඉවත් කිරීම | එම්.වයි.ඩී. ඔටෝ ට්‍රේඩිං ආයතනය සඳහා වූ රේගු පහසුකම් අත්හිටුවීම ඉවත් කරන ලෙස ඉල්ලීම |
| 1267 | **2018.09.12** | වෙළඳ භාණ්ඩ වර්ගීකරණය | අභ්‍යන්තර වර්ගීකරණ උපදෙස් සඳහා නව ආකෘතියක් හඳුන්වා දීම. |
| 1262A | **2018.09.18** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කිරීම (සීනි) |
| 1268 | **2018.09.18** | නිෂ්පාදන බදු | සීනි මත නිෂ්පාදන බද්ද |
| 1220 A | **2018.09.18** | නව බහාලුම් පර්යන්ත ගේට්ටුව | නව බහාලුම් පර්යන්ත ගේට්ටුවෙහි ක්‍රියාපරිපාටිය |
| 1269 | **2018.09.18** | එකතු කළ අගය මත බදු | සීනි වලට අදාල වන එකතු කළ අගය මත බදු සංශෝධනය |
| 1270 | **2018.09.17** | එකතු කළ අගය මත බදු | රෙදි පිළි මත **5%** එකතු කළ අගය මත බදු |
| 1271 | **2018.09.19** | තීරුබදු අත්හැර දැමීම | සීනි මත පොදුවේ රේගු බදු අත්හැර දැමීම. |
| 1272 | **2018.09.19** | තීරුබදු අත්හැර දැමීම | කිරි පිටි මත පොදුවේ රේගු බදු අත්හැර දැමීම. |
| 1196B | **2018.09.26** | සෙස් බද්ද | සනීපාරක්ෂක තුවා මත ආනයන සෙස් බද්ද |
| 1273 | **2018.10.01** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | මත්ස්‍යයන් සහ අනෙකුත් ද්‍රව්‍ය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1274 | **2018.10.01** | අතිකාල | **50%** කින් අතිකාල වැඩිකිරීමේ දෙපාර්තමේන්තු නියෝගය. |
| 1275 | **2018.10.01** | පාලන | අර්ධ බහාලුම් භාණ්ඩ (LCL) සඳහා අභ්‍යන්තර නිශ්කාෂණ මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා රෙගුලාසි |
| 1276 | **2018.10.03** | තීරුබදු අත්හැර දැමීම. | කිරි පිටි මත පොදුවේ බදු අත්හැර දැමීම. |
| 1277 | **2018.10.08** | පාලන | පූර්වගමය රසායනික ද්‍රව්‍ය ( Precursor Chemicals) සහ ඒවායෙහි අධීක්ෂණ යාන්ත්‍රණය |
| 1278 | **2018.10.09** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය අංක:.08/2018 |
| 1279 | **2018.10.09** | නිෂ්පාදන බදු | පාම් තෙල් මේද අම්ල මත නිෂ්පාදන බදු |
| 1280 | **2018.10.04** | ESC | ESC සංසෝධනය - මෝටර් වාහන |

| | | | |
|---|---|---|---|
| 1281 | **2018.10.05** | එකතු කළ අගය මත බදු | සංයෝජිත සංකේතාංක 8705.90.21 එකතු කළ අගය මත බදු අතහැර දැමීම. |
| 1282 | **2018.10.17** | තීරුබදු අත්හැර දැමීම. | කිරි පිටි මත පොදුවේ රේගු බදු අත්හැර දැමීම. |
| 1196C | **2018.10.18** | සෙස් බද්ද (අපනයන) | රෙදිපිලි මත සෙස් බද්ද |
| 1283 | **2018.10.16** | තීරුබදු අත්හැර දැමීම. | සීනි මත පොදුවේ රේගු බදු අත්හැර දැමීම. |
| 1283A | **2018.10.26** | තීරුබදු අත්හැර දැමීම. | සීනි මත පොදුවේ රේගු බදු අත්හැර දැමීම. |
| 1284 | **2018.11.02** | නිෂ්පාදන බදු | පෙට්‍රල් මත නිෂ්පාදන බදු |
| 1285 | **2018.11.01** | එකතු කළ අගය මත බදු | දැව මත එකතු කල අගය මත බද්ද |
| 1286 | **2018.11.01** | එකතු කළ අගය මත බදු | රෙදිපිලි මත සෙස් බද්ද |
| 1287 | **2018.11.02** | තීරුබදු අත්හැර දැමීම. | තිරිඟු ධාන්‍ය හා පෙට්‍රල් මත තීරුබදු අතහැර දැමීම. |
| 1288 | **2018.11.02** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | සීනි, පරිප්පු සහ කඩල මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1289 | **2018.11.02** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | ලොකු එණු සහ අර්තාපල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1290 | **2018.11.08** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | හාල්මැස්සන්, පෙයාස්, කිව් පලතුරු යනාදිය මත විශේෂ වෙළඳ සේවා බද්ද |
| 1291 | **2018.11.12** | නිෂ්පාදන බදු | පාන වර්ග මත නිෂ්පාදන බදු |
| 1292 | **2018.11.16** | ආදායම් ආ. නි. | ආදායම් ආරක්ෂණ නියෝගය 09/2018 |
| 1293 | **2018.11.16** | තීරුබදු අත්හැර දැමීම. | පෙට්‍රල් සඳහා වන තීරුබදු අතහැර දැමීම. |
| 1294 | **2018.11.20** | තීරුබදු අත්හැර දැමීම | ඩීසල් සඳහා වන තීරුබදු අතහැර දැමීම. |
| 1295 | **2018.11.24** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | කඩල මත විශේෂ වෙළ භාණ්ඩ බද්ද |
| 1296 | **2018.12.03** | විශේ.වෙළ.භාණ්ඩ බද්ද | ලොකු එණු සහ අර්තාපල් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1297 | **2018.12.04** | නිෂ්පාදන බදු | පාන වර්ග මත නිෂ්පාදන බදු |
| 1298 | **2018.12.06** | අත්හිටුවීම | සී/ස. එම්.එස්. චම්රෝ වෝටර්ස් (පුද්ගලික) සමාගම සඳහා වන රේගු පහසුකම් අත්හිටුවීම. |
| 1299 | **2018.12.06** | විදේශ විනිමය අංකය | විදේශ විනිමය පදනම් අංකය යටතේ අපනයනය කරනු ලබන භාණ්ඩ. |
| 1300 | **2018.12.31** | වාහන හිමිකම් බද්ද | වාහන හිමිකම් බද්ද |

විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂයය ලිපිගොනු

| දිනය | ලිපිගොනු අංකය | විස්තරය |
|---|---|---|
| **08/01/2018** | PL786 | ජාත්‍යන්තර රේගු දිනය - 2018 |
| **30/01/2018** | PL787 | 2017 විවරණ සටහන් බෙදා හැරීම |
| **2018/02/07** | PL788 | දේශසීමා නිෂ්පාදන ඇගයීම් කමිටුව |
| | PL789 | ඉහළ තාක්ෂණයෙන් යුත් ස්වයංක්‍රීය යන්ත්‍ර සහ උපකරණ ආනයනය සඳහා වන වරාය හා ගුවන් සේවා බද්දෙන් 75% ක් අත්හැරීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩලය පත්කළ කමිටුව. |
| | PL790 | කොලොන් සහ සුවඳ විලවුන් සඳහා පිරිවිතර පිළිබඳව ක්‍රියාකාරී කමිටු රැස්වීම. |
| | PL791 | බේසල් සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික විශේෂඥ කමිටුව |
| | PL792 | ආලේපන ඇගයීම් උප කමිටුව |
| **28/02/2018** | PL793 | ආදායම් වාර්තාව |
| **02/03/2018** | PL794 | කාල මිදැවුම් අධ්‍යයනය (TRS) 2018 |
| **16/03/2018** | PL795 | බහාලුම් ප්‍රවාහනය පිළිබඳ කමිටුව |
| **18/05/2018** | PL796 | ජාත්‍යන්තර සහන ආධාර පිළිබඳ ප්‍රමිති මෙහෙයුම් ක්‍රියාපටිපාටිය(SOP) |
| **22/05/2018** | PL797 | ආදායම් කළමනාකරණය සහ මුල්‍ය ප්‍රවාහය විශ්ලේෂණය පිළිබඳ කමිටුව |
| **20/06/2018** | PL798 | සංයෝජිත වර්ගීකරණ අංකය39012000 යටතේ ඉහල ඝණත්වයකින් යුත් පොලිඑතලීන්(HPDE) ආනයනය කිරීම සීමාකිරීම. |
| **21/06/2018** | PL799 | ප්‍රතිසංස්කරණ උපාය මාර්ගට අදාළ රේගු පරිපාලනය හා උපදෙස් පිළිබඳ ඉහළ මට්ටමේ තක්සේරුව සඳහා වන IKF මෙහෙවර. |
| **24/07/2018** | PL800 | කාර්ය සාධන වාර්තාව - 2017 |
| **25/07/2018** | PL801 | ඕසෝන් ඉස්තරයට හානිකරන ද්‍රව්‍ය පිළිබඳව මොන්ට්‍රියල් කෙටුම්පත. |
| **01/08/2018** | PL802 | සංයෝජිත වර්ගීකරණ සම්බන්ධයෙන් ලෝක රේගු සංවිධානය සමඟ ලිපිගණුදෙනු කිරීම. |
| **09/08/2018** | PL803 | අභ්‍යන්තර නිශ්කාෂණ මධ්‍යස්ථානයක් ඇතිකිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව. |
| **02/08/2018** | PL804 | ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු පිවිසුම |
| | PL805 | ශ්‍රී ලංකා රේගුවේ විමර්ශණ කාර්යාලයක් ස්ථාපනය කිරීම. |
| **08/11/2018** | PL806 | ක්‍රියාත්මක නොකිරීමේ සහතික නිකුත් කිරීම. දෙපාර්තමේන්තු නියෝග 1051-2016/01/14 හි සඳහන් 2016/01/01 දිනැති අංක 1947/49 දරණ ගැසට් නිවේදනයේ තාක්ෂණික වෙනස්කම්. |
| **06/12/2018** | PL807 | ජාත්‍යන්තර රේගු දිනය - 2019 |

**ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය විසින් සංවිධානය කරන ලද වැඩසටහන්**

1. ජාත්‍යන්තර රේගු දිනය සැමරීම
2. ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම පහසු කිරීමේ ගිවිසුම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
3. ලෝක වෙළඳ සංවිධානයේ කාල මිදැවුම් අධ්‍යයනය සඳහා මූලාරම්භක වැඩසටහන්

**ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අංශය**

විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂයය ලිපිගොනු

| | |
|---|---|
| **PP&R/CIAD/01/2018** | **යුරෝපා සංගමය - ඒකාබද්ධ කොමිෂන් සභාව** |
| **PP&R/CIAD/02/2018** | තානාපති තැපැල් කාර්යාලයක් ස්ථාපනය කිරීම - කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය |
| **PP&R/CIAD/03/2018** | එක්සත් ජනපද ආරක්ෂක මණ්ඩල යෝජනා |
| **PP&R/CIAD/04/2018** | 7 වන දකුණු ආසියාතික උප කළාපීය ආර්ථික සහයෝගිතා රේගු උපකමිටුව |
| **PP&R/CIAD/05/2018** | දකුණු ආසියාතික උප කළාපීය ආර්ථික සහයෝගිතා රේගු උපකමිටුවේ ඒකාබද්ධ නිලධාරීන් සහ ක්‍රියාකාරී කණ්ඩායම |
| **PP&R/CIAD/06/2018** | දකුණු ආසියාතික උප කළාපීය ආර්ථික සහයෝගිතා රේගු උපකමිටුව - විවිධ |
| **PP&R/CIAD/07/2018** | ජාත්‍යන්තර සෞඛ්‍ය නියමයන් (2005)ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මක් ඇති කිරීම සඳහා වූ වැඩමුළුව. |
| **PP&R/CIAD/08/2018** | උතුරු කොරියාවට අදාල එක්සත් ජාතීන්ගේ විධායක කමිටුවේ නියෝග |
| **PP&R/CIAD/09/2018** | ආර්ථික සහයෝගිතාවය සඳහා වූ ශ්‍රී ලංකා ඉරාන ඒකාබද්ද කොමිෂම |
| **PP&R/CIAD/10/2018** | පුද්ගලයින් නීතිවිරෝධීව ප්‍රවාහනය කිරීමේ අපරාධ වළැක්වීම සහ මැඩපැවැත්වීම සඳහා වන සහයෝගිතාවය පිළිබඳ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම. |
| **PP&R/CIAD/11/2018** | ප්‍රවේශණය වීම් පිලිබඳ ලෝක රේගු සංවිධානයේ ක්‍රියාකාරී කණ්ඩායම. |
| | ඍකියා වර්ධනය සඳහා කලාපීය කාර්යාලය - ඉන්දියාව සමඟ කටයුතු කිරීම. |
| **PP&R/CIAD/13/2018** | ගෝලීය ආරක්ෂණ වැඩසටහන(PGS) |

# අනුගතවීමේ සහ පහසුකම් සැලසීමේ අංශය

**හැඳින්වීම**

පශ්චාත් නිෂ්කාශන විගණනය යනු රේගු භාරයෙන් භාණ්ඩ නිදහස් කිරීමෙන් පසුව ඉටුකරනු ලබන රේගු පාලන පදනම් කරගත් විගණනය අදහස් කෙරේ.

ලෝක වෙළඳ සංවිධානයේ තක්සේරු කිරීමේ ගිවිසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම උදෙසා පහසුකම් සැලසීම පිණිස තක්සේරු අංශය යටතේ 2010 වර්ෂයේදී පශ්චාත් නිෂ්කාශන සහ විගණන ශාඛාව (PCAB) ස්ථාපිත කරන ලදී. පශ්චාත් විගණන හා නැව් භාර ලේඛණ ඒකකය (PAMU) සහ විගණන සහ පරීක්ෂණ ශාඛාව (A & ID) අන්තර්ග්‍රහණය කරමින් මෙම ශාඛාව ස්ථාපිත කරන ලදී.

2010 වර්ෂය අග භාගයේදී රේගු ප්‍රතිසංස්කරණ හා නවීකරණ වැඩ සටහන යටතේ නව සංවිධාන ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමත් සමග, තක්සේරු අංශය යටතේ ක්‍රියාත්මකවූ පශ්චාත් නිෂ්කාශන සහ විගණන අංශය, නීති බලාත්මක කිරීමේ පර්ෂදය තුළ රේගු අධ්‍යක්ෂකවරයෙකු යටතේ උත්ශ්‍රේණිගත කර පශ්චාත් නිෂ්කාශන විගණන අංශය (PCA) වශයෙන් හඳුන්වන ලදී. රේගු නිෂ්කාශන ක්‍රියාවලියේදී නිෂ්කාශන රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කරන වෙළඳුන්ට පහසුකම් සැලසීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන සහ ප්‍රමාද දෝෂ සහ වංචා පලනය කිරීම සඳහා රේගුව තුළ අවදානම් කළමනාකරණ ඒකකයක් (RMU) ස්ථාපිත කරමින් දැනට පවත්නා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීමට තීරණය කර ඇත. රේගු නිෂ්කාශන ක්‍රියාවලියේ වැඩසටහන්වලට පහසුකම් සැලසීම උදෙසා අවදානම් කළමනාකරණ මූලධර්ම සහ අනුකූලතා දැක්වීමේ මිනුම් ක්‍රියාත්මක කිරීම මෙන්ම ක්‍රියාපටිපාටි හඳුන්වා දීම, වෙළඳ ප්‍රජාව අතර අනුකූලව ක්‍රියාකිරීමේ මට්ටම වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය ලබාදෙන ඉතා වැදගත් සාධක බවට හඳුනා ගනිමින් පශ්චාත් නිෂ්කාශන විගණනය සහ අවදානම් විගණන කාර්යයන් සහය සේවා පර්ෂදය තුල එක අංශයක් ලෙස ගෙන ඒමට තීරණය කරන ලදී.

දෙපාර්තමේන්තු නියෝග 883 ට ((DOPL) අනුව 2013 සැප්තැම්බර් 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි "අනුගත වීමේ සහ පහසුකම් සැලසීමේ අංශය" වශයෙන් හැඳින්වෙන මෙම අංශය යටතේ ශාඛා දෙකක් වශයෙන් පශ්චාත් විගණන අංශය හා අවදානම් කළමනාකරණ අංශය ක්‍රියාත්මක වේ



**අනුගත වීමේ සහ පහසුකම් සැලසීමේ අංශය** සහ විගණනන අනුකූලතා මට්ටම



# පශ්චාත් නිෂ්කාශන විගණන අංශය

සංශෝධිත කියෝතෝ ගිවිසුම මගින් අර්ථ නිරූපනය කරන පරිදි, පශ්චාත් නිෂ්කාශන විගණනය (PCA) හෝ විගණන පාදක කරගත් පාලනයන් යනු අදාල ව්‍යාපාරිකයන් (පුද්ගලයන්) සතුව ඇති පොත්පත්, වාර්තා, ව්‍යාපාර ක්‍රමවේද සහ වාණිජ දත්ත පරීක්ෂා කිරීම මගින් රේගු ප්‍රකාශනවල නිරවද්‍යතාවය සහ නීත්‍යානුකූලභාවය පිළිබඳව රේගුව සෑහීමකට පත්වනු ලබන මිනුම් ක්‍රම/ක්‍රියාමාර්ගවේ. අතිශයින් ගනුදෙනු පදනම් කරගත් පාලන පරිසරයක සිට වඩා ශක්තිමත් විගණනය පදනම් කරගත් පරිපාලනයක් දක්වා ගමන් කිරීම මගින් බහුවිධ ස්ථරවලදී අවදානම් පාදක කරගත් පාලන ප්‍රවේශයක් යොදා ගැනීමට පශ්චාත් නිෂ්කාශන විගණනය රේගුවට ඉඩකඩ සලසන බැවින්, එය රේගුවට මෙන්ම අනෙකුත් දේශසීමා නියාමන අධිකාරීන් සඳහා ද ඉතා වැදගත් පාලන ක්‍රමවේදයක් වේ. භෞතික පරීක්ෂණය, වටිනාකම, භාණ්ඩවල ප්‍රභවය සහ වර්ගීකරණය සාම්පල සත්‍යාපනය කිරීම, බලපත්‍ර, අවසරපත්‍ර සත්‍යාපනය කිරීම යනාදිය වැනි දේශ සීමාව හරහා ගමන් කරන අවස්ථාවේදී යොදාගනු ලබන පාලන ක්‍රම ගනුදෙනු පදනම් කරගත් පාලන ක්‍රම වේ.
( මූලාශය: ලෝක රේගු සංවිධානය)

භාණ්ඩ හා ව්‍යාපාරිකයන් පිළිබඳ අවදානම් විශ්ලේෂණය මත තෝරාගත් ඉලක්කගත මෙහෙයුම්කරුවන් කෙරෙහි අවධානය යොමු කරමින්, හෝ වාර්ෂික විගණන වැඩසටහන් යටතේ දක්වා ඇති විධිමත් සැලසුම්ගත ක්‍රමයක් මගින් එක් එක් සිද්ධිය පදනම් කර ගනිමින් පශ්චාත් නිෂ්කාශන විගණනයන් සිදුකළ හැකිය. එසේම ආර්ථිකය මෙහෙයවන්නන් හට අවශ්‍ය විශේෂ පිළියම් සැපයීමේ නිර්නායකයන් වශයෙන් ද විගණනය භාවිතා කළ හැකිය.

පහත සඳහන් දෑ පශ්චාත් නිෂ්කාශන විගණන අංශයේ මූලික අරමුණු වශයෙන් සලකනු ලැබිය හැකිය.

(අ) පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූලභාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම.
(ආ) වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස විගණනලාභීන්ට නිර්දේශ ලබා දීම
(ඇ) විගණනලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම
(ඈ) අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

### පශ්චාත් නිෂ්කාශන විගණනය යටතේ පරීක්ෂා කළයුතු අයිතම

ආනයන ප්‍රකාශනයක් සඳහා අවශ්‍ය වන පහත වගුවේ දක්වා ඇති සෑම අයිතමයක්ම නිෂ්කාශන විගණනය මගින් පරීක්ෂා කළහැකි වේ.

| බදු මූල්‍ය සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණය සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| • වටිනාකම<br>• ප්‍රමාණය<br>• මුදල් වර්ගය<br>• විනිමය අනුපාත | • වර්ගීකරණය<br>• සාමාන්‍ය බදු අනුපාත<br>• වරණීය බදු අනුපාත | • නිදහස් කිරීම් යුක්ති සාධන ප්‍රමාණය<br>• බදු ගණනය කිරීමේ නිරවද්‍යතාව ය | • සීමා කිරීම්<br>• තහනම් කිරීම්<br>• ආනයන බලපත්‍ර<br>• IPR<br>• CITES<br>• රාජ්‍ය භාගය<br>• විනිමය පාලන |

ඉහත දැක්වෙන අයිතම පශ්චාත් නිෂ්කාශන විගණනයට පෙර, නිෂ්කාශන අවස්ථාවේ දී සහ/හෝ නිෂ්කාශනයට පෙර අවස්ථාවලදී රේගු පරීක්ෂාවට ලක් කළ හැකි බව සැලකිය යුතුය. අනවශ්‍ය ද්විකරණයන් වැලැක්වීම සඳහා පශ්චාත් නිෂ්කාශන විගණනයේ ප්‍රවේශය සාමාන්‍ය රේගු පරීක්ෂාවට (පූර්ව නිෂ්කාශන සත්‍යාපනය) වඩා වෙනස් වියයුතු අතර, පශ්චාත් නිෂ්කාශන විගණනය එහි යහගුණය වැඩි කිරීමත්, දුර්ගුණය අවම කරගැනීමත් සඳහා සිදුකරනු ලබයි. රේගු නිෂ්කාශනයේ ලියකියවිලි පරීක්ෂාවට ලක් කිරීමට පශ්චාත් නිෂ්කාශන විගණන නිලධාරීන්ට බලය පැවරෙනවා පමණක් නොව විගණන පරිශ්‍රයේදී ගිණුම් පොත්, වාර්තා හා අදාල පොත්පත් ද පරීක්ෂාවට ලක්කළ හැකිය.

2018 වර්ෂයේ කාර්ය සාධනය

| | 2018 |
|---|---|
| වසර තුළ ලියාපදිංචි කරන ලද විගණන සංඛ්‍යාව | 160 |
| වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | 102 |
| අවසන් කරන ලද (කලින් වසරේ ලියාපදිංචි සංඛ්‍යාව ඇතුලුව) පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | 61 |
| පශ්චාත් විගණන සිද්ධි මගින් සොයාගත් වැරදි සංඛ්‍යාව සහ නියම කළ රාජසන්තක කිරීම් /දඩ | 61 |
| අය කර ගන්නා මුළු රාජසන්තක කළ /දඩ මුදල් ප්‍රමාණය (රු.) | 604,850,139 |
| භාණ්ඩ විකිණීමෙන් එකතු කරගත් මුළු මුදල (රු.) | - |
| අතිරේක සටහන් කර ලෙස එකතු කරගත් මුළු මුදල (රු.) | 56,653,753 |
| අයකරගත් මුළු මුදල (රු.) | 661,503,892 |

**2016, 2017සහ 2018 වර්ෂ තුළ කාර්ය සාධනය**

| | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සංඛ්‍යාව | 103 | 112 | 102 |
| අවසන් කරන ලද (කලින් වසරේ ලියාපදිංචි සංඛාව ඇතුලුව) පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | 77 | 54 | 61 |
| විගණන සිද්ධි මගින් සොයාගත් රාජසන්තක කිරීම් /දඩ | 69 | 48 | 61 |
| අය කර ගන්නා මුළු දඩ මුදල් ප්‍රමාණය | 938,538,574 | 1,120,608,249 | 604,850,139 |
| තහනම් කරන ලද භාණ්ඩවල මුළු වටිනාකම | NIL | NIL | NIL |
| අතිරේක සටහන් කර ලෙස එකතු කරගත් මුළු මුදල (රු.) | 61,512,281 | 894,548 | 56,653,753 |
| අය කරගත් මුළු මුදල (රු.) | 1,000,050,855 | 1,121,502,797 | 661,503,892 |

**1) විගණන ප්‍රගතිය**

| වර්ෂය | සිදුකරන ලද විගණන සංඛ්‍යාව |
|---|---|
| **2016** | 182 |
| **2017** | 175 |
| **2018** | 160 |

**2)**



**2018**

වර්ෂය තුළ පශ්චාත් සිද්ධීන්වල ප්‍රගතිය




**3) විගණන සහ සිද්ධි අතර සංසන්දනය**

| වර්ෂය | සිදුකරන ලද විගණන සංඛ්‍යාව | සිද්ධි සංඛ්‍යාව | % |
|---|---|---|---|
| **2016** | 182 | 103 | 57% |
| **2017** | 175 | 112 | 64% |
| **2018** | 160 | 102 | 64% |



## 4) කාර්යසාධන සංසන්දනය

| වසර | වසර තුළ ලියාපදිංචි කරන ලද පශ්චාත් විගණන සංඛ්‍යාව | අවසන් කරන ලද (කලින් වසරේ ලියාපදිංචි සංඛ්‍යාව ඇතුලුව) පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව | විගණන සිද්ධි මගින් සොයාගත් රාජසන්තක කිරීම් /දඩ |
|---|---|---|---|
| **2016** | 103 | 77 | 69 |
| **2017** | 112 | 54 | 48 |
| **2018** | 102 | 61 | 61 |




## 5). ඉලක්කගත සහ තත්‍ය ආදායම එකතුව

| වර්ෂය | එකතු කළ ආදායම (රු.) |
|---|---|
| **2016** | 1,000,050,855 |
| **2017** | 1,121,502,797 |
| **2018** | 661,503,892 |



6). 2016, 2017 සහ 2018 වර්ෂය තුළ ලියාපදිංචි කළ සහ අවසන් කළ සිද්ධි සංඛ්‍යාව

| වර්ෂය | ලියාපදිංචි කළ සිද්ධි සංඛ්‍යාව (පසුගිය වසරේ ලියාපදිංචි කළ සිද්ධි සංඛ්‍යාව ඇතුළුව) | අවසන් කළ සිද්ධි සංඛ්‍යාව |
|---|---|---|
| **2016** | 103 | 77 |
| **2017** | 112 | 54 |
| **2018** | 102 | 61 |




## ආපසු ගෙවීමේ අංශය

**1) හිමිකම් පෑම් සහ ආපසු ගෙවීම් තත්ත්වය - 2018**

| | අංකය |
|---|---|
| ලියාපදිංචි කළ අයදුම්පත්/හිමිකම් | 219 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 36 |
| ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත්/හිමිකම් | 03 |

**2) ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය- පසුගිය වර්ෂ (2015 සිට 2018)**

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| ලියාපදිංචි කළ අයදුම්පත්/හිමිකම් | 80 | 219 | 163 | 219 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 06 | 39 | 49 | 36 |
| ප්‍රක්ෂේප කරන ලද අයදුම්පත්/හිමිකම් | 01 | 04 | 11 | 03 |

**3)** කාර්යය මණ්ඩලය

| වර්ෂය | නිලධාරී සංඛ්‍යාව (රේ.අ.,නි.රේ.අ., ස.රේ.අ.) |
|---|---|
| 2016 | 38 ((සාමාන්‍යය ) |
| 2017 | 50 (සාමාන්‍යය ) |
| 2018 | 39 (2018.12.31 දිනට) |




## අවදානම් කළමනාකරණ ඒකකය

සැපයුම් දාමයේ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා 2005 වර්ෂයේ SAFE ප්‍රමිති රාමුව ලෝක රේගු සංගමය විසින් සම්මත කරගන්නා ලද අවස්ථාවේදී ලෝකය පුරා ඇති බොහෝ අනෙකුත් රේගු පරිපාලන ආයතන වගේම ශ්‍රී ලංකා රේගුවද ගේවිටු මුරකරන්නාගේ කාර්යභාරය සිට පහසුකම් සපයන්නා දක්වා මෙම මූලික වෙනස්වීම සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සහා දරන ලදි. තාක්ෂණික හැකියාවන් ක්‍රමිකව ඉහළ යාමත් සමඟ සහ සාම්ප්‍රදායික ගේට්ටු මුරකරු ප්‍රවේශය සමඟ ජාත්‍යාන්තර වෙළදාමේ නූතන වර්ථමානයේ ප්‍රමාණය ඉහළ යාමත් සමඟ සාර්ථකව කටයුතු කිරීමට නොහැකි බව අවබෝධ කරගැනීමෙන් අවසානයේ ශ්‍රී ලංකා රේගුව විසින් 2013 වර්ෂයේදී අවධානය කළමනාකරණය සඳහා අනුගතවීමේ සහ පහසුකම් සැලසීමේ අංශය යටතේ වෙනම ඒකකයක් ස්ථාපිත කිරිමට මූලික පියවර ගන්නා ලදි. කෙසේ වුවද දේශපාලන කැමැත්තක් නොමැතිවීම, ප්‍රධාන පාර්ශව කරුවන් සහ නිලධාරී තන්ත්‍රයේ සම්බන්ධීකරණයක් නොමැතිවීම සහ ඒ අවස්ථාවේ පැවති අනවශ්‍ය නීතිරීති මගින් ස්වකීය පරමාර්ථ සාක්සාත් කරගැනීමට සහ සැබෑ හැකියාව ළගාකරගැනිමට එම ඒකකයට ඉඩ නොලැබුණි. ශ්‍රී ලංකා රේගුවේ ප්‍රධානියා වශයෙන් වර්තමාන අධ්‍යක්ෂක ජනරාල් තුමිය වන පී.එස්.එම්. චාර්ල්ස් මැතිණිය විසින් එහි පාලනය භාරගනු ලැබූ අතර, විද්‍යාමාන වන බලාත්මක කිරීමේ සහ පහසුකම් සැපයීමේ නොගැලපෙන සංකල්ප පලදායි ලෙස සමබර කිරීමේ අපහසුතාවය ඇය විසින් අවබෝධ කරගත් අතර පහසුකම් සැපයීමේ සහ පාලනය තුල සමබරතාවයක් ඇති කිරීම සඳහා නවීන රේගු යාන්ත්‍රණයක් වශයෙන් අවදානම් කළමනාකරණය භාවිතා කිරීමෙන් අපේක්ෂිත ලැබීම් ඇයට අවබෝධ විය. එවැනි නිර්භීත අරමුණ ඇතිව

අවදානම් කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් රේගු අංශයක තත්ත්වයට පුලුල් කිරීම සඳහා ඇය විසින් මූලික පියවර ගනු ලැබූ අතර, යහපත් අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීමේ සහ නූතන රේගු භාවිතයන් ශ්‍රී ලංකා රේගුවේ මුඛ්‍ය පරමාර්ථ තුළට අන්තර්ගත කිරීමේ හැකියාව ඇති ඇය විශ්වාස කරන කණ්ඩායමකට ඒ සඳහා ඇය විසින් ආරාධනා කරන ලදී.

මෙම ඒකකය ප්‍රතිව්‍යුහගත කිරීම සහ පුලුල් කිරීම සමඟ ශ්‍රී ලංකා රේගුවේ පරිපාලනය තුල අවධානයම් කළමනාකරණ ඒකකය විසින් අවධානය යොමු කළයුතු ප්‍රධාන මෙහෙයුම් අංශ තුනක් හඳුනාගෙන ඇත.

(i) එක් එක් මූලික ක්‍රියාවලීන් තුළ පවතින ආවේණික අවදානම් හඳුනාගැනීම් සඳහා එක් එක් මූලික රේගු මෙහෙයුම් වලට අදාලව විස්තරාත්මක අවදානම් තක්සේරු කිරීම් සිදුකිරීම සහ ඉන් අනතුරුව නිර්දේශ ඉදිරිපත් කිරීම මෙන්ම අවශ්‍ය නම් එක ක්‍රියාවලි නැවත සැලසුම් කර පරීක්ෂා කිරීම.

(ii) ඉහල සහ අඩු අවදානම් භාණ්ඩ යන දෙවර්ගයම, මගීන් සහ ක්‍රියාකරුවන් (අපනයනකරුවන්, ආනයනකරවන්, රේගු තැරුව්වරුවන්, නියෝජිතයන් සහ අනෙකුත් භාණ්ඩ හා සේවා මෙහෙයුම්කරුවන්) හඳුනාගැනීමේ දී අවදානම් කළමනාකරණ පදනම් කරගත් අනුකූල වීමේ නියමයන් අදාළ කර ගැනීම සහ ස්වකීය අනුකූලතාවය සහ/හෝ අවදානම් මට්ටම පදනම් කරගෙන එවැනි භාණ්ඩ වලට සහ මෙහෙයුම්කරුවන්ට සැලකීම.

(iii) නීතිවිරෝධී රේගු කටයුතු වලට අදාලමෙහෙයුම් වල පවත්නා ප්‍රවණතාවයන් හඳුනාගැනීම සහ එවැනි කටයුතු වැලැක්වීම මෙන්ම එවැනි තත්ත්වයන් ඇතිවීමේ අවදානම් අවම කිරීම. අවදානම් කළමනාකරණ ඒකකයේ ඉහත අංශ තුනක් සහිත මෙහෙවර ප්‍රකාශය පදනම් කරගෙන ප්‍රමුඛතාවය දී ඇති මූලික ක්‍රියාවලීන් රාශියක් මත අවදානම් තක්සේරු කිරීම් සිදුකරනු ලබයි.

## රේගු මෙහෙයුම් අංශවල සවිස්තරාත්මක අවදානම් තක්සේරු කිරීම

### ලිහිල් (LCL) බහාලුම්ගත භාණ්ඩ තොග පිළිබඳ අවදානම් තක්සේරුව

**ලිහිල් (LCL) බහාලුම්ගත භාණ්ඩ තොග** ක්‍රියාවලිය, අනෙකුත් මෙහෙයුම් අංශ හා සංසන්දනය කිරීමේ දී භාණ්ඩ ප්‍රමාණය සහ උපදන වන ආදායම අඩු මට්ටමක පවතින බවට හැඟීයන නිසා ශ්‍රී ලංකා රේගුව විසින් ඉතා ඉහල මට්ටමේ ප්‍රමුඛතාවයක් ලබානොදෙන අංශ වලින් එකක් වේ. කෙසේ වුවද, අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සිදුකරනු ලබන අවස්ථාවේ පවත්නා **ලිහිල් (LCL) බහාලුම්ගත භාණ්ඩ තොග** ක්‍රියාවලිය තුළ ආවේනික ප්‍රධාන ක්‍රියාපටිපාටික දෝෂ තිබෙන බවත්, එවැනි ක්‍රියාපරිපාටික දෝෂ සැලකිය යුතු ලෙස ආදායම් අඩුවීමකට සහ තහනම් කරන ලද සහ සීමා කරන ලද භාණ්ඩ නීති විරෝධීව ප්‍රවාහනය කිරීමටත් පාදක වී ඇති බව හඳුනා ගන්නා ලදී. නිර්දේශ සහිතව සවිස්තරාත්මක වාර්තාවක් සකස් කර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇති අතර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම දැනට සිදුවෙමින් පවතී.

### බන්ධිත මත්පැන් මෙහෙයුම් මත අවදානම් තක්සේරුව.

දැනට කොළඹ වරාය තුළ සහ ඒ ආසන්නයේ බන්ධිත මත්පැන් මෙහෙයුම් ක්‍රම 03 ක් පවතී. එනම්

1. නාවුක කාර්ය මණ්ඩලය සහ නැව් මඟින් පැමිණෙන මගීන්ට බන්දිත මත්පැන් අලෙවි කරන කොළඹ වරාය තුල ක්‍රියාත්මක වන තීරුබදු රහිත වෙළෙඳසැල්. 2. තානාපති දූත මණ්ඩල සහ කාර්ය මණ්ඩලයට බන්දිත මත්පැන් අලෙවි කරන කොළඹ වරායෙන් පිටත ක්‍රියාත්මක වන *STC* තිරුබදු රහිත වෙළඳසැල්. 3. කොළඹ වරායට පැමිණෙන නෞකා

වලට බන්ධිත මත්පැන් අලෙවි කරන නෞකා ගබඩා මෙහෙයුම්;අවධානම් කළමනාකරණ ඒකකය විසින් ඉහත සඳහන් අංශ තුනටම අදාලව සවිස්තරාත්මක තක්සේරුවක් සිදුකරනු ලැබූ අතර එම අධ්‍යයනය සිදුකරනු ලැබූ අවස්ථාවේ දී මෙම මෙහෙයුම් තුළ සිදුවන අකටයුතුකම් විශාල ප්‍රමාණයක් තිබෙන බව හඳුනාගත් අතර, එවැනි අකටයුතුකම් නිසා රුපියල් බිලියන 2.5 කට වඩා වැඩි ප්‍රමාණයක වාර්ෂික ආදායම් අහිමිවීමක් තක්සේරු කර තිබේ. එම අංශවල මෙහෙයුම් රාමුවට අදාලව බොහෝ අක්‍රමිකතා තිබෙන බව ද එම අධ්‍යයනය කාලසීමාව තුලදී නිරීක්ෂණය විය. එමනිසා ඉහත සඳහන් අංශවලට අදාලව සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් අවදානම් කළමනාකරණ ඒකකය විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබූ අතර, දක්වා ඇති මෙහෙයුම් කටයුතු පාලනය කිරීම සඳහා දැඩි නීතිරීති (දෙපාර්තමේන්තු නියෝග) කෙටුම්පත් කරමින් තිබේ. අලුතින් කෙටුම්පත් කරනු ලබන නීතිරෙගුලාසි ක්‍රියාත්මක වනතුරු අකටයුතුකම් අඛණ්ඩව සිදුනොවීමට වගබලා ගැනීම සඳහා අවදානම් කළමනාකරණ ඒකකය විසින් තාවකාලික ක්‍රියාමාර්ග ද ගෙන ඇත.

### ගුවන් භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියට අදාල සවිස්තරාත්මක අවදානම් තක්සේරුව

ගුවන් භාණ්ඩ අපනයන මෙහෙයුම්වලට අදාල ක්‍රියාවලි අනුරූපනය කිරීම සඳහා සහ පවත්නා ක්‍රියාවලිය ආශ්‍රිත ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සඳහා දැනට සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සිදුකරනු ලබයි.

ඉහත ව්‍යාපෘති වලට අමතරව පහත සඳහන් ව්‍යාපෘති වල මූලික සැලසුම් හා ලේඛන අදියරයන් ද සම්පූර්ණ කරනු ලබන අතර, මෙම ව්‍යාපෘති 2019 මැද භාගය වනවිට දියත් කිරීමට සැලසුම් කරනු ලබයි.

### වෙළෙන්දන් සහ නිෂ්කාශන නියෝජිතයන් නැවත ලියාපදිංචි කිරීම සහ වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලින සැලසුම් කර පරීක්ෂා කිරීම.

නව වෙළෙන්දන් හා නිෂ්කාශන නියෝජිතයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ ක්‍රියාපටිපාටික දෝස විශාල ප්‍රමාණයක් තිබෙන බවට දීර්ඝ කාලයක සිට සටහන්ව් ඇති අතර, එවැනි කටයුතු අඛන්ඩව පැවතීම හේතුවෙන් වෙළෙන්දන් හා රේගු තැරැව්කරුවන් පිළිබඳ රේගුව විසින් තබා ගන්නා ලේඛන වාර්තා ඔවුන් පිළිබඳ සටහන් තැබීම සඳහා ප්‍රමාණවත් නොවේ. එමනිසා, ස්වකීය අවධානම් මට්මට තක්සේරුකිරීම සහ ඔවුන් පිළිබඳ තොරතුරු තබාගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ තොරතුරු රැස්කිරීම පිණිස 2009 මුල් භාගය තුළ සියළුම වෙළෙන්දන් සහ රේගු තැරැව්කරුවන් නැවත ලියාපදිංචි කිරීම සිදුකරනු ඇත.

### බලයලත් ආර්ථික මෙහෙයුම් (AEO) වැඩසටහන ආරම්භ කිරීම

2009 මුල්භාගය තුළ පරිපූර්ණ බලයලත් ආර්ථික මෙහෙයුම් වැඩසටහනක් දියත් කිරිමට අවධානම් කළමනාකරණ ඒකකය සැලසුම් කරමින් සිටියි. මෙම වැඩසටහන හඳුන්වා දිමත් සමඟ දැනට පවතින නීතිගරුකව කටයුතු කරන වෙළඳ වැඩසටහන් (සීග්‍රමාර්ග සහ හරිත මාර්ග වැනි) ක්‍රියාත්මක නොවනු ඇති අතර, එකී පහසුකම් බුක්ති විඳින එම වෙළෙන්දන්ට ස්වකීය කැමැත්ත මත සහ සටහන් අවශ්‍යතාවයන් සපුරාලීමට යටත්ව නව වැඩසටහන කෙටුම්පත් කිරිම සඳහා අවස්ථාව ලබාදෙනු ඇත.

අපනයන කරුවන් ආනයන කරුවන් රේගු තැරැව්කරුවන් බන්ධිත තැනැත්තන් සහ අනෙකුත් විවිධ සේවා සපයන්නන්ටද යෝජිත බලයලත් ආර්ථික මෙහෙයුම් **(AEO)** වැඩසටහනට අයදුම් කිරීම සඳහා අවස්ථාව හිමිවනු ඇත. නව බලයලත් ආර්ථික මෙහෙයුම් **(AEO)** වැඩසටහන පාලනය කරන්නා වූ නියාමන රාමුව කෙටුම්පත් කරමින් පවතින අතර, ඒ සඳහා රේගු අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු ඉතා ඉක්මණින් අයදුම්පත් කැඳවනු ඇත.

**පවත්නා වරණීය නිර්නායකයන් නැවත පරීක්ෂා කිරීම සහ භාණ්ඩ පරීක්ෂණ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම.**

භෞතික පරීක්ෂාවට ලක්කරන පවත්නා භාණ්ඩ ප්‍රතිශතය ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන් හා සංසන්දනය කිරීමේ දී අතිශයින් ඉහල අගයක් වන බවට සලකනු ලබන බැවින්, අවසර ඇතුව ඇතුල්වීමේ උසස් පරීක්ෂණ ක්‍රම සහිත ඵලදායී වරණීය නිර්නායක වැඩිවශයෙන් භාවිතා කරමින් භෞතික පරීක්ෂණයට ලක්කෙරෙන භාණ්ඩ ප්‍රතිශතය අඩුකිරීමේ හැකියාව විමසා බලමින් පවත්නා වරණීය නිර්නායකය සහ ඒවායේ ඵලදායිත්වය, දැනට විශ්ලේෂණය කරමින් පවතී.

**අවදානම් කළමනාකරණ ඒකකයේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම**

| ප්‍රධාන ක්‍රියාකාරකම:<br>අවදානම් කළමනාකරණය | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ක්‍රියාමාර්ග | 1 වන කාර්තුව | 2 වන කාර්තාව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
| නව ඉහල අවදානම් සිද්ධි සමුදායන් හඳුනාගැනීම සහ වරණීය නිර්ණායක ක්‍රියාත්මක කිරීම. | X | X | X | X |
| වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තු අධීක්ෂණය කිරීම සහ ඇගයීම. | X | X | X | X |
| වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තු නිතර යාවත් කාලීන කිරීම. | X | X | X | X |
| සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමියන්ගේ අනුකූලතා මට්ටම පරීක්ෂා කිරීම සඳහා විටින් විට විගණනය කිරීම. | X | X | X | X |
| නිර්බාධකව මාර්ග භාණ්ඩ හිමියන්ගේ අනුකූලතා මට්ටම පරීක්ෂා කිරීම සඳහා අහඹු ලෙස ඔවුන්ගේ අනුකූලතා මට්ටම විගණනය කිරීම. | X | X | X | X |
| අලුතින් ලියාපදිංචි වූ භාණ්ඩ හිමියන්ගේ අනුකූලතා මට්ටම පරීක්ෂා කිරීම සඳහා අහඹු පශ්චාත් විගණන සිදුකිරීම. | X | X | X | X |

| ප්‍රධාන ක්‍රියාකාරකම:<br>වෙළඳාම සඳහා පහසුකම් සැලසීම. | | | | |
|---|---|---|---|---|
| ප්‍රධාන ක්‍රියාමාර්ග | 1 වන කාර්තුව | 2 වන කාර්තාව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව |
| සීඝ්‍ර මාර්ග ඉල්ලීම පිළිගැනීම සහ එම ඉල්ලීම් ඇගයීමට ලක්කිරීම. | X | X | X | X |
| සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමිකරුවන්ගේ නාමලේඛණය නිසිපරිදි පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම. | X | X | X | X |
| රේගු ආඥා පනතේ 115 වගන්තිය ප්‍රකාරව අපනයනකරුවන් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම සඳහා TIN/VATලියාපදිංචි ඒකකයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සහ අදාල ලේඛන හොඳින් පරීක්ෂා කර බැලීම. | X | X | X | X |
| ගෝලීය නියැදි වලින් වර්ණීය සංකල්ප සුදුසු සේ සකස් කර ගැනීම. | X | X | X | X |
| ස්වංක්‍රීය වර්ණීයතාවය සඳහා වර්ණීයතා නිර්නායකය හඳුනා ගැනීම. | X | X | X | X |
| ආසිකුඩා ක්‍රමය තුල වර්ණීය නිර්නායකය ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂා කිරීම. | X | X | X | X |
| වර්ණීය නිර්නායක වර්ධනය කිරීම සඳහා පරීක්ෂණ ස්ථාන වලින් ලැබෙන ප්‍රතිචාර යාන්ත්‍රණය අධ්‍යයනය කර ක්‍රියාත්මක කිරීම. | X | X | X | X |
| වර්ණීය නිර්නායකය ඇගයීමට ලක්කිරීම සහ යාවත්කාලීන කිරීම. | X | X | X | X |

2018 වර්ෂය සඳහා අවදානම් කළමනාකරණ ඒකකයේ ක්‍රියාකාරි සැලැස්මේ ප්‍රගතිය

| කාර්යය | ක්‍රියාකාරීත්වය | ප්‍රතිඵලය |
|---|---|---|
| සීග්‍ර මාර්ග වැඩසටහන කළමනාකරණ කිරීම. | නීතිගරුකව කටයුතු කරන ව්‍යාපාරිකයන් හඳුනාගැනීම. | දැනට සමාගම් 206 ක් සීග්‍ර මාර්ග වැඩසටහනේ මෙහෙයුම් සිදුකරයි. රේගු ආඥා පනතට අනුකූලව කටයුතු නොකිරීම නිසා සමාගම් 18 ක සීග්‍ර මාර්ග පහසුකම අවසන් කරනු ලැබ ඇත. |
| | ආයතන වෙත ගොස් බැලීම. | |
| | සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමිකරුවන්ගේ නාමලේඛණයට සමාගම් ඇතුලත් කිරිම හා ඉවත් කිරීම. | |
| වැඩි අවදානම් භාණ්ඩ තේරීම | වැඩි අවදානම් භාණ්ඩ හඳුනා ගැනීම. | ලේඛනයට අමතරව විශ්ලේෂණ දත්තවලින් /මධ්‍යම විමර්ශණ ඒකකයේ (CIU) වාර්තාවලින් සහ අලුතින් ලියාපදිංචි සමාගම් වලින් අඛණ්ඩව සමාලෝචනය සිදුකරනු ලබයි. |
| | RED නිර්නායකය හඳුනා ගැනීම. | |
| | වැඩි අවදානම් භාණ්ඩ සහ RED නිර්නායකය යාවත්කාලීන කිරීම. | |
| ස්වයංක්‍රීය වරණීය වැඩසටහන | ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම | අසාමාන්‍ය අපනයන වශයෙන් අවදානම් සාධක, ආනයනය කරන රට ආදිය සැලකිල්ලට ගන්නා ගනු ලැබූ අතර, එය සාර්ථකනම් සකස් කරන ලද සටහන් තැබීම සඳහා ස්වයංක්‍රීය වරණීය නිර්නායක ක්‍රියාත්මක කරන ලදී. |
| | අවදානම් පරාමිතීන් හඳුනා ගැනීම. | |
| | අවදානම් මට්ටම් සැකසීම. | |
| | සුදුසු පර්යේෂණ දත්ත විශ්ලේෂණය කිරීම. | |
| | පරීක්ෂණ පවත්වාගෙන යාම. | |
| නිර්බාධකව වැඩසටහන කළමනාකරණය කිරීම. | නිර්ණායක ගොඩනැගීම. | සමාගම් 38 ක් නිර්බාධක භාණ නිදහස් කර ගැනීමේ මාර්ග වැඩසටහන තුළ ක්‍රියාත්මක වේ.<br><br>රේගු ආඥා පනතට අනුකූල නොවීම නිසා එක් සමාගම නිර්බාධක භාණ්ඩ නිදහස් කර ගැනීමේ පහසුකම අවසන් කර ගන්නා ලදී.<br><br>ස්වක්‍රීය ආනයන විධි සහ වැරදි සම්බන්ධයෙන් නිර්බාධකව භාණ්ඩ නිදහස් කර ගැනීමේ සමාගම්, අඛණ්ඩව අධීක්ෂණය කිරීම. |
| | සමාගම් හඳුනාගැනිම. | |
| | සමාගම් විශ්ලේෂණය කිරීම. (නිර්බාධක භාණ්ඩ නිදහස් කරගැනීමේ ප්‍රශ්ණාවලිය) | |
| | ආයතන වෙත ගොස් බැලීම/සාධ්‍යතා අධ්‍යයනය. | |
| | සමාගමේ අවදානම් සටහන් යාවත්කාලීන කිරිම. | |

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණු වන්නේ පැය 24 පුරාම නිරන්තරයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමේ කටයුතු හා අන්තර්ජාල සේවාවන් ලබාදිමේදී දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තාක්ෂණ, සේවා සහ පහසුකම් ලබාදීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාවලියගත කිරීම පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමෙන් ඵලදායි හා ප්‍රතිඵලදායි පරිපාලනයක් උදෙසා වේගවත්, ගුණාත්මක සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සහතික කරයි. මෙම අංශය මේ වනවිට වඩාත් ඵලදායි හා බිඳ වැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණ පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන ඊට අදාළ ලේඛන, ඉලෙක්ට්‍රොනිකව ගබඩා කර තබාගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**ප්‍රධාන කාර්යයන්:**

1. ස්වයංක්‍රීයකරණය තුලින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය විම.
2. පද්ධති ජාලය, පරිගණක හා දත්ත පදනම් සාර්ථක ලෙස නඩත්තු කිරීම.
3. රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා පාර්ශවකරුවන්ට අවශ්‍ය වේලාවට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
4. ගෝලීය වැඩි දියුණු කිරීම් වලට සාරානුකූලව ඇගයීම් සිදුකිරීම හා පවත්නා පද්ධති යාවත්කාලීන කිරීම, "ආසිකුඩා" භාණ්ඩ පාලන පද්ධතිය, රථවාහන පාලන පද්ධතිය හා "තිනෙත්" පද්ධතිය
5. අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමග වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම
6. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම හා ඒවායේ මෙහෙයුම් වලට අදාළ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

| මුඛ්‍ය ක්‍රියාකාරකම | තාක්ෂණික ඒකකය |
|---|---|
| **ප්‍රධාන ක්‍රියා මාර්ග** | 2018.12.31 දිනට ඉටුකර ඇති ප්‍රතිශතය % |
| 1. ප්‍රධාන කාර්යාලයෙහි දී ආනයන නෞභාර පත්‍ර සටහන් සැසඳීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම. | 100% සම්පූර්ණයි. |
| 2. ආසිකුඩා පද්ධතියට යොමු කරන භාණ්ඩ ලේඛනවල පරිලෝකන අනුරූප ලබාගැනීම. | පද්ධතිය 100% සූදානම්. නෛතික අනුමැතිය ලැබීමට නියමිතයි. |
| 3. KTIM1 කාර්යාලයේ ස්වංක්‍රීයකරණය සම්පූර්ණ කිරීම. | තොරතුරු සංනිවේදන තාක්ෂණ කොටස 100% සම්පූර්ණයි. |
| 4. කැටුව නොයන භාණ්ඩ අදාල නියමිත නිවෙස් වලට ප්‍රවාහනය කිරීමට පහසුකම් සැලසීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුවේ ජාලයට සම්බන්ධ කිරීම. | ටෙන්ඩරය පිරිනමා ඇත. ඉදිරි කටයුතු සොයා බැලීම සඳහා කමිටුවක් පත්කරන ලදී. |
| 5. පවත්නා THINETH පද්ධතිය ආසිකුඩා ගෝලීය පද්ධතියට මාරුවීම. | සමාගම් මාරුවීම 5% ක් සිදුකර ඇත. (නියමු ව්‍යාපෘතිය) |
| 6. ඩිජිටල් අත්සන් සහිත ලේඛණ රහිත අපනයන වෙළඳාම ක්‍රියාත්මක කිරීම. | පද්ධතිය 100% සූදානම්. නීතිපතිවරයාගේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. |

| | |
|---|---|
| 7. ලේඛණ රහිත අපනයන වෙළදාම ක්‍රියාත්මක කිරීම. | පද්ධතිය 10% සූදානම්. නීතිපතිවරයාගේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. |
| 8. යාවත්කාලීන කරන ලද රේගු තීරුබදු නාමාවලිය ප්‍රසිද්ධ කිරීම. | 100% සම්පූර්ණයි. |
| 9. පරීක්ෂා කිරීම සඳහා අපනයන භාණ්ඩ තේරීම ස්වයංක්‍රියකරණය කිරීම. | අපනයන අංශයෙන් වරණීය නිර්නායකය අපේක්ෂාවෙන් සිටී. |
| 10. අපනයන භාණ්ඩ නැව් බඩු ලේඛනය පද්ධතියට ඇතුලත් කර ගැනීම. | ආසිකුඩා පද්ධතිය 100% සම්පූර්ණයි. CASA සමඟ සාකච්ඡා කිරීම සඳහා රේගු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත යෝජනා ක්‍රම ලබාදී ඇත. |
| 11. PIV විද්‍යුත් ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. | 5% සම්පූර්ණයි. කොළඹ පාර්සල් තැපැල් අංශය තුල ක්‍රියාත්මක කරන ලදී. (නියමු ව්‍යාපෘතිය) |
| 12. ITMIS පද්ධතියට දත්ත සැපයීම. | තොරතුරු සංනිවේදන තාක්ෂණ කොටස 100% සම්පූර්ණයි, අනෙකුත් සටහන් සම්පූර්ණ කිරීමට නියමිතයි. |

| මුඛ්‍ය ක්‍රියාකාරකම : | තොරතුරු සංනිවේදන තාක්ෂණ විමසීම. |
|---|---|
| ප්‍රධාන ක්‍රියා මාර්ග . | 2018/12/31 දිනට ඉටුකරන ලද ප්‍රතිශතය |
| **1.** අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලේඛන පරීක්ෂා කිරීම. | 100% |
| **2.** සියලුම පාර්ශවකරුවන්ට ආසිකුඩා ගෝලීය පද්ධතියට ඇතුල්වීමට ඉඩකඩ සැලසීම. | 100% |
| **3.** ආසිකුඩා ගෝලීය පද්ධතියේ ගැටලු සොයා බලා නිවැරදි කිරීම. (අඩවිය තුළ සහ පිටත) | 100% |
| **4. THINETH** පද්ධතියේ ගැටලු සොයා බලා නිවැරදි කිරීම. | 100% |
| **5.** ආසිකුඩා ගෝලීය පද්ධතියට අදාලව ආධාරක ස්ථාපනය කිරීම. (අඩවිය තුළ සහ පිටත) | 100% |
| **6.** අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන්ගෙන් ලැබෙන පොදු විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම. | 100% |
| **7.** අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් සඳහා වාර්තා සකස් කිරීම. | 100% |
| **8.** වාහන බලපත්‍ර හිමියන් සඳහා රේගු සටහන්කර වල පිටපත් සැපයීම. | 100% |
| **9.** දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ **DMT** දත්ත දාමයට අදාල ගැටළු සොයා බලා නිවැරදි කිරීම. | 100% |
| **10.** බැංකු ප්‍රේෂණ වලට ගැටලු සොයා බලා නිවැරදි කිරීම. | 100% |
| **11.** කොළඹ වරායේ පරියන්ත දත්ත දාමයට අදාල ගැටළු සොයා බලා නිවැරදි කිරීම. | 100% |
| **12.** බැංකු අනුග්‍රාහක පරිගණක වලට අදාල ගැටළු සොයා බලා නිවැරදි කිරීම. | 100% |
| **13.** අනුග්‍රාහක පරිගණක වැඩිදියුණු කිරීම, පවත්නා පද්ධතිය පරීක්ෂා කිරීම යනාදිය වැනි තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් තොරතුරු සංනිවේදන තාක්ෂණික කණ්ඩායමට සහයෝගය දැක්වීම. | 100% |
| **14.** ආධුනිකයින් විශ්ව විද්‍යාල සහ තාක්ෂණික ආයතන වලින් පුහුණු කිරීම. | 2018 දී උපාධි |

| | |
|---|---|
| | අපේක්ෂකයින් දෙදෙනෙක් පුහුණුවෙන ලදී. |
| **15.** ආසිකුඩා ගෝලීය ක්‍රමය භාවිතා කිරීම පිළිබඳව පාර්ශවකරුවන් පුහුණු කිරීම. | 100% |
| **16.** ආසිකුඩා ගෝලීය පද්ධතියේ පරිශීලක දත්ත පද්ධතිය (නිශ්කාෂණ නියෝජිතයන්, බලයලත් භාණ්ඩ ප්‍රවාහනකරුවන් නැව් සමාගම් යනාදිය) පවත්වා ගෙන යාම. | 100% |
| **17.** පාර්ශවකරුවන් සඳහා **VPN** ගිණුම් ලබාදීම සහ අළුත්කිරීම. | 100% |

| මුඛ්‍ය ක්‍රියාකාරකම : | | | විගණන අංශය |
|---|---|---|---|
| රේගු නිලධාරීන්ට සහ ආසිකුඩා ගෝලීය පද්ධතියට සම්බන්ධ අනෙකුත් රජයේ ආයතන වලට පරිශීලකයන්ගේ තොරතුරු සහ මුර පද නිකුත් කිරීම සම්බන්ධයෙන් තොරතුරු සංනිවේදන තාක්ෂණ අංශයේ විගණන ඒකකය වගකිව යුතු වේ.<br><br>එසේම, වැය ශීර්ෂ ගිණුම මෙහෙයවීම, බන්ධිත පහසුකම් අලුත්කිරීම සඳහා පද්ධති විගණන සහ නෛතික ගැටළු මෙහෙයවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම ඒකකයේ වගකීම වේ. | | | |
| රේගු විමර්ශණ | | | |
| ආරම්භ කරන ලද සිද්ධි සංඛ්‍යාව | අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව | පනවන ලද මුළු දඩ ප්‍රමාණය | අලෙවියෙන් ලද මුළු මුදල |
| 51 | 10 | රු.945,100 | රු.**63,921,624.50** |

| ප්‍රධාන ක්‍රියා මාර්ග: | සංඛ්‍යාලේඛන ඒකකය |
|---|---|
| ඉහල ප්‍රමිතියෙන් යුත් සංඛ්‍යාලේඛන; ජාතික ආදායම් ගිණුම්කරණ කටයුතු සඳහා සහයෝගය දැක්වීම, කර්මාන්ත පිළිබඳ සමීක්ෂණ සිදුකිරීම, විමර්ශණ සහ නඩු කටයුතු සඳහා තොරතුරු සැපයීම, සංඛ්‍යාලේඛන තොරතුරු බෙදා හැරීම, වෙළඳ, බලශක්ති, ඉදිකිරීම් සහ පාරිසරික සංඛ්‍යාලේඛන තොරතුරු යනාදිය ඇතුළු සංඛ්‍යාත්මක ප්‍රමිතිය ඇගයීමට ලක්කිරීම සහ පවත්වා ගෙන යාම තොරතුරු සංනිවේදන තාක්ෂණික අංශයේ සංඛ්‍යාලේඛන ඒකකයේ වගකීම වේ. | |
| ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යාලේඛන ඒකකය විසින් පහත දක්වා ඇති ආයතන/දෙපාර්තමේන්තු වෙත වාර්තා සැපයීම. | |
| ශ්‍රී ලංකා විගණකාධිපති | 120 |
| අභ්‍යන්තර විගණක | 12 |
| බාහිර බලාත්මක කිරීමේ ආයතන (පොලිසිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අපරාධ විමර්ශණ දෙපාර්තමේන්තුව යනාදිය) | 150 |
| අභ්‍යන්තර විමර්ශණ | 600 |
| අභ්‍යන්තර වෙනත් (ප්‍රතිපත්ති සම්පාදනය සහ අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම) | 265 |

| | |
|---|---|
| **මුදල් අමාත්‍යාංශයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා වාර්තා කිරීම.** | 650 |
| **වෙනත් රාජ්‍ය ආයතන (අපනයන සංවර්ධන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය, තේ මණ්ඩලය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලය, මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, පොල් සංවර්ධන මණ්ඩලය)** | 150 |
| **පෞද්ගලික සමාගම්** | 4800 |
| **අධ්‍යයන අරමුණු සඳහා විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන** | 60 |

# මධ්‍යම මිල පිරික්සුම් අංශය

### හැඳින්වීම

රේගු ආඥා පනතේ උපලේඛන ඉ වගන්තිවලට අනුව ආනයන භාණ්ඩවල ප්‍රකාශිත මිල සත්‍යාක්ෂණය කිරීම සහ නිර්ණය කිරීමට අදාල කාර්යයන් මධ්‍යම මිල පිරික්සුම් අංශය විසින් ඉටුකරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන, මිල පිරික්සුම් ක්‍රියාවලියට අදාල සමස්ත තීරණ රේගු ආඥා පනතේ 51 සහ 52 වගන්තිවල විධිවිධාන යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

### අරමුණු

- දෙපාර්තමේන්තු ඉලක්ක සඳහා දායක වන අතරම මිල පිරික්සුම් උපකරණ හා හැකියාවන් ගොඩනැගීම තුළින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම.
- නීත්‍යානුකූල වෙළඳාමට විධිමත් පහසුකම් සැලසීම සඳහා දායකවීම.
- ලෝක රේගු සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය සහ අනෙකුත් ජාත්‍යන්තර මෙවලම් සහ උපකරණවලට අනුකූල වන වඩා උසස් පරිචයන් භාවිතා කරමින් පාර්ශවකරුවන්ට සහ කාර්ය මණ්ඩලයේ අනුකූල වීමේ මට්ටම වර්ධනය කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- රේගු ආඥා පනතේ 51 වන වගන්තිය මගින් බලාත්මක කරන ලද 1994 WTO GATT හි vii වගන්තියේ විධිවිධාන විධිමත් යොදා ගන්නා බවට සහතික වීම.
- පිරික්සුම් නීතිය ඵලදායිව හා ඒකාකාරීව යොදා ගැනීම සඳහා පිරික්සුම් මෙවලම් (එනම් පිරික්සුම් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම, විටින් විට අනතුරු ඇඟවීම් නිකුත් කිරීම. ) උසස් පරිචයන් වර්ධනය කිරීම
- උපලේඛනයේ ඊ වගන්තියට අනුව ප්‍රකාශිත පිරික්සුම් මිල සත්‍යාක්ෂණය කිරීම සහ ආනයන භාණ්ඩවල රේගු මිල නිර්ණය කිරීම.
